82 වන කාණ්ඩය
8 වන කලාපය

බ්‍රහස්පතින්ද
1968 ඔක්තෝබර් 24

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ [තී. 1294]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1296]

ශෝක ප්‍රකාශය : ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැතිතුමා [තී. 1358]

සමුපකාර සමිති (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත [තී. 1363] :
දෙවන වර කියවා, පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පවරන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 1456]

පරිශිෂ්ටය [තී. 1463]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 82
இல. 8

வியாழக்கிழமை
24 ஒக்ரோபர் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

328.5493

மகாதேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 1294]

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1296]

அனுதாபத் தீர்மானம் : ஸேர் எட்வின் விஜயரத்ன [ப. 1358]

கூட்டுறவுச் சங்கங்கள் (தற்காலிக ஏற்பாடுகள்) மசோதா [ப. 1363] :
இரண்டாம் மதிப்பீடம் பெற்று, குழுச்சபைக் குழுவுக்குச் சாட்டப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1456]

அனுபந்தம் [ப. 1463]

---

Volume 82
No. 8

Thursday
24th October 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL [Col. 1294]

ORAL ANSWERS TO QUESTIONS [Col. 1296]

VOTE OF CONDOLENCE : SIR EDWIN WIJEYERATNE [Col. 1358]

CO-OPERATIVE SOCIETIES (TEMPORARY PROVISIONS) BILL [Col. 1363] :
Read a Second time, and allocated to a Committee of the Whole House

ADJOURNMENT MOTION [Col. 1456]

APPENDIX [Col. 1463]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1968 ඔක්තෝබර් 24 වන බ්‍රහස්පතින්දා

வியாழக்கிழமை, 24 ஒக்ரோபர் 1968

*Thursday, 24th October 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது.

*The House met at 2* P.M.

---

## මන්ත්‍රී මණ්ඩලයේ වැඩ බලන ලේකම්

( பதிற் சபைச் செயலதிகாரி)

(THE ACTING CLERK OF THE HOUSE)

I have to read to the House a letter from the Hon. the Speaker :

"Office of the Speaker,
House of Representatives,
Colombo 1,
23rd October 1968.

The Acting Clerk of the
House of Representatives,
Colombo.

Dear Sir,

I have been called upon, at short notice, to lead the Ceylon Delegation to the Annual Conference of the Commonwealth Parliamentary Association to be held at Bahamas. I shall be leaving Ceylon on the 24th October 1968, and I expect to be away from Ceylon for about six weeks.

I have requested the Deputy Speaker to take the Chair during my absence.

Yours sincerely,
Sgd. SHIRLEY COREA,
SPEAKER."

I now call upon the Hon. Deputy Speaker to take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*Whereupon* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*



# අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

නියෝජ්‍ය කථානායකතුමා

(உப-சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

I have received two Messages from His Excellency the Governor-General.

I

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජ මාළිගය,
කොළඹ,
ශ්‍රී ලංකාව.
1968 ඔක්තෝබර් 12.

මහත් මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පතට මහා රාජිණින් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුමැතිය දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි :

'An Act to amend, the Industrial Disputes Act'

මේ වගට,
ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ
ගරු කථානායකතුමා. "

II

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජ මාළිගය,
කොළඹ,
ශ්‍රී ලංකාව.

1968 ඔක්තෝබර් 17.

ගරු කථානායක,

1959 අංක 8 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ 1968 ක්වූ ඔක්තෝබර් 17 වැනි දාතමින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ 11 වෙනි කොටසේ විධිවිධාන 1968 ඔක්තෝබර් 18 වැනි දින ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ

ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව මහාජන සාමය ආරක්ෂා කිරීම හා ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යෑම සඳහා වූ බව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත මම මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ
ගරු කථානායකතුමා."

" மகா தேசாதிபதியின் கந்தோர் இராணி மாளிகை,
கொழும்பு,
இலங்கை.
1968 ஒற்ரோபர் 17.

கௌரவ சபாநாயகர் அவர்களே,

1959 ஆம் ஆண்டின் 8 ஆம் இலக்கச் சட்டத்தினால் திருத்தப்பட்டபடியான (40 ஆம் அத்தியாயமான) பொதுசனப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் 2 ஆம் பிரிவின் கீழ், வெளியிடப்பட்ட 1968 ஒற்ரோபர் 17 ம் திகதிப் பிரசித்தத்தின் மூலம் மேற் கூறப்பட்ட கட்டளைச் சட்டத்தின் 11 ஆம் பிரிவில் சொல்லப்பட்ட ஏற்பாடுகள் 1968 ஒற்ரோபர் 18 ஆம் திகதி அமுலுக்கு வருமென்று நான் பிரகடனப் படுத்தியிருக்கிறேன்.

இப்பிரசித்தத்தை வெளியிட்டதற்கு நியாயம், பொது சன ஒழுங்கை நிலைநாடுவதற்கும் சமுதாயத்தின் சீவியத்திற்கு அத்தியாவசியமான வழங்குதல்களையும் சேவைகளையும் பாதுகாப்பதற்கு மென்பதை இத்தால் பிரதிநிதிகள் சபைக்கு வெளிப்படுத்துகிறேன்.

டபிள்யூ. கொபல்லவ,
மகாதேசாதிபதி.

கௌரவ பிரதிநிதிகள் சபை சபாநாயகர் அவர்கட்கு ".

"Governor-General's Office,

Queen's House, Colombo, Ceylon.
17th October, 1968.

MR. SPEAKER,

BY PROCLAMATION dated 17th October 1968 and issued under Section 2 of the Public Security Ordinance (Cap. 40), as amended by Act No. 8 of 1959, I have declared that the provisions of Part II of the aforesaid Ordinance shall come into operation on 18th October 1968.

I do hereby communicate to the House of Representatives that the reason for issuing the Proclamation is for the preservation of public order and for the maintenance of supplies and services essential to the life of the community.

W. GOPALLAWA,
GOVERNOR-GENERAL.

The Honourable the Speaker of the House of Representatives."

වාචික පිළිතුරු

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

Regulation made under Section 9 of the Manufacture of Matches (Regulation) Act, No. 6 of 1963.—[*The Hon. D. P. R. Gunawardena.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

(1) Food Control Orders Nos. 274, 275 and 276 made under Section 4 (1) (i) of the Food Control Act (Cap. 171.)

(2) The Audited Accounts of the Tea Subsidy Fund for the year 1967.

(3) Estimates of Income and Expenditure of the Tea Control Fund for the year 1969.—[*The Hon. M. D. Banda.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

#### චිත්‍රපට කර්මාන්තය

திரைப்படக் கைத்தொழில்

FILM INDUSTRY

5. එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)

(Mr. S. D. Bandaranayake—Gampaha)

පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දේශීය සිංහල හා දෙමළ චිත්‍රපටි නිෂ්පාදනයට ආර්ථික තර්ජනයක් වී ඇති බටහිර හා ඉන්දියානු චිත්‍රපටි ගෙන්වීම එතුමා තහනම් කරනවාද? (ආ) මෙරට චිත්‍රපටි කර්මාන්තයෙන් හැර අන් සෑම කර්මාන්තයකින්ම නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ වශයෙන් පිටරටින් ගෙන්වීම තහනම් කර තිබෙන බව එතුමා දන්නවාද? (ඉ) විදේශ විනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මය සහතික ක්‍රමය ක්‍රියාත්මකවීම චිත්‍රපටි කර්මාන්තයෙන් ඉවත් කොට, ඉතා හොඳ චිත්‍රපටි නිපදවා තිබෙන නවක නිෂ්පාදක යන්ටත් අන් අයට මෙන් එකම අයිති වාසිකම් දෙනවාද? (ඊ) දේශීය චිත්‍රපටි කර්මාන්තයට රජයේ සහයෝගය ලැබේ නම්, මෙරට දහස් ගණන් ජනයාට රැකී රක්ෂා එමගින් ලැබෙන බව එතුමා දන්නවාද? (උ) අප සමග වෙළඳ ගිවිසුම් ඇති රටවල් සමග චිත්‍රපටි හුවමාරු කර ගැනීම සඳහා එතුමා විධිවිධාන සලස්වන්නේද?

*உள்ளூராட்சி அமைச்சரும், தகவல், ஒலி பரப்பு அமைச்சரது பாராளுமன்றக் காரிய தரிசியுமானவரைக் கேட்ட வினு: (அ) உள் ளூரில் சிங்கள, தமிழ் திரைப்படங்கள் உற் பத்திக்கு பொருளாதார ரீதியில் போட்டியாகவிருக்கும் மேற்கத்திய, இந் திய திரைப்படங்களின் வரவைத் தடை செய்வாரா? (ஆ) உள்ளூரில் ஒவ்வொரு கைத்தொழிலும் உற்பத்தி செய் யும் பொருட்கள் வெளியூரிலிருந்து இறக்குமதி செய்யப்படுவது தடை செய்யப்பட்டிருப் பதையும் திரைப்பட கைத்தொழிலுக்கு மாத் திரம் இத்தடையில்லையென்பதையும் அறி வாரா? (இ) திரைப்பட கைத்தொழிலை வெளி நாட்டுச்சான்றிதழ் முறையினின்றும் விலக்கி புதிதாக திரைப்பட கைத்தொழிலுக்குள் புகுந்தவர்கள் சிறந்த படங்களை உருவாக்கிய காரணத்தால் அவர்களுக்கும் அந்த உரிமை களை அவர் அளிப்பாரா? (ஈ) உள்ளூர் திரைப் படத் தொழிலுக்கு அரசாங்கம் ஆதரவளிக்கு மானல், உள்ளூரில் ஆயிரக்கணக்கானவர் கட்கு வேலை வசதி கிடைக்குமென்பதை அவர் அறிவாரா? (உ) எம்முடன் வர்த்தக பண்ட மாற்று ஒப்பந்தங்கள் செய்துள்ள நாடுகளு டன் திரைப்படங்களைப் பண்டமாற்றுச் செய்ய அரசாங்கம் ஒழுங்குகள் செய்யுமா?*

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Will he ban the inflow of Western and Indian films which is an economic threat to the production of Sinhalese and Tamil films locally? (*b*) Is he aware that in each industry which produces locally the import of the product has been banned, excepting in the film industry? (c) Will he remove the operation of FEECs from the film industry and give the same rights to newcomers as they have produced very good films? (*d*) Is he aware that if the local film industry is supported by the Government it would bring employment to thousands of people locally? (*e*) Will the Government make arrangements to barter films with countries having trade agreements with us?

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

(අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) මෙම ප්‍රශ්නවලින් අසා ඇති කරුණු සම්බන්ධ ප්‍රතිපත්තිය පිළිබඳව දැනුදු රජය මගින් කරුණු පරීක්ෂා කරගෙන යන අතර ඊ පිළිබඳව මෙතෙක් අවසාන තීරණයක් ගෙන නැත. මෙම කරුණු ඉක්මණින් ම පැහැදිලි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## චිත්‍රපට සඳහා රාජ්‍ය සංස්ථාවක්

திரைப்பட அரசாங்கக் கூட்டுத்தாபனம்

STATE CORPORATION FOR FILMS

**7. එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජය, චිත්‍රපට ආනයනය හා බෙදාහැරීම සඳහා රාජ්‍ය සංස්ථාවක් පිහිටුවා, එහි ප්‍රතිපත්තිය නියම කරන්නේද? (ආ) දැනට චිත්‍රපට බෙදා හරින්නන් විසින් කැරෙන, ඉන් වොයිස් පත්‍ර වලින් වැඩි මිල ගෙවීමේ අක්‍රමිකතා රාශියක් මෙමඟින් වැළැක්විය හැකි බව එතුමා දන්නේද? (ඉ) රජයේ සේවකයින් නොව, චිත්‍රපට ප්‍රදර්ශකයින්, නිෂ්පාදකයින්, අධ්‍යක්ෂවරුන්, කාර්මික යින්, කථා රචකයින්, විචාරකයින් හා නරඹන්නන් ඇතුලත් චිත්‍රපට උපදේශක කමිටුවක් රජය විසින් පිහිටුවන්නේද? (ඊ) විදේශීය චිත්‍රපට බද්ද වැඩි කිරීමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

හා දේශීය චිත්‍රපට බද්ද අඩු කිරීමෙන් පාරිභෝගිකයින් කෙරෙහි බද්දක් පැන වීමටත්, මෙම මුදල දේශීය චිත්‍රපට කර්මාන්තයට අනුබලයක් වශයෙන් දෙන ප්‍රදානයන් හා මුදල් තෑගි සඳහා යොදා ගැනීමටත් රජය ක්‍රියා කරන්නේද? (උ) වාර්ෂිකව නියමිත කාල සීමාවක් තුළ දේශීය චිත්‍රපට ප්‍රදර්ශනය කළ යුතු බවට දිවයිනේ සියළු සිනමාහල්වලට රජය බල කරන්නේද?

உள்ளூராட்சி அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரது பாராளுமன்றக் காரியதரிசியுமானவரைக் கேட்ட வினா: (அ) திரைப்படங்களை இறக்குமதி செய்து விநியோகிப்பதற்கென அரசாங்கக் கூட்டுத்தாபனமொன்றை நிறுவுவதுடன் அதற்கென ஒரு கொள்கையையும் அரசாங்கம் விதிக்குமா? (ஆ) இதனால் இன்றைய விநியோகத்தர்கள் விலைப்பட்டியல்களில் உண்மையான விலைக்கு மேற்பட்ட விலைகளைக் குறிப்பதில் கையாளும் அநேக பாதகமான வழக்கங்களை ஒழிப்பதற்கு முடியும் என்பதை அவர் அறிவாரா? (இ) அரசாங்க சேவையாளரன்றி, சினிமாப்பட காட்சியுரிமையாளர், தயாரிப்பாளர், நெறியாளர் நுண்தொழிலாளர், வசன கர்த்தாக்கள், விமர்சகர், படம் பார்ப்போர் ஆகியவர்களைக் கொண்ட திரைப்பட ஆய்வுரைக் குழுவொன்றை அரசாங்கம் நிறுவுமா? (ஈ) வெளிநாட்டுத் திரைப் படங்களின் மீதான வரியைக் கூட்டவும் உள்ளூர்த் திரைப் படங்களின் மீதான வரியைக் குறைக்கவும் அரசாங்கம் நடவடிக்கை எடுத்து படங்களை பயன்படுத்துவோர் மீது ஒரு வரியைச் சுமத்துவதன் மூலம் கிடைத்த வரிப்பணத்தை உள்ளூர்த் திரைப்படக் கைத்தொழிலை ஊக்குவிக்குவதற்கான அன்பளிப்புகளையும் ரொக்கப் பரிசுகளையும் வழங்க உபயோகப்படுத்துமா? (உ) இந்நாட்டிலுள்ள ஒவ்வொரு படமாளிகையிலும் வருடத்தில் ஒரு குறிப்பிட்ட காலத்திற்குத் தொடர்ந்து உள்ளூர்த் திரைப்படங்கள் திரையிடப்படுவதை அரசாங்கம் கட்டாயப் படுத்துமா?

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (a) Will the Government set up a state corporation for the import and distribution of films and lay down its policy? (b) Is he aware that this will eliminate a lot of malpractices of overloading of invoices practised by distributors today? (c) Will the Government set up a film advisory committee not of government servants but exhibitors, producers, directors, technicians, script writers, critics and cinemagoers? (d) Will the Government impose a tax on the consumer by increasing the tax on foreign films and decreasing the tax on the local films and use this money for incentives by way of awards and cash prizes to be given to the local film industry? (e) Will the Government make it compulsory for every cinema in the country to show local films during a certain length of time per year?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

(අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) මෙම ප්‍රශ්නවලින් අසා ඇති කරුණු සම්බන්ධ ප්‍රතිපත්තිය පිළිබඳව ඇනුදු රජය මගින් කරුණු පරීක්ෂා කරගෙන යන අතර ඒ පිළිබඳව මෙතෙක් අවසාන තීරණයක් ගෙන නැත. මෙම කරුණු ඉක්මණින්ම පැහැදිළි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## දුම්රිය දෙපාතීමේන්තුවේ පුරප්පාඩු පිරවීමේදී එහි සේවකයින්ගේ දරුවන්ට විශේෂ සැළකිලි දැක්වීම

இ. பு. ப. : புகையிரதப்பகுதித் தொழிலாளர் பிள்ளைகளுக்கு தொழிலளிப்பதில் விசேட ஆதரவு

C. G. R.: EMPLOYMENT PREFERENCE TO CHILDREN OF RAILWAY EMPLOYEES

10. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ප්‍රවාහන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු පිරවීමේදී එහි සේවකයන්ගේ දරුවනට විශේෂ සැළකිල්ලක් දැක්වීමේ සම්ප්‍රදායක් තිබුණු බවත්, එයට හේතුව එම සේවකයන් තැනින් තැනට මාරුවී යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට බාධා පැමිණෙන නිසා බවත් එතුමා දන්නවාද? (ආ) මේ විශේෂ සැළකිල්ල දැනටත් දුම්රිය දෙපාතීමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් පවතීද? නැතහොත් එහි වෙනසක් වී තිබේද ? (ඉ) වෙනසක් ඇතිවී තිබේ නම් ඒ පිළිබඳ තත්ත්වය එතුමා පැහැදිලි කරනවාද ?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) புகையிரதப் பகுதித் தொழிலாளர் அடிக்கடி இடமாற்றஞ் செய்யப்படுவதினுல் பிள்ளைகளின் கல்வி பாதிக்கப்படுகிறது என்ற காரணத்தைக் கொண்டு புகையிரதப் பகுதியிலுள்ள வேலை இடங்களுக்கு ஆள் சேர்க்கும் பொழுது புகையிரதப் பகுதித் தொழிலாளரின் பிள்ளைகளுக்கு விசேட ஆதரவு கொடுக்கப்படுவது பழக்கம் என்பதை அறிவாரா? (ஆ) இப்பழக்கம் இன்னும் உளதா? இல்லையெனில், மாற்றம் ஏற்பட்டுளதா? (இ) மாற்றம் இருப்பின் நிலைமையைத் தெளிவுபடுத்துவாரா?*

asked the Minister of Communications: (*a*) Is he aware that it has been the practice to give special consideration to the children of railway employees in filling vacancies in the Railway Department on the grounds that the education of their children is hampered by the frequent transfers to which these employees are subject? (*b*) Is this practice still in force in the department? If not, has there been a change? (*c*) If there has been a change, will he clarify the position?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(අ) මෙවැනි විශේෂ සැලකිල්ලක් දක්වීමේ සම්ප්‍රදායක් තිබුණි. එහෙත් දක්වා ඇති හේතුව නිසාම පමණක් නොවේ. (ආ) ඔව්. අංක 674 හා 65.11.2 සහ අංක 692 හා 66.5.27 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස්වලට යටත්වයි. (ඉ) ඉහත (ආ) අනුව පැන නොගනී.



## පොළොන්නරුවේ දලුකන ජනපදයේ නිවාස

## பொலன்னறுவை தலுகன குடியேற்றத்திட்ட வீடுகள்

## HOUSES IN DALUKANA COLONY, POLONNARUWA

12. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

**(Mr. S. D. Bandaranayake)**

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1961 කේ දී රජය විසින් දෙන ලද රු. 700 න් පොළොන්නරුව ඡන්ද කොට්ඨාශයේ දලුකන ජනපදයේ තනන ලද නිවාස 35 කඩා වැටී ඇති බව එතුමා දන්නවාද? (ආ) ගඩොල් යොදා එකී ගෙවල් නැවත තනාදීමට එතුමා ක්‍රියා කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) பொலொன்னருவை தேர்தற் றெகுதியிலே தலுகன குடியேற்றத் திட்டத்திலே அரசாங்கம் கொடுத்த ரூபா 700 ஐக் கொண்டு கட்டப்பட்ட 35 வீடுகளும் விழுந்து விட்டன என்பதை அவர் அறிவாரா? (ஆ) இந்த வீடுகளை செங்கற்களினுல் மீண்டுங் கட்டுவிப்பாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the 35 houses put up with Rs. 700 given by the Government in 1961 in the Dalukana Colony in the Polonnaruwa Electorate have collapsed? (*b*) Will he have these houses rebuilt using bricks?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) ඔව්. 1952 දී වැදි පවුල් 35කට තනා දෙන ලද මේ ගෙවල්, ස්ථිර ගෙවල්වල පදිංචියට කැමැත්තක් නොමැති නිසා ඔවුන් විසින් අතහැර දැමීම හේතුකොට ගෙන කඩා වැටීමෙන් පසු යළිත් 1960 දී ද දෙවන වරටත් තනා දෙන ලද ගෙවල්ය. (ආ) ගඩොල් යොදා එකී ගෙවල් නැවත තනා දීමට මෙතෙක් තීරණය කර නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

## සහල්, පොහොර හා පිටි ආනයන

அரிசி, பசளை, மா இறக்குமதி

**IMPORTS OF RICE, FERTILIZER AND FLOUR**

1. **කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)

(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)

(Mr. K. B. Ratnayake—Anuradhapura)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1957 සිට මේ දක්වා වර්ෂයක් වර්ෂයක් පාසා එක් එක් රටින් ගෙන්වන ලද සහල් ප්‍රමාණයද, ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණයද එතුමා සඳහන් කරනවාද? (ආ) 1957 සිට මේ දක්වා වර්ෂයක් වර්ෂයක් පාසා එක් එක් රටින් ගෙන්වන ලද පොහොර වර්ග සහ ප්‍රමාණයද, ඒ සඳහා වැයවුණු මුදල් ප්‍රමාණයද එතුමා සඳහන් කරනවාද? (ඉ) 1957 සිට මේ දක්වා වර්ෂයක් වර්ෂයක් පාසා එක් එක් රටින් ගෙන්වන ලද පිටි ප්‍රමාණයද, එයට වැයවූ මුදල් ප්‍රමාණයද එතුමා සඳහන් කරනුවාද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) 1957 ஆம் ஆண்டு முதல் இன்று வரை ஒவ்வொரு வருடமும் ஒவ்வொரு நாட்டிலிருந்தும் இறக்குமதி செய்யப்பட்ட அரிசியின் தொகையையும், விலையையும் அவர் கூறுவாரா? (ஆ) 1957 ஆம் ஆண்டு முதல் இன்று வரை ஒவ்வொரு வருடமும் ஒவ்வொரு நாட்டிலிருந்தும் இறக்குமதி செய்யப்பட்ட பசளையின் தொகையையும், விலையையும் அவர் கூறுவாரா? (இ) 1957 ஆம் ஆண்டு முதல் இன்று வரை ஒவ்வொரு வருடமும் ஒவ்வொரு நாட்டிலிருந்தும் இறக்குமதி செய்யப்பட்ட மாவின் தொகையையும் விலையையும் அவர் கூறுவாரா?*

asked the Minister of Agriculture and Food: (*a*) Will he state the quantity and the cost of rice imported from each country in respect of each of the years from 1957 to date? (*b*) Will he state the quantity and cost of fertilizer imported from each country in respect of each of the years from 1957 to date? (*c*) Will he state the quantity and cost of flour imported from each country in respect of each of the years from 1957 to date?

වාචික පිළිතුරු

**ගරු එම්. ඩී. බණ්ඩා** (කෘෂිකර්ම හා ආහාර ඇමති)

(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

* (*a*) I am tabling a statement indicating the quantity and the C. & F. value of the rice imported from various countries since 1957. * (*b*) I am tabling a statement showing the quantity and cost of fertilizer imported from each country by the Ceylon Fertilizer Corporation since it was set up in October 1964. * (*c*) I am tabling a statement indicating the quantity and cost of flour imported from each country since 1957.

## 1955 වැටුප් කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීමෙන් පසු වෙනස්වූ වැටුප් ක්‍රම

சம்பள ஆணைக்குழு அறிக்கை, 1955, செயற்படுத்தல்: சம்பள அளவுத்திட்டங்கள் மீளவாய்தல்

**IMPLEMENTATION OF SALARIES COMMISSION REPORT, 1955: SALARY SCALES REVISED**

2. **තුඩාවේ මයා.**—(ආර්. ජේ. ජී. ද මෙල් මයා.—දෙවිනුවර—වෙනුවට)

(திரு. துடாவ—திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர—சார்பாக)

(Mr. Tudawe—on behalf of Mr. R. J. G. de Mel—Devinuwara)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1955 වර්ෂයේ XII වන සැසි වාර්තාවේ ප්‍රකාශිත ඉකුත් වැටුප් කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීමෙන් පසුව ස්වකීය වැටුප් ක්‍රම ප්‍රතිශෝධනයට හෝ වෙනස්වීමට හෝ භාජනය වූ නිලධාරීන්ගේ ගණ හෝ ශ්‍රේණි හෝ කවරේද?

---

* සභාගත කරන ලද ප්‍රකාශන අද දින වැඩ කටයුතු අවසානයෙහි පරිශිෂ්ටයක් වශයෙන් පළකරනු ඇත.

* சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கைகள், இன்றைய நிகழ்ச்சிகளின் இறுதியில் அநுபந்தமாகத்தரப்படும்.

* The statements tabled will appear as an Appendix at end of this Day's Proceedings.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

நிதியமைச்சரைக் கேட்ட வினா: 1955 ஆம் ஆண்டு XII ஆம் பருவபப்பத்திரமாகப் பிரசுரிக்கப்பட்ட, இறுதியாக நியமிக்கப்பட்ட சம்பள ஆணைக்குழுவின் அறிக்கை செயற்படுத்தப் பட்டதன் பின்னர் எந்த வகுதிகளை அல்லது தரங்களைச் சேர்ந்த உத்தியோகத்தர்களின் சம்பள அளவுத் திட்டங்கள் மீளவாயப்பட்டு அல்லது மாற்றப்பட்டு இருக்கின்றன?

asked the Minister of Finance: What categories or grades of officers had their salary scales revised or altered after the implementation of the last Salaries Commission Report published in Sessional Paper XII of 1955?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

As the Answer is a long one may I have your permission to table it?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Yes.

**සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:*

***The Answer tabled is as follows:***

1955 වැටුප් ප්‍රතිශෝධනයෙන් පසු, රජයේ සේවකයන්ගේ සහ රජයේ ආධාර ලබන පාඨශාලාවල ගුරුවරුන්ගේ වැටුප් ක්‍රම, 1957 අංක XXVII දරන සැසි වාර්තාවේත්, 1958 අංක II දරන සැසි වාර්තාවේත් සඳහන් නිර්දේශ යන් පදනම් කරගෙන ප්‍රතිශෝධනය කරන ලදී.

නිශ්චය කර ගැනීමට හැකිවී ඇති තරමින් සිදුකර ඇති අනික් වෙනස්කම් මේවාය :—

| දෙපාර්තමේන්තුවේ නම | නිලධාරි ශ්‍රේණිය හෝ ගණය |
|---|---|
| ගණන් පරීක්ෂක දෙපාර්තමේන්තුව ... ... | III වැනි ශ්‍රේණියේ ගණන් පරීක්ෂක අධිකාරීන් (II වැනි හා III වැනි ශ්‍රේණිවල ගණන් පරීක්ෂකවරු III වැනි ශ්‍රේණියේ ගණන් පරීක්ෂක අධිකාරීන් වශයෙන් එකම ශ්‍රේණියකට ඒකාබද්ධ කරන ලදහ) |
| ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ... | පර්යේෂණ සහකාරයින් |
| ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ... ... | ප්‍රවෘත්ති අධ්‍යක්ෂ<br>කාර්මික සහකාර සහ ඡායාරූප ශිල්පී<br>කැමරාකරු |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ... | අඳුරු කාමර සහකාර |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ... ... | තක්සේරුකරුවන්<br>සහකාර තක්සේරුකරුවන් |
| රේගු ... ... ... | රේගු ලාංචි රියැදුරන් |
| රජයේ මුද්‍රණාලය ... ... ... | කැමරා ක්‍රියාකරුවන් |
| කැලෑ දෙපාර්තමේන්තුව ... ... | ඡායාරූප ශිල්පී–රසායනාගාර සහකාර |
| වාරිමාර්ග ... ... ... | හිල් විදින්නන්<br>ප්‍රධාන ගබඩා සම්බන්ධතා නිලධාරී |
| මැනුම් ... ... ... | ලිතෝ මුද්‍රණකරුවන් සහ මැෂින් මයින්ඩර්වරුන් |
| ඉඩම් සංවර්ධන ... ... ... | කාර්යාල ඕවර්සියර්වරුන් |
| විදුලිය ... ... ... | ප්‍රධාන කළමනාකරු<br>නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු |
| රෙජිස්ට්‍රාර් ජනරාල් ... ... | ප්‍රධාන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්<br>කොළඹ, ඉඩම් රෙජිස්ට්‍රාර් |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| දෙපාර්තමේන්තුවේ නම | නිලධාරි ශ්‍රේණිය හෝ ගණය |
|---|---|
| මුස්ලිම් දේවස්ථාන සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරකාරත්ව | කොමසාරිස් |
| ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත ... ... | ප්‍රදර්ශකවරුන් |
| සෞඛ්‍ය ... ... ... | භෞතිකඥ<br>ඡායාරූප ශිල්පී<br>සූක්ෂම ඡායාරූපකරු |
| ආයුර්වේද ... ... ... | ආයුර්වේද වෛද්‍යවරු සහ කාර්ය නියුක්තකයන්<br>උපස්ථායිකාවන් |
| වරාය කොමිෂන් සභාව ... ... | මුහුදු ඉංජිනේරුවන්<br>ප්‍රදීපාගාර භාරකරුවන් I ශ්‍රේණිය<br>ප්‍රදීපාගාර භාරකරුවන් II ශ්‍රේණිය<br>ජංගම දොඹකර රියැදුරන් |
| භූ විද්‍යා සමීක්ෂණ ... ... ... | කාර්මික සහකාරවරුන්<br>ක්ෂෙත්‍ර සහකාරවරුන් |
| අධිකරණ අමාත්‍යාංශය ... ... | සහකාර ලේකම් |
| නීති කෙටුම්පත් සම්පාදක ... ... | නීති කෙටුම්පත් සම්පාදක<br>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක |
| ඇටෝර්නි ජනරාල් ... ... ... | සොලිසිටර් ජනරාල්<br>නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් |
| රජයේ විශ්ලේෂක ... ... ... | ඡායාරූප ශිල්පී සහ කාර්මික සහකාර<br>සහකාර කාර්මික ශිල්පීන් |
| පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය | නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ |
| ධීවර ... ... ... | ඡායාරූප කාර්මික ශිල්පී |
| වාණිජ ... ... ... | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ<br>වාණිජ සහකාරයන්<br>ප්‍රමාණ පරීක්ෂකයන් |
| කෘෂිකර්ම ... ... ... | සයින් කැමරාකරු |
| සමූපකාර සංවර්ධන ... ... ... | සිනිමා යන්ත්‍ර ක්‍රියාකරු |
| අලෙවි සංවර්ධන ... ... ... | පෝමන්<br>රසඥ |
| ගොවිජන සේවා ... ... ... | වාරිමාර්ග නිලධාරීන්<br>වගා රක්ෂණ නිලධාරි |
| ආහාර ... ... ... | නීති සහකාර<br>වාප්පු සහකාරවරු<br>පරිපාලකයන් |
| අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ... | පණ්ඩිත සහ විදිවාන්<br>කාර්මික ආයතනවල I වැනි හා II වැනි ශ්‍රේණිවල කථිකාචාර්යවරුන්<br>නිවාස පාලිකාවන් (සුදුසුකම් ලත් මෙහෙදියන්)<br>රාජකීය විද්‍යාලයාධිපති |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| දෙපාර්තමේන්තුවේ නම | නිලධාරි ශ්‍රේණිය හෝ ගණය |
|---|---|
| පුරාවිද්‍යා ... ... ... | ඡායාරූප ශිල්පී<br>සහකාර ඡායාරූප ශිල්පී |
| ජාතික කෞතුකාගාර ... ... | ඡායාරූප කම්කරු |
| කම්කරු ... ... ... | කර්මාන්තශාලා පරීක්ෂක<br>නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සහ ප්‍රධාන කර්මාන්ත ශාලා පරීක්ෂක<br>(ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක තනතුර නියෝජ්‍ය කම්කරු කොමසාරිස් හා ප්‍රධාන කර්මාන්ත ශාලා පරීක්ෂක යනුවෙන් නැවත නිල නම් කරන ලදී) |
| තැපැල් හා විදුලි සන්දේශ ... ... | ප්‍රධාන තැපැල් ස්ථානාධිපති<br>ප්‍රධාන විදුලි පණිවුඩ පති<br>I වැනි ශ්‍රේණියේ තැපැල් තෝරන නිලධාරීන්<br>රියදුරන්<br>විදුලි පණිවුඩකරුවන්ගේ පරීක්ෂකයන්<br>ටැලිපෝන් සේවිකාවන්<br>මොනිටර් |
| සිවිල් ගුවන් සේවා ... ... ... | කටුනායක ගුවන් තොටුපල අණදෙන නිලධාරි<br>කටුනායක ගුවන් තොටුපල සහකාර අණදෙන නිලධාරි<br>රත්මලාන ගුවන් තොටුපල අණදෙන නිලධාරි<br>I වැනි ශ්‍රේණියේ ගුවන් රිය ගමනාගමන පාලක<br>ගුවන් නාවික පරීක්ෂකයන්<br>I වැනි ශ්‍රේණියේ සහකාර පරීක්ෂකයන්<br>II වැනි ශ්‍රේණියේ සහකාර පරීක්ෂකයන් |
| පරිවාස හා ළමාරක්ෂක සේවා ... ... | මනෝ වෛද්‍යවරුන්<br>පුහුණු ගුරුවරුන් |
| කාලගුණ විද්‍යා ... ... ... | කාලගුණ විද්‍යාඥයන්<br>නිරීක්ෂකයන් /සහකාර නිරීක්ෂකයන්<br>(කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂකයන් සහ සහකාර නිරීක්ෂකයන්ද නිරීක්ෂකයන් වශයෙන් නැවත නිල නම් කොට ඇත) |
| දුම්රිය ... ... ... | දුම්රිය ආරක්ෂක සේවය<br>මැශින් මයින්ඩර්වරුන්<br>ඉංජිනේරුවන්<br>වෛද්‍ය නිලධාරීන්<br>සන්නද්ධ සේවා නිලධාරීන්<br>කණිෂ්ඨ ශ්‍රේණි / අර්ධ ලිපිකරු සේවය / දිස්ත්‍රික් ලිපිකරු සේවය / ප්‍රා.ආ.නි. ලිපිකරු සේවය } සා.ලි. සේවයට අන්තර් ග්‍රහණය කිරීමේදී<br>රජයේ මුද්‍රණාලයීය ලිපිකරු සේවය<br>රේගු ලිපිකරු සේවය / මිළ කිරීමේ, ගමන් බඩු සහ නිවාරක ශාඛාවල නිලධාරීන් } ඒකාබද්ධ රේගු සේවා වට අන්තර්ග්‍රහණය කිරීමේදී<br>ලංකා පරිපාලන සේවය<br>(අලුත් සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ශ්‍රේණීන් හා සේවාවන්ගෙන් බොහොමයක් ලං. ප. සේවයට අන්තර් ග්‍රහණය කිරීමේදී ඔවුන්ගේ පැරණි වැටුප් ක්‍රම වෙනස් කරන ලදී) |

වාර්තාව අවසාන වශයෙන් තවම සම්පූර්ණ කර නැති, වැටුප් විෂමතා කමිටුව විසින් නිර්දේශ කර ඇති වෙනස් කම් මේ ලැයිස්තුවට ඇතුළත් කර නැත. මේ වැටුප් විෂමතා කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ, පිළිගනු ලබන්නා වූ නිර්දේශ 1968.5.1 වැනි දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1955 இல் செய்யப்பட்ட சம்பள மீளாய்வுகளின் பின், 1957 இன் XXVII ஆம் அமர்வுக்காலப் பத்திரம் 1958 இன் II ஆம் இலக்க அமர்வுக்காலப் பத்திரம் என்பவற்றில் செய்யப்பட்ட விதப்புரைகளின் அடிப்படையில் அரசாங்க ஊழியர்களினதும், அரச உதவி பெறும் பாடசாலைகளிலுள்ள ஆசிரியர்களினதும் சம்பளத் திட்டங்கள் மீளவாயப்பட்டன.

ஆராய்ந்தறிந்துகொள்ளச் சாத்தியமானமட்டில், செய்யப்பட்ட பிறமாற்றங்கள் பின்வருமாறு :

| திணைக்களத்தின் பெயர் | உத்தியோகத்தர்களின் தரம் அல்லது வகுதி |
|---|---|
| ணக்குப்பரிசோதனைத் திணைக்களம் | கணக்குப் பரிசோதனைக் கண்காணிப்பாளர் III ஆந் தரம்<br>(II ஆம் III ஆம் தர கணக்குப் பரிசோதகர்கள், III ஆந் தர கணக்குப் பரிசோதனைக் கண்காணிப்பாளர்களாக ஒரே தரத்தின் ஒன்று சேர்க்கப்பட்டுள்ளனர்) |
| திட்டமிடல், பொருளாதார அலுவல்கள் அமைச்சு | ஆராய்ச்சி உதவியாளர்கள் |
| தகவல் திணைக்களம் .. | தகவல் நெறியாளர்<br>தொழில் நுட்ப உதவியாளரும் படம் பிடிப்போரும்<br>படக்கருவியாளர் |
| தேசிய பொதுச் சுவடி .. | இருட்டறை உதவியாளர் |
| உண்ணாட்டு அரசிறை .. | வரி மதிப்பாளர்<br>உதவி வரிமதிப்பாளர் |
| சுங்கம் .. .. | சுங்க விசைப்படகுச் சாரதிகள் |
| அரசாங்க அச்சகம் .. | ஒளிப்படக் கருவி இயக்குநர் |
| காட்டுத் திணைக்களம் .. | படப் பிடிப்பாளர்/ஆய்கூட உதவியாளர் |
| நீர்ப்பாசனம் .. .. | துணையிடுவோர்<br>பண்டசாலை இணைப்பு பிரதான உத்தியோகத்தர் |
| நில அளவை .. .. | சில அச்சாளரும் பொறி பேணுவோரும் |
| காணி அபிவிருத்தி .. | அலுவலக ஒவசியர்மார் |
| மின்சக்தி .. .. | பொது முகாமையாளர்<br>பிரதி பொது முகாமையாளர் |
| பதிவாளர் நாயகம் .. | பிரதான உதவிப் பதிவாளர் நாயகம்<br>காணிப்பாதிவாளர், கொழும்பு |
| பள்ளிவாசல், முஸ்லிம் தர்ம நம்பிக்கைச் சொத்து | ஆணையாளர் |
| கிராம அபிவிருத்தி, சிறுகைத் தொழில் | செயல்முறை காட்டுவோர் |
| உடனலம் .. .. | உடற்றெழில் முறையாளர்<br>ஒளிப்படம் பிடிப்போர்<br>நுண் அளவுப் படம் பிடிப்போர் |
| ஆயுள் வேதம் .. | ஆயுள் வேத மருத்துவரும் ஆளணியினரும்<br>பெண் உழைச்செல்வார் |
| கப்பற்றுறை ஆணைக்குழு .. | கடல் சார்ந்த எந்திரிகள்<br>வெளிச்சவீட்டுக் காப்பாளர்கள் I ஆந் தரம்<br>வெளிச்சவீட்டுக் காப்பாளர்கள் II ஆந் தரம்<br>இடம்பெயர் டாரஞ்சாம்பிச் சாரதிகள் |
| புவிச்சரிதவியல் அளவை .. | தொழில்நுட்ப உயவியாளர்<br>வெளிக்கள உதவியாளர் |
| நீதி அமைச்சு .. | உதவிச் செயலாளர் |
| சட்டத் தயாரிப்பாளர் .. | சட்டத்தயாரிப்பாளர்<br>பிரதிச் சட்டத் தயாரிப்பாளர் |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| திணைக்களத்தின் பெயர் | உத்தியோகத்தரின் தரம் அல்லது வகுதி |
|---|---|
| சட்டத்துறைத் தலைமை அதிபதி .. | அரசாங்க வழக்கறிஞர் தலைமை அதிபதி<br>அரசாங்கவழக்கறிஞர் பிரதித் தலைமை அதிபதி |
| அரசாங்க இரசாயனப் பகுப்பாளர் .. | படப்பிடிப்பாளரும் தொழில்நுட்ப உதவியாளரும்<br>உதவி தொழில் நுட்பவியலாளர் |
| உள்ளூராட்சி அமைச்சு, நாடு, நகர்த் திட்ட அமைப்புப் பிரிவு | நாடு, நகர்த் திட்ட அமைப்பு நெறியாளர் |
| கடற்றொழில் திணைக்களம் .. | ஒளிப்படவியல் தொழில்நுட்பவியலாளர் |
| வர்த்தகத் திணைக்களம் .. | வர்த்தகப் பிரதி நெறியாளர்<br>வர்த்தக உதவி நெறியாளர்<br>வர்த்தக உதவியாளர்<br>தரப் பரீட்சகர் |
| கமத்தொழில் .. .. | இயக்கப் படப்பிடிப்பாளர் |
| கூட்டுறவு அபிவிருத்தி .. | இயக்கப்பட இயக்குநர் |
| சந்தைப்படுத்தல் திணைக்களம் .. | முகாரி<br>இரசாயனர் |
| கமத்தொழில் சேவை .. | நீர்ப்பாசன உத்தியோகத்தர்<br>பயிர் காப்புறுதி உத்தியோகத்தர் |
| உணவு .. .. | சட்ட உதவியாளர்<br>சாமான் மேடை உதவியாளர்<br>மேற்பார்வையாளர் |
| கல்வி பண்பாட்டு அலுவல்கள் அமைச்சு | பண்டிதர், வித்துவான்<br>தொழில் நுட்பக் கழகங்களிலுள்ள விரிவுரையாளர்கள், I ஆந் தரம், II ஆந் தரம் கெவிலிகள் (தகைமை பெற்ற தாதிகள்)<br>அதிபர் (ரேயல் கல்லூரி) |
| தொல் பொருளியல் .. | படப்பிடிப்பாளர்<br>உதவிப் படப்பிடிப்பாளர் |
| தேசிய நூதனசாலை .. | படப்பிடிப்புத் தொழிலாளர் |
| தொழில் திணைக்களம் .. | தொழிற்சாலைப் பரிசோதகர்<br>தொழில் திணைக்கள பிரதி ஆணையாளரும்<br>தொழிற்சாலைப் பிரதான பரிசோதகரும்<br>(தொழிற்சாலைப் பிரதான பரிசோதகரின் பதவி தொழில் திணைக்களப் பிரதி ஆணையாளரும் தொழிற்சாலைப் பிரதான பரிசோதகருமென மீளப் பெயரிடப்பட்டுள்ளது) |
| அஞ்சல் தொலைச் செய்திப் போக்கு வரத்து | பிரதான அஞ்சல் அதிபர்<br>பிரதான தந்தி அதிபர்<br>அஞ்சல் இனம் பிரிக்கும் உத்தியோகத்தர்—I ஆந் தரம்<br>சாரதிகள்<br>தந்தித் தூதுவர் பரிசோதகர்<br>பெண் தொலைபன்னியாளர்<br>மொனிற்றர் |
| குடிசார் விமானப் போக்குவரத்து.. | விமானத்துறைக் கட்டளைத் தலைவன், கட்டுநாயக்கா<br>விமானத்துறை உதவிக் கட்டளைத் தலைவன், கட்டுநாயக்கா<br>விமானத்துறைக் கட்டளைத் தலைவன், இரத்துமலானை<br>விமானப்போக்குவரத்துக் கட்டுப்பாட்டாளர், I ஆந் தரம்<br>விமான வழிகாட்டிப் பரிசோதகர்<br>விமான வழிகாட்டி உதவிப் பரிசோதகர், Iஆந் தரம்<br>விமான வழிகாட்டி உதவிப் பரிசோதகர், II ஆந் தரம் |
| நன்னடத்தைக் குழந்தை பாதுகாவற் சேவைகள் | உளவியலார்<br>பயிற்சி பெற்ற ஆசிரியர் |
| வளிமண்டலவியல் .. | வளி மண்டலவியலார்<br>அவதானிப்பாளர்/உதவி அவதானிப்பாளர்<br>(வளி மண்டலத் திணைக்கள அவதானிப்பாளரும் உதவி அவதானிப்பாளரும் அவதானிப்பாளராகப் பெயரிடப்பட்டுள்ளனர்) |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| திணைக்களத்தின் பெயர் | உத்தியோகத்தரின் தரம் அல்லது வகுதி | |
|---|---|---|
| புகைவண்டி .. | .. புகைவண்டி பாதுகாவற் சேவை | |
| | எந்திரம் பாதுகாப்போர் | |
| | எந்திரிகள் | |
| | மருத்துவ உத்தியோகத்தர்கள் | |
| | படைக்கலச் சேவை ஆளணி | |
| | சிறுதரத்தினர் | பொ. எ. சேவையில் சேர்க்கப்படும் போது |
| | மருவிய எழுதுவினைஞர் சேவை | |
| | மாவட்ட எழுதுவினைஞர் சேவை | |
| | பெ. இ. உ. எழுதுவினைஞர் சேவை .. | |
| | அரசாங்க அச்சக எழுதுவினைஞர் சேவை | |
| | சுங்க எழுதுவினைஞர் சேவை | ஒன்று படுத்திய சுங்கச் சேவையில் சேர்க்கப்படும் போது |
| | மதிப்பிடல் பயணப் பொதி தடுப்புக் கிளை உத்தியோகத்தர்கள் | |
| | இலங்கை நிருவாகச் சேவை | |
| | புதிய சேவையில் சேர்க்கப்பட்ட பல தரத்தினரும் சேவையினரும் இ. நி. சேவையில் சேர்க்கப்பட்டபோது அவர்களுடைய முந்திய சம்பளத் திட்டங்கள் மாற்றப்பட்டன. | |

சம்பள முறைவழுக் குழுக்கள் விதந்துரைத்துள்ள மாற்றங்கள் (அவர்களின் அறிக்கை இன்னும் முடிவாக்கப்படவில்லை) இந்நிரலில் சேர்க்கப்படவில்லை. சம்பள முறைவழுக்குவின் விதப்புரைகள் எவையேனும் எற்றுக் கொள்ளப்பட்டால் அவை 1.5.68 இல் இருந்து செயற்படுத்தப்படும்.

Since the salary revisions of 1955, salary scales of government employees and teachers in State-aided schools were revised on the basis of the recommendations made in Sessional Papers XXVII of 1957 and II of 1958.

As far as it has been possible to ascertain, the following are the other changes :

| *Name of Department* | *Grade of or category of officers* |
|---|---|
| Audit Department .. | Audit Superintendents Grade III (Audit Examiners, Grades II and III were amalgamated into one grade of Audit Superintendents Grade III). |
| Ministry of Planning and Economic Affairs | Research Assistants |
| Information Department .. | Director of Information, Technical Assistant and Photographer Cameraman |
| National Archives .. | Dark Room Assistant |
| Inland Revenue .. | Assessors, Assistant Assessors |
| Customs .. .. | Drivers of Customs Launches |
| Government Press .. | Camera Operators |
| Forest Department .. | Photographer/Laboratory Assistant |
| Irrigation .. .. | Drillers<br>Chief Stores Liaison Officer |
| Survey .. .. | Litho Printers and Machine Minders |
| Land Development .. | Office Overseers |
| Electrical .. .. | General Manager<br>Deputy General Manager |
| Registrar-General .. | Principal Assistant Registrar General<br>Registrar of Lands, Colombo |
| Mosques and Muslim Charitable Trusts | Commissioner |
| Reveural Dlopment and Small Industries | Demonstrators |
| Health .. .. | Physicist<br>Photographer<br>Photomicrographer |
| Ayurveda .. .. | Ayurvedic Physicians and Personnel Female Attendants |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| *Name of Department* | *Grade of or category of officers* |
|---|---|
| Port Commission .. | Marine Engineers<br>Light House Keepers Grade I<br>Light House Keepers Grade II<br>Mobile Crane Drivers |
| Geological Survey .. | Technical Assistants<br>Field Assistants |
| Ministry of Justice .. | Assistant Secretary |
| Legal Draftsman .. | Legal Draftsman<br>Deputy Legal Draftsman |
| Attorney-General .. | Solicitor-General<br>Deputy Solicitor General |
| Government Analyst .. | Photographer and Technical Assistant<br>Assistant Technicians |
| Ministry of Local Government Town and Country Planning Division | Director of Town and Country Planning |
| Fisheries Department .. | Photographic Technician |
| Department of Commerce .. | Deputy Director of Commerce<br>Assistant Director of Commerce<br>Commercial Assistants<br>Examiners of Standards |
| Agriculture .. | Cine Cameraman |
| Co-operative Development .. | Cinema Operator |
| Marketing Department .. | Foreman<br>Chemist |
| Agrarian Services .. | Irrigation Officers<br>Crop Insurance Officer |
| Food .. .. | Legal Assistant<br>Wharf Assistants<br>Supervisors |
| Ministry of Education and Cultural Affairs | Pundits and Vidwans<br>Lecturers, Grade I and Grade II, of the Technical Institutes<br>Matrons (Qualified Nurses)<br>Principal, Royal College |
| Archaeological .. | Photographer<br>Assistant Photographer |
| National Museums .. | Photographic Labourer |
| Labour .. .. | Inspector of Factories<br>Deputy Commissioner of Labour and Chief Inspector of Factories<br>(The post of Chief Inspector of Factories has been redesignated as Deputy Commissioner of Labour and Chief Inspector of Factories) |
| Posts and Telecommunications.. | Chief Post Master<br>Chief Telegraph Master<br>Postal Sorting Officers Grade I<br>Drivers<br>Inspectors of Telegraph Messengers<br>Female Telephonists<br>Monitors |
| Civil Aviation .. | Air Port Commandant, Katunayake<br>Assistant Air Port Commandant, Katunayake<br>Air Port Commandant, Ratmalana<br>Air Traffic Controller Grade I<br>Aeronautical Inspectors<br>Assistant Aeronautical Inspectors, Grade I<br>Assistant Aeronautical Inspectors, Grade II |
| Probation and Child Care Services | Psychiatrists<br>Trained Teachers |
| Meteorology .. .. | Meteorologists<br>Observers/Assistant Observers<br>(Observers and Assistant Observers of the Meteorological Department have been redesignated as Observers) |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| *Name of Department* | *Grade of or category of officers* | |
|---|---|---|
| Railway .. | .. Railway Security Service | |
| | Machine Minders | |
| | Engineers | |
| | Medical Officers | |
| | Armed Services Personnel | |
| | Minor Grades | |
| | Quasi Clerical Service | on absorption into G.C.S. |
| | District Clerical Service | |
| | D. R. O.'s Clerical Service | |
| | Government Press Clerical Servic | |
| | Customs Clerical Service | on absorption into Unified Customs Service. |
| | Officers of the Appraising, Baggage and Preventive Branches | |
| | Ceylon Administrative Service—Most of the grades and services absorbed into the new service had their former scales altered on absorption into the C.A.S. | |

Changes recommended by the Salary Anomalies Committee, whose report has not been finalised, are not included in this list. Any recommendations of the Salary Anomalies Committee which are accepted will be implemented with effect from 1.5.68.

## ඩීසල් තෙල් බද්ද : හිඟ තබා ඇති අය

டீசல் எண்ணெய் வரி : பணநிலுவையிலுள்ளோர்

**HEAVY OIL TAX : PERSONS IN ARREARS**

3. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ—ටී. බී. තෙන්නකෝන් මයා—දඹුල්ල—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ளை சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. T. B. Tennekoon—Dambulla)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඩීසල් තෙල් බද්ද තවමත් අයකර ගැනීමට නොහැකිවීමෙන් කොපමණ මුදලක් හිඟව තිබේද? (ආ) නම්, ලිපිනයන් සහ අයවිය යුතු මුදල් වෙන් වෙන් වශයෙන් දක්වමින් එසේ අයවිය යුත්තේ කාගෙන් දැයි එතුමා සඳහන් කරනවාද? (ඉ) ඒ බදු මුදල සම්පූර්ණයෙන් අහෝසි කරනවාද? (ඊ) එසේ නම් එයට හේතු දක්වන්නේද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இன்னும் அறவிட முடியாமல் நிலுவையாயுள்ள டீசல் எண்ணெய் வரித் தொகை எவ்வளவு? (ஆ) அவ்வாறு நிலுவையாயுள்ள பணம் யார் யாரிடமிருந்து அறவிடவேண்டுமோ அவர்களின் பெயர்களையும், முகவரிகளையும் ஒவ்வொருவரிடமிருந்தும் அறவிடவேண்டிய தொகையையும் வெவ்வேறாக அவர் தெரிவிப்பாரா? (இ) இந்நிலுவைகளை மீள முடியாத இழப்பென ஒப்புக்கொண்டு அறவிடாமல் விட்டுவிட அவர் கருதியுள்ளாரா? (ஈ) அங்ஙனமாயின், ஏன்?

asked the Minister of Finance: What are the arrears of Heavy Oil Tax that have yet to be recovered? (*b*) Will he state the names and addresses of the persons from whom these arrears have to be recovered and the amounts due from each such person? (*c*) Is it proposed to write off arrears? (*d*) If so why?

**ගරු වන්නිනායක**

(கௌரவ வன்னிநாயக்க)

(The Hon. Wanninayake)

(*a*) Rs. 19,412,823.92. (*b*) A list giving this information is tabled. (*c*) No, recovery is being pursued in terms of the Heavy Oil Duty (Amendment) Acts, but arrears due for the period prior to May 1961 are deemed irrecoverable owing to defects in the Heavy Oil Motor Vehicles Taxation (Amendment) Act, No. 20 of 1961. (*d*) *Vide* Answer to (*c*).

**නියෝජ්‍ය කථානායකතුමා**

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

As the list tabled runs into 400-odd pages, it will not appear in HANSARD but will be given to the hon. Member.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ඩීසල් තෙල් බද්ද: හිඟ තබා ඇති අයට අළුත් ලොරි

டீசல் எண்ணெய் வரி : பணநிலுவையிலுள்ளோர்க்கு புதிய லொறிகள்

## DIESEL OIL TAX : NEW LORRIES FOR PERSONS IN ARREARS

4. ද සොයිසා සිරිවර්ධන මයා. (ටී. බී. තෙන්නකෝන් මයා.—දඹුල්ල—වෙනුවට)
(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரீ. பி. தென்னகோன் சார்பாக)
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. Tennekoon)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ඩීසල් බදු හිඟව තිබුන බොහෝ දෙනෙකුට අළුත් ලොරි රථ ලබා දී තිබෙනවාද ? (ආ) එසේ නම්, ඒ අයගේ නම් වෙන් වෙන් වශයෙන් ලිපිනයන් සමග එතුමා සඳහන් කරන්නේද ?

நிதி அமைச்சரைக் கேட்ட வினு : (அ) டீசல் எண்ணெய் வரி நிலுவையாயுள்ள பலருக்குப் புதிய லொறிகள் பெற்றுக் கொடுக்கப்பட்டுள்ளனவா ? (ஆ) அவ்வாறெனில், அவர்களின் பெயர்களையும் முகவரிகளையும் வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா ?

asked the Minister of Finance : (a) Have new lorries been obtained for many of those who were in arrears of the Diesel Oil Tax ? (b) If so, will he state the names and addresses of those persons separately ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

(අ) එසේය. (ආ) එවැනි ආයතනවල සහ පුද්ගලයින්ගේ මුළු ගණන 154 කි. ලැයිස්තුව සභාගත කරමි.

සභාගත කරන ලද ලැයිස්තුව මෙසේයි :
சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு :
*The list tabled is as follows :*

ඩීසල් බදු හිඟව ඇතත් අළුත් ලොරි වැයි වෙන්කර දී ඇති අයගේ නම් ලැයිස්තුව

| අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 1. | සී/ස. මොරපනේ තේ සමාගම ... | ... 29, වාල්ස් පෙදෙස, මොරටුව |
| 2. | ඇම්. ජේ. ප්‍රනාන්දු ... | ... 221, ඉදිබැද්ද, මොරටුව |
| 3. | කේ. ආර්. පෙරේරා ... | ... 232, 4 වෙනි හරස් වීදිය, කොළඹ |
| 4. | කේ. කේ. මාධවන් සහ සමාගම ... | ... 30, රැජිණ විදිය, කොළඹ |
| 5. | ඇල්. ඩී. ඇල්. අබේසේකර ... | ... 100, ප්‍රධාන පාර, කොළඹ 6 |
| 6. | එස්. ඩී. ඒ. ජයසුන්දර ... | : රිජ්විව්, ආටිගල, හංවැල්ල |
| 7. | කේ. ඒ. පීරිස් සිංඤෝ | ... දයා ස්ටෝර්ස්, මීගොඩ |
| 8. | ජී. ඩී. ප්‍රෙමදස ... | ... අතුරුගිරිය, හෝමාගම |
| 9. | ඩී. පී. එම්. ඩයස් ... | ... තලන්ගම, මාලබේ |
| 10. | විමලධර්ම සහෝදරයෝ ... | ... මල්වත්ත පාර, කොළඹ |
| 11. | කොළඹ කොමර්ෂල් කොම්පැණිය | ... යූනියන් පෙදෙස, කොළඹ 2 |
| 12. | ඇල්. ඩී. උපසේන ... | ... බෝමිරිය, කඩුවෙල |
| 13. | ඒ. පී. පෙරේරා ... | ... මාකොළ, කඩවත |
| 14. | සී/ස. මොරවක සහ සමාගම ... | ... කොට්ටාව, පන්නිපිටිය |
| 15. | සී/ස. බ්‍රවුන් සහ සමාගම ... | ... ඩාර්ලි පාර, කොළඹ |
| 16. | විලරි වතු සමාගම ... | ... ලෙයාඩ් ගොඩනැගිල්ල, කොළඹ |
| 17. | ඒ. එම්. ඩී. සමිතිදස ... | ... පිටකොටුව, කොළඹ |
| 18. | කේ. ඒ. ඩී. ඇල්බට් ... | ... පට්ටවල, කැළණිය |
| 19. | ඩී. ඇම්. ද සේරම් ... | ... මුල්ලේරියාව, අංගොඩ |
| 20. | ජී. වී. සේනානායක ... | ... හල්පේ, මීරිගම |
| 21. | ඇස්. ඇම්. බුහාරි ... | ... 134, මැලිබන් වීදිය, කොළඹ |
| 22. | කේ. ඒ. ඩී. ජයසේන ... | ... අතුරුගිරිය |
| 23. | සී/ස. රිචඩ් පීරිස් සහ සමාගම ... | ... හයිඩ්පාක් කෝනර්, කොළඹ |
| 24. | ඇල්. ඒ. පෙරේරා ... | ... විනීතා වාස, අංගොඩ |
| 25. | කේ. ඇඩ්වින් පෙරේරා ... | ... 72/25, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ |
| 26. | ජේ. ඩබ්. කළුබෝවිල් ... | ... වේරගල, පාදුක්ක |
| 27. | සිලෝන් එස්ටේට් ඒජන්සි ... | ... යූනියන් පෙදෙස, කොළඹ 2 |
| 28. | කේ. ඩී. ඩැනියෙල් ... | ... බියන්වල, කඩවත |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු | වාචික පිළිතුරු

| අංකය | නම | | ලිපිනය |
|---|---|---|---|
| 29. | ඩබ්. ඩී. සයිමන් | ... ... | 36/53, ඇඩ්මන්ටන් පාර, කොළඹ 8 |
| 30. | මැලිබන් බිස්කට් සමාගය | ... ... | කොළඹ |
| 31. | ඒ. ඩබ්. ඒ. අබේගුණසේකර | ... | 5, මේපිල්ඩ් පාර, කොළඹ 13 |
| 32. | සී/ස. ඇසෝසියේටඩ් මෝටර්වේස් | ... | 185, යූනියන් පෙදෙස, කොළඹ |
| 33. | ඩබ්ලිව්. පුංචිබණ්ඩා | ... ... | හරිස්චන්ද්‍ර මාවත, කොළඹ |
| 34. | සී/ස. රෝලන්ඩ්ස් | ... ... | තැ. පෙ. 296, කොළඹ |
| 35. | සෙන්ට් ඇන්තනි හාර්ඩ්වෙයාර් ස්ටෝර්ස් | ... | 516, ස්කිනර්ස් පාර දකුණ, කොළඹ |
| 36. | එච්. කේ. ධර්මදාස | ... ... | 42, මීගමුපාර, පෑලියගොඩ |
| 37. | සී/ස. වෙල්ගම සහ පුත්‍රයෝ | ... ... | ස්කිනර්ස් පාර දකුණ, මරදාන |
| 38. | සී/ස. හෝලයන්ස් සමාගම | ... ... | හැඳල, වත්තල |
| 39. | ජේ. ඒ. පොඩිඅප්පුහාමි | ... ... | අළුත් මාවත පාර, කොළඹ |
| 40. | සී/ස. මුසාජීස් සමාගම | ... ... | ඇල්ස්ටන් පෙදෙස, කොළඹ |
| 41. | සී/ස. වීරකෝන් සහෝදරයෝ | ... ... | 185, වේල්ස්කුමාර මාවත, කොළඹ |
| 42. | ජේ. ඩබ්. මහකුමාරගේ | ... ... | කොළඹ |
| 43. | සී/ස. ලංකා ටුබැකෝ සමාගම | ... ... | කපූර් ගොඩනැගිල්ල, කොළඹ |
| 44. | ඩබ්. ඒ. ඇස්. ප්‍රනාන්දු | ... ... | 16, කොළඹ පාර, මීගමුව |
| 45. | සී/ස. එක්සත් පුවත්පත් සමාගම | ... ... | ලේක් හවුස්, කොළඹ |
| 46. | කේ. ඒ. ප්‍රනාන්දු | ... ... | මරදගහමුල, දිවුලපිටිය |
| 47. | පී. ඇම්. ඩී. හින්නි අප්පුහාමි | ... ... | 10, ජෙනරල් ලේක් පාර, කොළඹ |
| 48. | ඩබ්. පී. අර්නෝලිස් අප්පු | ... ... | නාරාහේන්පිට පාර, කොළඹ |
| 49. | පී. ඇස්. ප්‍රනාන්දු | ... ... | ගාලු පාර, ගල්කිස්ස |
| 50. | කේ. පී. ඩබ්ලිව්. අබේරත්න | ... ... | 68, විජය පාර, වැල්ලම්පිටිය |
| 51. | සී/ස. සදර්න් ෆ්‍රයිටර්ස් | ... ... | 23, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ |
| 52. | කේ. ඒ. ඩී. ඇල්බට් | ... ... | ගෝනවිල |
| 53. | ආර්. සෝමසුන්දරම් | ... ... | 51, පංචිකාවත්ත පාර, මරදාන |
| 54. | සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් | ... ... | 1, බ්‍රිජ් වීදිය, කොළඹ 2 |
| 55. | පෞඩන්බර්ග් සහ සමාගම | ... ... | කුමාර වීදිය, කොළඹ 1 |
| 56. | සී. වයි. රාජපක්ෂ | ... ... | කඩවත |
| 57. | කේ. ඩී. ගුණසේකර | ... ... | මුල්ලේරියාව, අංගොඩ |
| 58. | එම්. ආර්. ප්‍රනාන්දු සහ සමාගම | ... ... | හැටන් |
| 59. | ඊ. ඒ. ආර්. එල්. වහාබ්දීන් | ... ... | අකුරණ |
| 60. | එම්. බී. උඩුරාවන | ... ... | පේරාදෙණිය පාර, මහනුවර |
| 61. | ඩබ්. ජේ. ඩාර්ලිස් | ... ... | වැරැල්ලගම |
| 62. | ජෝර්ජ් ගුණසේකර | ... ... | මාලිගාතැන්න, කඩුගන්නාව |
| 63. | ආර්. ඇම්. නඩරාජ පිල්ලෙයි | ... ... | හැටන් පාර, ගිනිගත්හේන |
| 64. | එයින්ස් සහ සමාගම | ... ... | ගම්පොල |
| 65. | ආර්. විජේසිරි | ... ... | වත්තේගම |
| 66. | පී. ඇම්. ඩේවිඩ් සිල්වා | ... ... | විජිත තියටර්, මස්කෙළිය |
| 67. | ඒ. එම්. වින්සන්ට් සිල්වා | ... ... | ගම්පොල |
| 68. | ඒ. එම්. පී. චාර්ලිස් සිල්වා | ... ... | කොළඹ වීදිය, මහනුවර |
| 69. | එම්. පී. කරෝලිස් | ... ... | පේරාදෙණිය |
| 70. | ඇම්. බී. චන්ද්‍රපාල | ... ... | අලුත්නුවර පාර, ගම්පොල |
| 71. | එම්. ඒ. ජයතිස්ස | ... ... | 209, 2 වෙනි හරස් වීදිය, කොළඹ |
| 72. | එම්. එම්. ආර්. බී. හේරත් | ... ... | 51, මලබාර් වීදිය, මහනුවර |
| 73. | එම්. සී. මොහමඩ් අලි | ... ... | පිළිමතලාව |
| 74. | පී. ඇස්. සහ ඇස්. සමාගම | ... ... | පේරාදෙණිය පාර, මහනුවර |
| 75. | එස්. එම්. ජෙලාබ්දීන් | ... ... | 24, කාසල් වීදිය, මහනුවර |
| 76. | හැටන් ට්‍රාන්ස්පෝට් සමාගම | ... ... | හැටන් |
| 77. | ජී. එස්. එස්. හමීඩ් | ... ... | මුල්ලේගම, අඹතැන්න |
| 78. | ජී. පී. එම්. කරුණාරත්න | ... ... | අඹගමුව පාර, ගම්පොල |
| 79. | ආර්. ඒ. පී. විජේ ගුණවර්ධන | ... ... | අංදෙනිය, වැරැල්ලගම |
| 80. | පී. කොඩිතුවක්කු ආරච්චි | ... ... | තෙල්දෙනිය |
| 81. | මනුවර්ණ සංචාරකයෝ | ... | 103, වැවඅංග, සුදුහුම්පොල, මහනුවර |
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
(අ) සහ (ආ) මණ්ඩලය පත් කොට ඇත.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මේ පත් කර තිබෙන මණ්ඩලයේ එක් තැනැත්තකුට, ඒ කියන්නේ කේ. එස්. ප්‍රනාන්දු නමැති මහත්මයාට කුලී ගෙවල් දහයක් තිබෙනවා. ඒ බව දැනගෙනද මේ මහත්මයාව පත් කළේ?

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
එහෙම නම්, ගෙවල් කුලී ගෙවන්නන්ට සහනයක් ලබා දීම සඳහා ඇති කර තිබෙන මේ පාලන මණ්ඩලයට කුලී ගෙවල් දහයක් හිමි කෙනෙකු පත්වී සිටිනවා නම්, නැවත මේ ගැන සලකා බලා ඊට වඩා සුදුසු, ගෙවල් කුලී ගෙවන්නන්ගේ පැත්ත අරගෙන ක්‍රියා කරන්නට පුළුවන් කෙනෙකු පත් කිරීම ගැන සලකා බලනවාද?

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
මොකක්ද ඒ ප්‍රශ්නය?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඇමතිතුමාගේ අදහස මේ මණ්ඩල මාර්ගයෙන් ගෙවල් කුලී ගෙවන්නන්ට යම් කිසි සහනයක්, යුක්තියක් ඉෂ්ට කරදීම නම්, කුලී ගෙවල් දහයක් අයිති ගෙවල් හිමියකු මේ පාලන මණ්ඩලයට පත්වී සිටිනවා නම් ඒ තැනැත්තා ඉවත් කර ඒ වෙනුවට ගෙවල් කුලී ගෙවන්නන්ගේ අයිතිවාසිකම් ගැන ක්‍රියා කිරීමට ඊට වඩා කැමැත්තක් දක්වන කෙනෙකු පත් කිරීම ගැන එතුමා සලකා බලනවාද?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ගෙවල් හිමි අය ප්‍රතිපත්තියක් හැටියට—

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගෙවල් දහයක්.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ගෙවල් හිමි අය ප්‍රතිපත්තියක් හැටියට ගෙවල් කුලී පාලන මණ්ඩලවලට පත් කරන්නට එපාය කියා ගරු මන්ත්‍රීතුමා කිව්වත් මා නම් එය නුසුදුසුකමක් හැටියට සලකන්නේ නැහැ. මක්නිසාද? ගෙවල් කුලී ගෙවන්නන් වෙනුවෙන් මේ ගරු සභාවේ කථා කරන ගරු මන්ත්‍රීවරුන්ටත් ගෙවල් තිබෙන බව, අයිති බව මා දන්නවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

තවත් අතුරු ප්‍රශ්නයක්. ළඟදී තිදෙනෙකු මේ මණ්ඩලයට පත් කළේ මන්ත්‍රීවරයාගේ නිර්දේශයටත් සුළු නගර සභාවේ නිර්දේශයටත් පටහැණිවයි. මේ තිදෙනාම එකම ගමෙන් පත් කර තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවාද? ගම් විශාල ගණනක් තිබෙන ප්‍රදේශයක එක ගමකින්, එනම් කෙසෙල්වත්ත නමැති ගමෙන් මේ තිදෙනාම පත් කර තිබෙන බව ඇමතිතුමා දන්නවාද?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ඒ ගැන මා දන්නේ නැහැ. සොයා බලන්නම්.

## ශෝක ප්‍රකාශය: ශ්‍රීමත් එඩ්වින් විජයරත්න

*அனுதாபத் தீர்மானம்: சேர் எட்வின் விஜயரத்ன*

## VOTE OF CONDOLENCE: SIR EDWIN WIJEYERATNE

අ. භා. 2.14.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එඩ්වින් විජයරත්න ශ්‍රීමතාගේ අභාවය සම්බන්ධව තමුන්නාන්සේගේ අවසරය ඇතිව වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මා අදහස් කරනවා.

විජයරත්න මහත්මයා 1931 වර්ෂයේදී කෑගල්ල ආසනය වෙනුවෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පත්වී මේ ගරු සභාවේ නියෝජ්‍ය කථානායක ධුරයත් දැරූ කෙනෙක්. 1947 ප්‍රථම පාර්ලිමේන්තුවේ සෙනෙට් මන්ත්‍රීවරයකු හැටියට පත් වූ ශ්‍රීමත් විජේරත්න නිදහස් ලංකාවේ ප්‍රථම ස්වදේශ කටයුතු භාර ඇමති ධුරය දැරුවා. එහෙත් 1951 දී දේශපාලනයෙන් ඉවත් වූ එතුමා 1951 සිට 1957 දක්වා ලංකාව වෙනුවෙන් එංගලන්තයේත් ඉන්දියා වේත් තානාපති ධුර දැරූ බව අප දන්නවා. මේ අවුරුදු 25 ක තරම කාලය තුළ විජේරත්න මහතා මන්ත්‍රීවරයකු හැටියටත් තානාපතිවරයකු හැටියටත් ලංකාව වෙනුවෙන් විශිෂ්ට සේවයක් කළ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුද්ගලයෙක්. එහෙත් එතුමා දේශපාලන ජීවිතය ආරම්භ කළේ ඊට අවුරුදු 25 කට තරම් ප්‍රථමයි.

වයස අවුරුදු 25 තරුණ කාලයේදී නීතිඥයකු වශයෙන් එතුමා සිංහල ජාතිය විඳිමින් සිටි දුක් දැක 1915 දී ඒ කාලයේ නායකයන් සමග එක් වී නිදහස ලබා ගැනීමට ක්‍රියා කළ බව අප දන්නවා. සේනානායක සහෝදරයන්, පොන්නම්බලම් සහෝදරයන්, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, ඊ. ඩබ්ලිව්. පෙරේරා ආදී නායකයන් සමග ලංකා ජාතික සංගමය ආරම්භ කරමින් ලංකාවට නිදහස ලබා ගැනීම සඳහා කරගෙන ගිය ජාතික සටනට එතුමාත් සහභාගි වුණා. එතුමාගේ ක්‍රියා පටිපාටිය නිසා ඒ කාලයේ ඉංග්‍රීසි අධිරාජ්‍යය මාස කීපයක් එතුමා හිර භාරයේ තැබූ බව අප කවුරුත් දන්නවා. ඉන් පසු එතුමා ලංකා ජාතික සංගමයේ සභාපති හැටියටත් අවුරුදු කීපයක් ක්‍රියා කළා. අපි තරුණයන් හැටියට ලංකා ජාතික සංගමයට බැඳෙන කාලයේ අපි දුටුවා, ලංකාවට නිදහස ලබා ගැනීමට විජේරත්න මහත්මයා තුළ කොයිතරම් විශාල ආශාවක්, කොයිතරම් විශාල කැක්කුමක් තිබුණාද කියා. ඒ පැරණි දේශපාලනඥයන්ගෙන් අන්තිම වීරවරයා හැටියට අපට සලකන්නට පුළුවන් විජේරත්න මහතාගේ අභාවය ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන අතර, අවුරුදු රාශියක් එතුමාට ආධාර දෙමින් ක්‍රියා කළ ශෝකයෙන් තැවෙන එතුමාගේ ආයනීව කෙරෙහිත් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපේ මේ ගරු සභාවේ ශෝකය එතුමාගේ ආයනීවටත් ඥතීන්ටත් දන්වා යවන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)

(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මේ සභාවේ ශෝකය විජේරත්න අර්යාවටත්, දරු පිරිසටත් ඔබතුමාගේ මාගීයෙන් යැවීම සුදුසු යයි රජය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මා ස්ථිර කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්ව පරිදි ඉතා මත් තරුණ වයසේ පටන්, මා හිතන හැටියට නීති විද්‍යාලයට ඇතුළත් වූ කාලයේ පටන්ම, ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැතිතුමා ජාතික නිදහස ලබා ගැනීමට සටන් කළ අපේ වීරවරයන් සමග ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කළා. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජ්‍ය කථානායක වශයෙනුත්, 1948 සිට ස්වදේශ කටයුතු ඇමති වශයෙනුත්, 1951 සිට එංගලන්තයේ ලංකා තානාපති වශයෙනුත්, 1955 සිට ඉන්දියාවේ ලංකා තානාපති වශයෙනුත්, එතුමා කළ සේවය ගැන මේ රටේ මහජනතාව එතුමාට කෘතඥ වෙනවාට කිසිම සැකයක් නැහැ.

එක අතකින් බලන විට එතුමාගේ ජීවිතය ඉතාමත්ම ආදර්ශමත් ජීවිතයක්. එතුමා තරුණ වියේදී පෙරකදෝරු විභාගය සමත් වී ඉන් පසුව එංගලන්තයට ගොස් අධිනීතිඥ විභාගයෙන් දක්ෂ ලෙස සමත් වී ආපසු ලංකාවට පැමිණ 1931 දී කෑගල්ල කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් රාජ්‍ය මණ්ත්‍රණ සභාවට පත් වුණා. ඉන් පසුව කෑගල්ල ප්‍රදේශයේ අයටත්—විශේෂයෙන්ම සත් කෝරළේ අයට—පොදුවේ මුළු ලංකාවාසී හැමදෙනාටත් එතුමාගෙන් විශාල සේවයක් සිදු වුණා. ඒ අන්දමට ඉතාමත්ම වටිනා ජීවිතයක් ගත කළ එමෙන්ම ඉතා වටිනා පුත්‍රරත්නයන් තුනකුත් ලබා දුන් එතුමාට අවසාන කාලය රෝගාතුරව වුවත් විවේකීව තම නිවසේ සිටීමට ඉඩ ප්‍රස්තාව ලැබුණා. එවැනි මහඟු සේවයක් කළ ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මහතාගේ අභාවය ගැන විරුද්ධ පාර්ශ්වය වෙනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන් අපේ ශෝකයත් ගරු රාජ්‍ය ඇමති තුමා අදිරිපත් කළ යෝජනාවට සම්බන්ධ කරන හැටියට නැවත වරක් මා ඉල්ලා සිටිනවා.

**පී.ජී. බී. කළුගල්ල මයා.** (කෑගල්ල)
*(திரு. பீ. பி. ஜீ. கலுகல்ல—கேகாலை)*
(Mr. P. B. G. Kalugalla—Kegalla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාව ප්‍රාප්ත ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැති තුමා ගැන ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා සහ විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) සඳහන් කළ කරුණු කෑගල්ලේ මන්ත්‍රීවරයා විශයෙන් මා විසිනුත් අනුමත කරන අතරම ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැතිතුමා දීර්ඝ කාලයක සිට මා හඳුනාගෙන සිටි මහත්මයෙක් බව මා විසින් මේ අවස්ථාවේදී කිය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 10 ක පමණ කාලයක් එතුමා රෝගාතුරව නිවසේ විශ්‍රාම පිට සිටි බව අප කවුරුත් දන්නා කරුණක්. ඒ කාලය තුළදී එතුමා කටයුතු කළේ දේශපාලන ජීවිතයෙන් තොරව එන යන හැම්දෙනා සමගම කථාබස් කරමිනුයි. 1931 දී එතුමා කෑගලු ප්‍රදේශය වෙනුවෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයා වශයෙන් පත් වී ඒ කාලයේ හැටියට ප්‍රදේශයට විශාල සේවයක් එතුමාගෙන් සිදු වුණා. එමෙන්ම එතුමා ඇමතිවරයෙක් හැටියටත් විශාල සේවයක් කර තිබෙනවා. පළාතේ බෞද්ධ සහ සමාජ කටයුතුවලදී එතුමා පුරෝගාමීව කටයුතු කළ කෙනෙක් හැටියට සලකන්නට පුළුවන්. නීතිඥයෙක් වශයෙන් කෑගල්ල උසාවියේත් පසුව අධිනීතිඥයෙක් වශයෙන් කෑගල්ලේ සහ මුළු උඩරට ප්‍රදේශයේමත් ඉතා දක්ෂ ලෙස කටයුතු කළ කෙනෙක් බව අපි කවුරුත් පිළිගන්නවා. එවැනි මහගු සේවයක් සැලසූ ශ්‍රීමත් එඩ්වින් විජේරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳව කෑගල්ලේ මන්ත්‍රීවරයා වශයෙන් මගේ ශෝකයත් එම ප්‍රදේශයේ මහජනතාවගේ ශෝකයත් විජේරත්න ආර්යාවටත් දරු තිදෙනාටත් යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Sir Edwin Wijeyeratne, ex-Member of State Council. I shall request the Acting Clerk of the House to make a minute of the proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

## නොපැමිණීමේ අවසරය: ඩී. එෆ්. හෙට්ටිආරච්චි මයා.

*வராதிருக்க அனுமதி*
*திரு. டீ. எப். ஹெற்றியாரச்சி*

## LEAVE OF ABSENCE: MR. D. F. HETTIARACHCHI

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன)*
(Mr. M. P. de Zoysa Siriwardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 24(1)(ඊ) ඡේදය යටතේ නිවිතිගල මන්ත්‍රීවර ඩී. ඇෆ්. හෙට්ටිආරච්චි මහතාට 1968 ඔක්තෝබර් මස 24 වැනි දින සිට මාස 3 ක් තුල මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

විසින් ස්ථිර කරන ලදී.

*அனுவதித்தார்.*

*seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## සමුපකාර සමිති (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත

## கூட்டுறவுச் சங்கங்கள் (தற்காலிக ஏற்பாடுகள்) மசோதா

## CO-OPERATIVE SOCIETIES (TEMPORARY PROVISIONS) BILL

කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ඔක්තෝබර් 8.]

"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු එම්. ඩී. බණ්ඩා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒக்ரோபர் 8 ஆம் தேதிய வினா மீதான ஒத்தி வைக்கப்பெற்ற விவாவதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

“ மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக ” [கௌரவ எம். டீ. பண்டா]

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question.—[8th October.]*

"That the Bill be now read a Second time".—[*The Hon. M. D. Banda.*]

*Question again proposed.*

අ. භා. 2.23

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පනවන ලද හදිසි නියෝග මගින් සංශෝධනය කරනු ලැබූ සමුපකාර සමිති ආඥාපනතේ 43 වැනි වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවන ලද සමහර ආඥා වලංගුව තබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මේ පනත් කෙටුම්පත ගැන තවත් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා. සමුපකාරය ගැන අප කථා කරන විට සමහර ධනපති ප්‍රවෘත්ති පත්‍ර ඒ නම පවා හඳුන්වන්නේ ඉතාම නීරස එකක් හැටියටයි. පසුගිය දා මා මෙම ගරු සභාවේදී කළ කථාව ගැන එක්තරා ඉංග්‍රීසි පුවත්පතක්, "මේ තරම් නීරස මාතෘකාවක් යටතේ මේ තරම් දීර්ඝ ලෙස කථා කළාය" යනුවෙන් සඳහන් කර තිබෙනු මා දැක්කා.

සමුපකාර ව්‍යාපාරයේ මේ නීරසභාවය ඇති වී තිබෙන්නේ ධනේශ්වර පන්තියටයි. ධනපති අර්ථිකය විශ්වාස කරන අය තුළ සමුපකාරය ගැන විශ්වාසයක් නැහැ. ඒ නිසා ඔවුන්ට සමුපකාරය නීරසයි. ධනේශ්වර ක්‍රමය අපට කොතරම් නීරසද ඒ තරමටම ධනේශ්වර පන්තියට සමුපකාරය නීරසයි. පසුගිය කාලය මුළුල්ලේ මේ ආණ්ඩුව විසින් හදිසි නීතිය යටතේ සමුපකාරයට විරුද්ධව වැඩ පිළිවෙළක් ගෙනගොස් මේ රටේ සමුපකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය සම්පූර්ණයෙන්ම නැති කර දමා තිබෙන්නේ එකී ප්‍රතිපත්ති අනුවයි. සමුපකාරය රටක ආර්ථිකයේත් සමාජ ජීවිතයේත් ඉතා වැදගත් තැනක් ගන්නවා. බහුජන ව්‍යාපාරයක් වශයෙන් රටේ ආර්ථික ජීවිතය කෙරෙහි බලපාන සමුපකාර ව්‍යාපාරයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය මරාදැමීමට විරුද්ධවයි අප මේ කථා කරන්නේ. හදිසි නීතියේ මුවාවෙන් සමුපකාරයට අතගැසීම සම්පූර්ණයෙන්ම වැරදි බවයි අප ප්‍රකාශ කරන්නේ. මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති සංගම් ගණනාවක්ම, හදිසි නීති යටතේ ඇමතිතුමා විසින් කරන ලද නියෝග අනුව, හදිසි නීතිය තුළින් ඇමතිතුමාට ලැබී තිබෙන බලතල යටතේ විසුරුවා හැර ඒවා පාලක මණ්ඩල යටතට පත් කිරීම ගැනත් එම පාලක මණ්ඩල විසින් ගෙනයන දූෂණයන් ගැනත් මා මීට කලින් කථා කළා. මගේ කථාවෙන් පසු, විශේෂයෙන්ම වැලිගම් කෝරළේ සමුපකාර සමිති සංගමය දැන් බොහෝ කලබලයට පත් වී එහි ලියකියවිලි පිට වුණු අන්දම සොයා බැලීමට පරීක්ෂණ පවත්වන බව මට ආරංචියි. ඒ උදවිය පරීක්ෂණ පවත්වන්නේ දූෂණ නැති කර ගැනීමට නොව දූෂණ එළිදරවු වුණේ කොහොමද යන්න සොයා ගැනීමටයි. ඒ ප්‍රදේශයේ පමණක් නොව, හබරාදුව ඡන්ද දායක කොට්ඨාශයේ පවා සමුපකාර ව්‍යාපාරය හදිසි නීති යටතේ සමුපකාරිකයන් අතින් උදුරා පාලක මණ්ඩලවලට දී තිබෙන බව අප දන්නවා. රජයේ කටයුතුවලට සම්බන්ධ අය, රජයට වගකියන තත්ත්වයේ සිටින අය මූලික වී නායක වී ගෙනගිය සමුපකාර ව්‍යාපාර පවා අද මණ්ඩලවලට පවරා දී තිබෙනවා. මෙම කෙටුම්පත් පණතින් රජය බලාපොරොත්තු වන්නේ ඒ තත්ත්වය තවත් අවුරුදු 4 ක් තබා ගන්නටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එසේ තබා ගන්නට ඇමතිතුමාට බලතල තිබෙනවා. මෙය සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රමයක්. ඒ නිසා, විසුරුවා හැරීමෙන් පසු පාලක මණ්ඩලවලට පවරා ගත් සමුපකාර සමිති වහාම ඒ සමුපකාරිකයන් අතට නැවතත් පත් කළ යුතුය යන්නයි අපේ ඉල්ලීම. සමුපකාර ව්‍යාපාරය ජනතාව අතර සම්බන්ධකම් ඇති කරන ව්‍යාපාරයක් බව කලින් කිව්වා. වෙනත් විධියකින් කියනවා නම්, සමුපකාර ව්‍යාපාරයෙහි යෙදී සිටින්නන් එකිනෙකා අතර සම්බන්ධකම් ඇති කරන, සාමාජිකයන් තවත් සාමාජිකයන් සමග සම්බන්ධකම් ඇති කරන ව්‍යාපාරයක් පමණක් නොව සමිතියක් හා තවත් සමිතියක් අතර සම්බන්ධකම් ඇති කරන්නාවූද, සමිතියක් හා සමිති සංගමයක් අතර සම්බන්ධකම් ඇති කරන්නාවූද, සමිති සංගමයක් හා තවත් සමිති සංගමයක් අතර සම්බන්ධකම් ඇති කරන්නාවූද වැදගත් ව්‍යාපාරයක් හැටියටයි සමුපකාර ව්‍යාපාරය හඳුන්වන්නේ. එපමණක් නොව සමුපකාරය, රටවල් අතරත් සම්බන්ධකම් ඇති කරන ව්‍යාපාරයක්.

අපේ රටේත් සමුපකාර ව්‍යාපාරයක් තිබෙනවා. ලංකා සමුපකාර මහා සංගමය නමින් සංවිධානයකුත් තිබෙනවා. එහෙත් ඒ සංගමය තිබෙන්නේ සමුපකාර ව්‍යාපාරයේ කටයුතුවලට නොවෙයි. ප්‍රචාරක කටයුතුවලට පමණයි එය සීමා වී තිබෙන්නේ. එය තිබෙන්නේ ලෝකයේ අනෙකුත් රටවල සමුපකාර කටයුතු ගැන සොයා ඇනගෙන, සමුපකාර ව්‍යාපාරිකයන් ලබාගත් ජයග්‍රහණයන් දැනගෙන, අත්දැකීම්වලින් ප්‍රයෝජන ගැනීමට මිස වෙනත් කටයුතුවල යෙදීමටද? ලංකා සමුපකාර මහා සංගමයට ඒ සම්බන්ධයෙන් නියම ඉඩ ප්‍රස්තා ලැබී නැහැ.

මේ රටේ ස. තො. ස. ආයතනය සමග වෙළෙඳ කටයුතුවල යෙදෙන ලෝකයේ සමහර රටවල් විශ්වාස කරගෙන සිටින්නේ ඇත්ත වශයෙන්ම තමන් කටයුතු කරන්නේ ලංකාවේ සමුපකාර ව්‍යාපාරයත් සමගය කියායි. පෝලන්තය වැනි රටවල් විශ්වාස කරගෙන සිටින්නේ ඔවුන් ලංකාවේ සමුපකාර ව්‍යාපාරයත් සමග සම්බන්ධකම් ඇති කරගෙන යම් යම් වෙළෙඳ කටයුතුවල යෙදෙනවාය කියායි. එහෙත් ඇත්ත වශයෙන්ම එවැනි තත්ත්වයක් නැහැ. ලංකාවේ තිබෙන ස.තො.ස. ව්‍යාපාරයත් සමගයි ඔවුන් සම්බන්ධකම් ඇති කරගෙන තිබෙන්නේ. ස.තො.ස., සමුපකාරයට කිසිම සම්බන්ධකම් ඇති ආයතනයක් නොවෙයි. තිබෙනවා නම් තිබෙන්නේ නමට පමණක් ඇති සම්බන්ධකමක් පමණයි. සමුපකාර කියන නම පමණක් අල්ලාගෙන කටයුතු කරන ව්‍යාපාරයක් සමගයි ඒ රටවල් සම්බන්ධ වී කටයුතු කරන්නේ. මේ ගැන බොහෝ රටවල් පුදුම වෙනවා. සමුපකාර තොග වෙළෙඳ සේවය රාජ්‍ය සේවාවකැයි කීවාම එය සමුපකාරයට සම්බන්ධ නැති බව පැහැදිලි නැද්ද? මෙය අනෙක් රටවලට කරන වංචාවක් නොවෙයිද? මෙය අනෙක් රටවල් මුලා කිරීමක් හැටියටයි කල්පනා කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ලංකාවේ සමුපකාර ව්‍යාපාරිකයන්ට පිටරටවල සමුපකාරිකයන්ගේ අත්දැකීම් සහ ජයග්‍රහණවලින් ප්‍රයෝජන ලබා ගන්නට පමණක් නොව ඒ රටවල් සමග යම් යම් ව්‍යාපාර පටන් ගන්නටත් කටයුතු කිරීමට සැලැස්සීම රජයේ වැදගත් යුතුකමක් බව මතක් කරන්නට කැමතියි.

පාරිභෝගිකයන්ගේ සංගමයක් හැටියට ලංකාවේ එක්තරා සමුපකාර සංගමයක් යම් යම් වෙළෙඳ ව්‍යාපාර ඇති කිරීමේ අදහසින් ලෝකයේ යම් යම් රටවල් සමග සම්බන්ධකම් ඇති කර ගන්නට ක්‍රියා කළ බව මා දන්නවා. සෝවියට් දේශයෙන් පසුගිය කාලයේ ගෙනා ටයර් වගයක් විකිණීමෙන් ඒ සමුපකාර සංගමයට විශාල ලාභයක් ලබා ගන්නට පුළුවන් වුණා. කෙතරම් විශාල ලාභයක් ලැබුණාද කිව්වොත් සමුපකාර ව්‍යාපාරය මගින් කොයි තරම් විශාල සේවයක් කරන්ට පුළුවන්ද යන හැඟීමක් ඔවුන්ට ඇති වුණා. ඒ අනුව ඒ අය පාරිභෝගිකයන්ගේ සංගමය නමින් සංගමයක් ඇති කරගෙන සමුපකාර ව්‍යාපාරිකයන් සමග සම්බන්ධකම් ඇතිව වැඩ කරන්නට ක්‍රියා කරගෙන ගියා. එහෙත් සමුපකාර දෙපාර්තමේන්තුව ඔවුන්ට අත දුන්නාද? නැහැ. ඒ ව්‍යාපාරය එතැනම ඇනහිටින තත්ත්වයට වැටුණා. සමුපකාර ව්‍යාපාරයේ වැඩ කටයුතු සීමා කරන්නේ නැතිව, හදිසි නීතිවලින් ගමනට බාධා කරන්නේත් නැතිව සමුපකාරය වැඩි දියුණු කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

ක්‍රියා කළ යුතුයි. සමුපකාර සමිතිවල ඉදිරි ගමනට බාධාකාරී වැඩ කරන්නට සමුප කාර මහා සංගමය වැනි සංවිධානවලට ඉඩ නොදී ක්‍රියා කරන්නට ඕනෑ. පිටරටවල් සමග පවා වෙළෙඳ කටයුතු අතින් සම් බන්ධකම් ඇති කර ගැනීමට ආධාර දීම ඒ නිසා ඉතාමත් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හදිසි නීතිය යටතේ අපේ රටේ ඇතැම් සමුපකාර සමිතිවල, සංගම්වල පාලනය මණ්ඩලවලට පැවරුවා. එපමණක් නො වෙයි, ලංකා ඉතිහාසයේ කවදාවත් නො කරන ලද ඉතාමත් දරුණු ඉතාමත් අප කීර්තිමත් කටයුතු පවා හදිසි නීතිය යටතේ කර තිබෙනවා. එනම්, මේ හදිසි නීතිය පාවිච්චි කර සමුපකාර සේවයේ යෙදී සිටි සේවකයන් කිහිප දෙනෙක් කිසිම වගවිභාගයක් නොකර, කිසිම චෝදනාවක් ඉදිරිපත් නොකර සමුපකාර ව්‍යාපාරයෙන් පිටමන් කර තිබෙනවා. මා සිතන අන්දමට මෙය අපේ රටේ සමුප කාර ව්‍යාපාරයේ කවදාවත් සිදු නොවුණ සිද්ධියක්. මෙම සමුපකාර ව්‍යාපාරය ආරම්භ කළ උදවිය විසින් එම ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම සඳහා පත් කරන ලද යම් යම් නිලධාරීන් හදිසි නීතියේ බලය පාවිච්චි කරමින් සේවයෙන් ඉවත් කර තිබෙනවා. වැලිගම් කෝරලයේ සමුපකාර සංගමයේ ඉතාමත් හොඳින් වැඩ කළ නිලධාරීන් දෙදෙනෙක් ගැන මා දන්නවා. එස්. ඩබ්ලිව්. රාජපක්ෂ, බෝධිපාල සිරි වර්ධන යන මහත්වරුන් දෙදෙනා හදිසි නීතිය යටතේ සමුපකාර ව්‍යාපාරයෙන් පැත්තකට දමා තිබෙනවා. මෙය ඇත්ත වශයෙන්ම රටේ සාමාන්‍ය නීතිය, ඒ වගේම කම්කරු නීතිය උල්ලංඝනය කිරී මක්ය කියා කියන්න පුළුවනි. මේ සේවක යන්ට තමන්ගේ නිදහසට කරුණු ඉදිරි පත් කිරීමටවත් අවස්ථාව නොදී, චෝදනා පත්‍රයක්වත් ඉදිරිපත් නොකර හදිසි නීතිය යටතේ සේවයෙන් ඉවත් කර දමා තිබෙනවා. මෙම සේවකයන්ට නැවත රක්ෂාව ලබා දෙනවාද කියා මා ගරු ඇමති තුමාගෙන් දැන ගන්න කැමතියි. නැවත ඔවුන් සේවයට බඳවා ගැනීම සඳහා කට යුතු කරනවාද කියා මා එතුමාගෙන් දැන ගන්න කැමතියි. ඔවුන් සේවයෙන් ඉවත් කරන ලද්දේ හදිසි නීතිය යටතේ නිසා ඔවුන් නැවත සේවයට බඳවා ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමති තුමාගේ බලතල පාවිච්චි කර යම් යම් සමිතිවල සිටින සේවකයන් අස් කළාට මොකද, සමුපකාර දෙපාර්තමේන්තුව මගින් චෝදනා ඉදිරිපත් කර තිබෙන නිලධාරීන් එම සේවයෙන් පන්නා දැමී මට නැත්නම් ඉවත් කිරීමට හදිසි නීති යේ බලය පාවිච්චි කර නැහැ. ලංකා ගමනා ගමන මණ්ඩලයේ සුභ සාධක සමිතිය ගැන මා පෙන්වා දෙන්න කැමතියි. එම සමිතියේ දැනට සිටින ලේකම් මහතාට විරුද්ධව සමුපකාර දෙපාර්තමේන්තුව මගින් විශාල චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවා. 1968.3.26 වැනි දින සමුපකාර සංගමයේ උප කොමසාරිස්තුමා විසින් යවන ලද අංක අයි/කේ.ඊ. 299 දරන ලිපියේ කේ. ඒ. පෙරේරා මහතාට විරුද් ධව ඉදිරිපත් කර තිබෙන චෝදනා මේ විධියට සඳහන් කර තිබෙනවා. ඒ ඉදිරි පත් කර තිබෙන චෝදනා 5 මා දැන් කියවන්නම් :

"1. සමිතියේ "කුලී නිවාස ක්‍රමය" අනුව ඉඩම් ලබාගත් දෙදෙනෙකි. එයින් එවකට ලේකම්ව සිටි කේ. ඒ. පෙරේරා මහතා එක්කෙනෙකි. ඔහු ලබා ගත් කුලී නිවාසය සඳහා රුපියල් 15,000 ක මුද ලක් ඉඩම් අයිතිකරුට ගෙවා රුපියල් 25,000 කට ඔප්පුවක් ලියවා ගෙන ඇත........."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ කියවන්නේ සමුපකාර උප කොමසාරිස් තුමා විසින් ඔහුට විරුද්ධව කර තිබෙන චෝදනායි.

"........මෙහි නියම තත්ත්වය නොපහදා වැඩි වටිනාකමක් ඔප්පුවේ සඳහන් කරවා ගැනීම වරදකි. මෙවැනි කුලී නිවාසයක් ලබා ගත් ඇම්. ඒ. චන්ද්‍රසේකර මහතාගෙන් ලබා ගෙන තිබෙන්නේ පොරොන්දු සිත්තක්කර ඔප්පුවය. මෙයද වැරදිය. නිවාස ක්‍රමය යටතේ ඉඩම සමිතිය සතු විය යුතුයි. එහි කුලිය නිසියාකාර ගෙව්වායින් පසුවයි ඔහුට ඉඩම හා නිවාසය හැරවිය යුත්තේ.

2. මෙම නිවාස ක්‍රමය අනුව මෙම ඉඩම් ගැනීම තිරණය කරගත් කාරක සභාවට පැමිණි සිටි කාරක සභිකයන් 4 දෙනාගෙන් මොහුද එක්කෙනෙකි. අතුරු ව්‍යවස්ථා අනුව 3 දෙනෙකු සහභාගිවීම සෑහෙන නමුත් මෙවැනි තීරණයක් ගැනීම සියළුම කාරක සභිකයන්ට දැන්නුවාදැයි සැක සහිතය. තවද තමා ගැන තීරණයක් ගැනීමේදී එම කාරක සභාවට සහභාගිවීම සුදුසු නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3. සමුපකාර සමිති පිළිබඳ ආඥා පණත අනුව පන වන ලද නියෝග මාලාවේ 37 වෙනි වගන්තිය ප්‍රකාර සමිතියට ඉඩම් අත් කර ගැනීමේදී මහා සභාවේ හා මගේ පූර්ව අනුමැතිය අවශ්‍යව තිබියදී එසේ නොලබා මෙම ඉඩම් දෙක සමිතිය සතු කර ගැන්ම වරදකි.

4. තමා ගත් කුලී නිවාසය සඳහා සමිතිය විසින් රු. 15,000 ක් ගෙවා තිබේ. ඒ සඳහා රුපියල් 166.54 ක් මාසික කුලිය වශයෙන් ඔහු ගෙවිය යුතුයි. එසේ තිබියදී කුලී හරි හැටි නොගෙවීම නිසා රුපියල් 1,000 ක පමණ මුදලක් අතපසු වීම.

5. දීමනා අත්තිකාරම් යන නමින් රු. 5,000 ක මුදලක් අතුරු ව්‍යවස්ථාවන්ට සහ කෘත්‍යාධිකාරී නියෝගවලට විරුද්ධව ගෙන තිබේ. මෙවැනි අත්තිකාරම් මුදලක් ගැනීමට අවසරයක් ව්‍යවස්ථාවල නැත. සාමාජිකයෙකු වශයෙන් රු. 2,000 ක ණය මුදලක් ගත හැක. මේ සීමාවද ඉක්මවා මේ මුදල ගෙන එය මාස්පතා ආපසු ගෙවීම පැහැර හැර තිබෙන නිසා කල් පසු වූ මුදල් ප්‍රමාණය රු. 1,700 ක් පමණි.

නොමනා පාලනය නිසා කාරක සභාව විසුරුවා හරින කාලයේ දී ද මොහු සමිතියේ ලේකම් වශයෙන් කටයුතු කර තිබියදී සමිතියේ සේවයට නැවතත් යොදා ගැනීම නුවණට හුරු කරුණක් නොවේ.

එම නිසා මේ ගැන වහාම කටයුතු කර මට දන්වන්න.

අ/ක. ඩී. සමරනායක,
ස.සං. උප. කො. කොළඹ."

මේ විධියට නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා ලංගම ශුභසාධක සමිතියේ සිදු වන වැරදි ක්‍රියා ගැන කරුණු විමසා තිබෙනවා. මෙම වැරදි ක්‍රියා ගැන නම් හදිසි නීතිය පාවිච්චි කර නැහැ. එම නිසා මෙම සමිතියේ තත්ත්වය සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කර එහි නියම තත්ත්වය ප්‍රකාශ කරන හැටියට මා ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මීට වඩා දීර්ඝ වශයෙන් තමුන්නාන්සේගේ කාලය ගැනීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන්, සමුපකාර සමිතිවල ප්‍රජාතන්ත්‍රවාදී පාලනය නැති කර දමා හදිසි නීති යටතේ කර ඇති වැරදි ක්‍රියා තව දුරටත් එසේම ගෙන යන්නට—තව අවුරුදු 4 ක් ඉදිරියට ගෙන යන්නට—අවස්ථාව ලැබෙන පරිදි ඉදිරිපත් කර ඇති මෙම පනත සාධාරණ පනතක් හැටියට පිළිගන්නට බැරි නිසා එයට මගේ විරෝධය ප්‍රකාශ කරන අතර, යම් යම් හේතූන් නිසා සමුපකාර සමිතිවල කාය්‍යී මණ්ඩල විසුරුවා හැර පාලක මණ්ඩල පත් කිරීමට දැනටමත් සමුපකාර රෙජිස්ට්‍රාර්වරයාට දී ඇති බලය පවා ප්‍රජාතන්ත්‍ර විරෝධි නිසා එම ව්‍යවස්ථා වෙනස් කිරීමටද කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.40

**ටී. බී. සුබසිංහ මයා.** (කටුගම්පොළ)
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම සංශෝධන පනත සම්බන්ධව මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් රාශියක් ප්‍රකාශ කර තිබෙන නිසා ඒ සෑම දෙයක්ම මා නැවත වරක් කියා පාන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් මටත් වැටහෙන පිළිවෙළට සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුයයි මට කල්පනා වුණා.

මෙම පනත ඉදිරිපත් කරන්නට හේතුව වූයේ පසු ගිය මැතිවරණයෙන් පසුව ආණ්ඩුව විසින් හදිසියේ එළඹුණ යම් යම් තීරණ උඩ ගත් යම් යම් වැඩපිළිවෙළවල් තව තවත් සාර්ථක කරගැනීමටයි. පසුගිය මහා මැතිවරණයෙන් පසුව සමහර තැන්වල තිබුණු සමුපකාර සංගම් ආදිය ආණ්ඩුව අතට ගත්තා. මට කලින් කථා කළ මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කීවාක් මෙන් මහජනයා විසින් ප්‍රජාතන්ත්‍රවාදය අනුව කටයුතු කරමින් තෝරා ගන්නා ලද කාරකසභා විසුරුවා හැර සමුපකාර සංගම් ආණ්ඩුව අතට ගත්තා. පසු ගිය අවුරුදු තුන හමාර තිස්සේම ඒ විධියට කටයුතු කරගෙන ගොස් තිබෙනවා. ආණ්ඩුවේ වෙනත් කටයුතුවල යෙදී සිටින නිලධාරීන් දෙතුන් දෙනකු යටතේ ඒ සමුපකාර සංගම් ක්‍රියා කරගෙන ගොස් තිබෙනවා. මේ සංශෝධන පනතින් අදහස් කරන්නේ ඒ වැඩ පිළිවෙළ තව කාලයක් තිස්සේ පවත්වාගෙන යෑමට කටයුතු සකස් කර ගැනීමයි. සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ඇති ප්‍රතිපත්තිවල වෙනසක් ඇති කරන්නට ගරු ඇමතිවරයාට වුවමනාව තිබුණා නම් ඉකුත් අවුරුදු තුන හමාර තුළ එය කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

පුළුවන්කම තිබුණා. අපේ ආර්ථික දියුණුවට ප්‍රයෝජනවත් වන ආකාරයට ඒ මුළු ව්‍යාපාරයම ප්‍රතිසංවිධානය කිරීම සඳහා ක්‍රියා මාර්ගයක් සකස් කිරීමට පසුගිය කාලය තුළ ගරු ඇමතිතුමාට පුළුවන්කම තිබුණත් ඒ කාලය තුළ ඒ සම්බන්ධයෙන් කිසිවක් කෙළේ නැහැ. අවුරුදු තුනහමාරක් තිස්සේම ඒ තාවකාලික පිළියම ක්‍රියාත්මක කර දැන් එය ස්ථිර ක්‍රියා මාර්ගයක් බවට පත් කරන්නට උත්සාහ කරනවා මිස සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කරන්නට ඇමතිවරයාට පුළුවන්කමක් ලැබී නැහැ. ඇමතිවරයාගේ යුතුකමව තිබුණේ හැකි තරම් ඉක්මනට සමුපකාර ව්‍යාපාරය පිළිබඳව හොඳ පරීක්ෂණයක් පවත්වා, රටට සේවයක් වන ආකාරයට ඒ ව්‍යාපාරය හැඩගස්වා ගැනීමයි. දැනට පවත්වාගෙන යන ආකාරයට සමුපකාර සංගම්වල කටයුතු පවත්වාගෙන යැමෙන් නම් ඇමතිවරයා බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වේතැයි මා හිතන්නේ නැහැ.

මුළු කාලය තිස්සේම ආණ්ඩුවේ ඒ ඒ දෙපාර්තමේන්තුවල වගකීම් සහිත කටයුතුවල යෙදී සිටින ආණ්ඩුවේ නිලධාරීන්ට අවුරුදු පතා රුපියල් දශ ලක්ෂ ගණනින් වෙළඳහෙළඳාම් කෙරෙන සංවිධානවල පාලනය භාර දුන්නාට ඇත්තෙන්ම ඒ කටයුතු ගැන හරියාකාර ලෙස පරීක්ෂාකාරීව කටයුතු කරන්නට ඒ අයට පුළුවන්කමක් නැහැ. නිලධාරි පාලනය ඇති වීම නිසා දැන් සමුපකාර සමිති එන්න එන්නම මහජනයාගෙන් ඈත් වෙමින් පවතිනවා. ඒවා නිලධාරීන්ට වුවමනා විධියට කටයුතු කරන හිතුවක්කාර සංවිධාන බවට පත් වෙමින් පවතිනවා. මේ සංගම්වලින් අයුතු ප්‍රයෝජන ලබා ගන්නට නිලධාරීන්ට පුළුවනි. මේ තත්ත්වය දිගින් දිගටම පැවතුණහොත් සිදු වන්නේ ඒකයි.

අපේ සමුපකාර ව්‍යාපාරයෙහි නොයෙකුත් දුර්වලකම් තිබෙනවා. අපේ මහජනයා තුළ සාමාන්‍යයෙන් තිබෙන දුර්වලකම් ඒ ව්‍යාපාරයටත් බලපා තිබෙනවා. සාමාජිකයන්ගේ ඡන්දයෙන් කොපමණ කාරකසභා පත් කර ගත්තත් ඒ කාරක සභාවල අඩුපාඩු තිබෙන්නට පුළුවනි. ඒ කාරක සභාවල සිටින සමහර අය වංක වන්නට පුළුවනි. ඒ වාගේම ඒ අයට වෙළෙඳ ව්‍යාපාර පිළිබඳව පළපුරුද්දක් නැති වන්නට පුළුවනි. ඒ අතරම ඒ සමුපකාර සමිතිවල කටයුතු පළල් ලෙස ගොඩනැඟී එන විට ඒවා පාලනය කරන්නට ඒ අයට ශක්තියක් නැති වන්නට පුළුවනි. ආණ්ඩුව විසින් අද දින ක්‍රියාත්මක කරනු ලබන යම් යම් ප්‍රතිපත්ති නිසාත් සමුපකාර ව්‍යාපාරයට හානි වී තිබෙනවා වන්නට පුළුවනි. ඉතින් දුර්වලකම් රාශියක් නිසා සමුපකාර ව්‍යාපාරයට පහර වැදී තිබෙනවා නම් ඒ දුර්වලකම් මැකීම සඳහා ආණ්ඩුවේ නිලධාරීන්ට එය භාර දීම යුතුකමෙකැයි මා හිතන්නේ නැහැ. අඩු පාඩුකම් හරි ගස්සාගෙන නියම මහජන ව්‍යාපාරයක් හැටියට එය පරිවර්තනය කර ගන්නට මාර්ගයක් අප සොයා ගන්නට ඕනෑ.

මේ රටේ සමුපකාර ව්‍යාපාරය දැනට අවුරුදු හතළිහක් පණහක් පමණ පැරණියයි මා හිතනවා. මුලදී ආරම්භ කරන ලද්දේ සමුපකාර ක්‍රමයට ණය දෙන සමිතියි. තැන් තැන්වල ඒ සමිති ආරම්භ වුණා. කාලයක් ගත වන විට මෙය පළල් වන්නට පටන් ගත්තා. මෙහි ඉතිහාසය දීර්ඝ වශයෙන් කියන්නට අවශ්‍යතාවක් නැහැ. පසුගිය යුද්ධ කාලයේදී ඇති වූ ආහාර හිඟය නිසා පිටරටින් ලැබුණු සීමා සහිත ආහාර ප්‍රමාණය මහජනයා අතර සාධාරණ අන්දමින් බෙදා හැරීමේ මාර්ගයක් හැටියටයි, අප පාරිභෝගික සමුපකාර ව්‍යාපාරය ඇති කෙළේ. යුද්ධ කාලයේදී සෑම ගමක් පාසාම ඒ සමුපකාර සමිති පැතිරෙන්නට පටන් ගත්තා. මොන අඩු පාඩුකම් තිබුණත් ආහාර අතින් අගහිඟකම් පැවති ඒ කාලයේදී ලැබුණු සීමාසහිත පාරිභෝගික භාණ්ඩ සෑහෙන ප්‍රමාණයට වත් බෙදා හැරීමට එම ව්‍යාපාරය ආධාර වුණා. මෙහෙම කලක් යන කොට, මෙම ව්‍යාපාරය නොයෙක් අංශවලට, පාරිභෝගික අංශයට පමණක් නොවෙයි අනිකුත් අංශවලටත්, පැතිර ගියා. ගොවිකම් අංශය, ඒ වාගේම නිෂ්පාදකයින්ගේ සමිති, මේ ආදී අංශයන් තව තවත් ආරම්භ වන විට, අපට මතකයි, එවකට ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමතිවරයාව සිටි වර්තමාන දකුණු කොළඹ මන්ත්‍රීතුමා (ගරු ජේ. ආර්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයවර්ධන) මෙම ගරු සභාවේම මන්ත්‍රී වරුන්ගෙන් යුත් විශේෂ කාරක සභාවක් පත් කළ බව, මෙම ප්‍රශ්නය සම්බන්ධ යෙන් සම්පූර්ණයෙන්ම පරීක්ෂා කර බලා, විග්‍රහ කර බලා, යම් යම් නිර්දේශ යත් කිරීමට. සමුපකාර සමිති සංගම්වල කටයුතු ගැන උනන්දුවක් දැක්වූ මන්ත්‍රී වරුන් කීප පොළක්ම මෙම කාරක සභා වට පත් කරනු ලැබීමෙන් පසු, එම නියෝජිතයන් රට පුරා ඇවිද නොයෙකුත් අය ගෙන් සාක්ෂි විමසා, කරුණු සොයා බලා ක්‍රියා කර ගෙන යන විට තමයි, එවකට තිබූ පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ.

ඊට පසු එයින් වැඩක් වුණේ නැහැ, කලින් තිබුණු පිළිවෙළටම ක්‍රමයෙන් සංවර්ධනය වන්නට පටන් ගත්තා. මෙසේ කටයුතු කර ගෙන යන අවස්ථාවේදී වර්තමාන කර්මාන්ත ඇමතිතුමා, එවකට ආහාර ඇමතිවරයා වශයෙන් සිටියදී මෙහි එක්තරා වෙනසක් කළා, අලුත් වැඩ පිළිවෙළක් ආරම්භ කළා. එනම් මෙම සංවිධාන විවිධ සේවා සමුපකාර සමිති හැටියට පරිවර්තනය කිරීමයි. මෙම ව්‍යාපාරය විවිධ සේවා සමුපකාරය හැටියට පරිවර්තනය කිරීම ඉතාම ප්‍රගතිශීලී පියවරක් හැටියට මා කල්පනා කරනවා. මන්ද? ගම්බද ජනතාවගේ වැඩ කටයුතුවලට සම්බන්ධ විය හැකි, ඒ අයට සේවය කළ හැකි සංවිධාන හැටියට මෙම විවිධ සේවා සමුපකාර සමිති සකස් කළ හැකි නිසයි. ගැමි ජනතාවට සම්බන්ධ වන සෑම අංශයක්ම, නිෂ්පාදනය, බෙදා හැරීම, ආදී සෑම සේවාවක්ම මෙමගින් ඉටු කළ හැකි වන පරිදි, සියල්ලක්ම එකට සම්බන්ධ කර කටයුතු ගෙන යා හැකි පරිදි මෙය සංවිධාන කළ යුතුයයි මා කල්පනා කරනවා. එම නිසයි, සමුපකාර ප්‍රතිපත්තිය ඉතා හොඳ ප්‍රතිපත්තියක් හැටියට මා කල්පනා කරන්නේ. නමුත් එදා සිටම තිබුණු අඩුපාඩුව නම් මේ සමිති සමාගම් ඉතාමත්ම කුඩා වීමයි. බල ප්‍රදේශ සීමා සහිත නිසා, සෑම ගමකම පාහේ කුඩා සමිති ආරම්භ කිරීමෙන් එයින් බලාපොරොත්තු වුණු පරමාර්ථයන් ඉෂ්ට කර ගන්න පුළුවන් වුණේ නැහැ. මේ හේතුව නිසා බොහෝ සමිති පවත්වාගෙන යන්න බැරුව නවතින් වී ගියා. ඒ කෙසේ වුණත් දැනට මෙවැනි කුඩා සමිති රාශියක්ම තිබෙනවා, ඒවායින් විශාල සේවයක් කෙරෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සමුපකාර සමිතිවල විවිධ සේවා ස්වරූපය ආරක්ෂා කරමින් එම සමිතිවලට දැනට වඩා විශාල බල ප්‍රදේශයක ක්‍රියාත්මක කිරීමට හැකි වන අන්දමින් බලප්‍රදේශ පුළුල් කිරීමේ වැඩ පිළිවෙළක් ඇමතිතුමා විසින් වහාම ක්‍රියාත්මක කළ යුතුය කියා මා කල්පනා කරනවා. ඒ වාගේම කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදා හැරීම, පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම, ණය සැපයීම ආදී නොයෙකුත් සේවාවන් ඉටු කිරීමට හැකි වන අයුරින්, මෙම සමිති මධ්‍යගත වන අයුරින්, පුළුල් ලෙස සමුපකාර සංවිධාන ඇති කිරීම ඉතාමත්ම අවශ්‍ය කරුණක් බව පෙන්නා දීමට කැමතියි.

මෙහිදී එක්තරා ප්‍රශ්නයක් මතු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අත්දැකීම්වලින්ම ප්‍රත්‍යක්ෂ වී තිබෙනවා, අපේ සමහර සමිති පුළුල් වන්න වන්න, විශාල වන්න වන්න, ගනුදෙනු ආදිය වැඩි වන්න වන්න, පාලනයෙහි නොයෙකුත් අඩුපාඩුකම් ඇති වී තිබෙන බව. සමහරවිට ඒ අන්දමට විශාල සංවිධාන ඇති කරනවා නම්. ඒ ප්‍රදේශයේ සිටින උදවිය ස්වේච්ඡා සේවකයන් හැටියට තම මුළුකාලයම එම වැඩ කටයුතු සඳහා ඒවායේ පාලන කටයුතු සඳහා යොදවා විය, ඒ වාට සහභාගි වේය කියා අපට කිසිසේත් බලාපොරොත්තු වන්න බැහැ. ඒ වාගේම වෙළඳ ව්‍යාපාර හැටියට, නිෂ්පාදන ව්‍යාපාර හැටියට එම සංවිධාන විශාල වන විට, ගම්වල සිටින, මෙම සමිතිවල වැඩ කටයුතුවලට සම්බන්ධව වැඩ කරන සෑම දෙනකුටම, ඉතා දක්ෂ ලෙස, නවීන ක්‍රම අනුව ඒවායේ පරිපාලන කටයුතු ගෙන යන්න පුළුවන්කමක් ඇති වේය කියා අපට සිතන්න බැහැ. එහෙම නම් මේ අන්දමට සංවිධාන කිරීමේදී අලුත් මාර්ගයන් ගැන සැලකිල්ල යොමු කළ යුතුව තිබෙනවා. එම නිසා රජයේ නියෝජිතයන් සහ මහජන නියෝජිතයන් යන දෙගොල්ලන්ම එකට සම්බන්ධ කරගෙන පරිපාලන කටයුතු ගෙන යෑමට හැකි අයුරින් මේවා සකස් කිරීම යහපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

බවයි මගේ විශ්වාසය. ජනතාවගේ නියෝජිතයන්ගේ මාර්ගයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් එක් පැත්තකින් ආරක්ෂා කෙරෙන අතර, අනික් අතින් රජයේ නියෝජිතයන්ගේ මාර්ගයෙන් මෙහි පරිපාලන කටයුතු ක්‍රියාශීලී ලෙස කර ගෙන යාමට අවකාශ සලසා දීම ප්‍රයෝජනවත් යයි මා කල්පනා කරනවා. එම නිසා මුළු කාලයම එවායේ වැඩ කටයුතුවලට යෙදීමට හැකි දක්ෂ, පළපුරුදුකම් ඇති නිලධාරීන් විධායක නිලධාරීන් වශයෙන් ආණ්ඩුව මගින් පත් කිරීමෙන් එක් පැත්තකින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තියත්, අනික් පැත්තෙන් දක්ෂ පරිපාලනයත් යන දෙකම එකට සම්බන්ධ කර මෙහි වැඩ කටයුතු කර ගෙන යා හැකි වැඩ පිළිවෙළක් යෙදීම වඩාත්ම හොඳ යයි මා කල්පනා කරනවා.

අනෙක් කාරණය, අද රටේ සෑම තැනකම පාහේ සමුපකාර සමිති පිහිටුවා තිබෙන අතර, තරුණ තරුණියන් රාශියක් ඒවායේ සේවය කරනවා. ඒ සමුපකාර සමිතිවල සේවය කරන උදවිය, "සමස්ත ලංකා සමුපකාර සේවකයන්ගේ වෘත්තීය සමිතිය" යනුවෙන් වෘත්තීය සමිතියක් පිහිටුවාගෙන තිබෙනවා. ඔවුන්ගේ එක ඉල්ලීමක්, ඒ ඒ සමුපකාර සමිති සංගම්වල සේවයේ යෙදී සිටින්නන්ට සේවා ස්ථිරත්වය ලබා දීම. අද ඒ ඒ සමුපකාර සමිතිවල නිලධාරීන්ගේ කැමැත්ත අනුව කොන්දේසි හා වේතන නියම කර තිබෙන නිසා, සමුපකාර සේවකයන්ට කිසිම සුරක්ෂිත භාවයක් ඇත්තේ නැහැ; සමාන වැටුප් ක්‍රමයක් ඇත්තේ නැහැ. එම නිසා ඒ පිළිබඳ ප්‍රතිසංවිධානයක් කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම, ගම්බද ප්‍රදේශවල ගොවිතැන දියුණු කිරීමට හා සුළු කර්මාන්ත දියුණු කිරීමටත් සමුපකාරය ඉතා වැදගත් මාධ්‍යයක් කර ගන්නට පුළුවනි. එහෙත් අවාසනාවකට මෙන්, සමුපකාර ව්‍යාපාරය ලංකාවේ මුල් බැසගෙන අවුරුදු හතළිහක් පණහක් පමණ ගත වී ඇතත්, තවම සමුපකාර ව්‍යාපාරයෙන් සම්පූර්ණ සේවයක් සිදු වන්නේ නැහැ. එසේම, සමුපකාරය හා ගැමි ජනතාව අතර කිට්ටු සම්බන්ධයක් තිබෙන බවකුත් කියන්නට බැහැ. සාමාන්‍ය සාමාජිකයන් හා නිලධාරීන් අතර කිට්ටු සම්බන්ධයක් නැතිකම නිසා, සමුපකාර ව්‍යාපාරය මහජනතාවගෙන් ඈත් වී තිබෙන බවක් පෙනෙන්නට තිබෙනවා. මෙවැනි දේවල් පරීක්ෂා කර බැලීම සඳහා ඉතා ඉක්මණින් වැඩ පිළිවෙළක් යෙදීම ඉතාමත් වැදගත්. සමුපකාර කටයුතු සම්බන්ධයෙන් කොමිසමක් පත් කළාලු. එහි වැඩ ආරම්භ කර තිබෙනවාදැයි මා දන්නේ නැහැ. වරක් පත් කළ සභාපතිවරයා අස් වුණා. නැවතත් ඔහුම පත් කර තිබෙනවාදැයි දන්නේ නැහැ. එහෙත් දැනටමත් ඒ පිළිබඳ කටයුතු පමා වී තිබෙනවා.

ප්‍රතිඵල කෙසේ වෙතත්, ආහාර වගාව සම්බන්ධයෙන් කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විශාල ක්‍රියා මාර්ගයක් ගෙන යනවා. එහෙත් ඒ වැඩ පිළිවෙළ සමුපකාර ව්‍යාපාරයට කොපමණ දුරට සම්බන්ධ කරගෙන තිබෙනවාදැයි මා දැන ගන්න කැමතියි. වී මිළ දී ගැනීමට, පොහොර බෙදා හැරීමට, ආණ්ඩුවේ ඒජන්තවරුන් සම්බන්ධ කර ගෙන තිබෙන බව අප දන්නවා. එහෙත් ගැමි ජනතාවගේ නිෂ්පාදන කටයුතුවලට සමුපකාරය සම්බන්ධ කර ගැනීමේ සැලැස්මක් සකස් කර නැහැ. ඔවුන්ගේ නිෂ්පාදන කටයුතුවලට සමුපකාරයත් සම්බන්ධ කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් ගැමියන් මීට වඩා උනන්දුවෙන් ඒ කටයුතුවල යෙදෙන බවට කිසිම සැකයක් නැහැ.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කීවා වාගේ, දූෂණයන් තිබුණු සමුපකාර සමිති පමණක්ම නොවේ, රජයේ පාලනය යටතට ගත්තේ. නොයෙකුත් දේශපාලන හේතු උඩත්, සමහර සමුපකාර සමිතිවල පාලනය රජය අතට ගත්තා. ඇමතිතුමා තුළ පහළ වූ හදිසි චේතනා උඩ ඒ සමුපකාර සමිතිවල පාලනය රජය අතට ගත්තත්, ඒවා පුළුවන් තරම් ඉක්මනින් මහජනයා අතටම පවරනවා විනා සදාකාලිකව රජය අතේම තබා ගැනීමට කටයුතු නොකරනු ඇතැයි මා විශ්වාස කරනවා. රජයේ නිලධාරීන් දෙතුන් දෙනකුට ඒ සමිතිවල කටයුතු වෙනුවෙන් සම්පූර්ණ කාලය යොදා කටයුතු කරන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඔවුන්ගේ පාලනය යටතේ ඒ සමිති සාර්ථක ලෙස පවත්වා ගෙන යන්නට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන මා තවත් කරුණු එකක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. අද මේ රටේ සමුප කාර ව්‍යාපාරය නිෂ්පාදන අංශයට වඩා පාරි භෝගක අංශයටයි බර වී තිබෙන්නේ. එසේහෙයින් ඒවායේ දියුණුව රඳා පවත් නේ සමුපකාර සමිති මාරගයෙන් කර ගෙන යන වෙළඳාම් අනුවයි. එහෙත් අද ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද? අද රටේ ආහාර හිගයක් තිබෙනවා. අද පිට රටින් ගෙන්වන හෝ මේ රටේ නිෂ්පාදන ය කරන බඩු බාහිරාදිය පාරිභෝගිකයන්ට ලැබෙන්නේ එදාට වඩා සීමා සහිතවයි. එම බඩු සීමා සහිත වන විට ඒවා සාධාරණ අන්දමින් බෙදා හරින්නට සුදුසු මාර්ග යෙදීමට රජයට යුතුමක් තිබෙනවා. පසුගිය යුද්ධ සමයේදී සමුපකාර ව්‍යාපාරය පාරි භෝගික අංශයක් හැටියට පවත්වාගෙන යන්නට මූලික හේතුව වූයේ, රටට ලැබෙන සීමා සහිත බඩු ප්‍රමාණය සාධාරණ පරිදි බෙදා හැරීම සඳහා බව මා මුලින්ද සඳහන් කරන්නට යෙදුණා. අදත් මේ රටේ බඩු හිගයක් තිබෙනවා. එහෙත් අද සාධාරණ අන්දමින් බඩු බෙදා හරින්නට සමුපකාර ව්‍යාපාරය උපයෝගි කර ගන්නේ නැහැ. [බාධාකිරීමක්]

ගරු ඇමතිතුමා නම් කියන්නේ සාධාරණ අන්දමින් බඩු බෙදා හරින බවයි. එතුමා කියන්නේ සලාක පොත් ක්‍රමයට අවුන්ස ගණනින් බඩු බෙදා හැරීම ගැන වෙන්නට ඇති. මා කියන්නේ ඒ ගැන නොවෙයි. සීමා සහිත බඩු ප්‍රමාණයක් රටට ලැබෙන හෙයින් එම බඩු සාධාරණ පරිදි බෙදා හැර මහජන වුවමනා එපාකම් පිරි මසාලීමට රජය බලාපොරොත්තු වෙනවා නම් රජය විසින් කළ යුතු පළමුවෙනි කර්තව්‍යය විය යුත්තේ, ලැබෙන්නාවූ සීමා සහිත බඩු ප්‍රමාණය සාධාරණ මිලට බෙදා හැරීම සඳහා හැකි පමණ මාර්ග සැලසීමයි.

එහෙත් දේශපාලන හේතුන් වැනි දේ නිසා මේ රජය එම බෙදාහැරීම කොටස් දෙකකට දෙන්නට තීරණය කර තිබෙන වා. අවශ්‍ය කරන අඩුම බඩු ප්‍රමාණය සමුප කාර ආයතනය මගින් බෙදා හරින්නටත් ඊට වැඩි ප්‍රමාණයක් පුද්ගලික තොග වෙළෙන්දන්ගේ මාර්ගයෙන් බෙදා හරින් නටත්. මේ අය කටයුතු යොදා තිබෙනවා. ඒ හේතුකොටගෙන අද ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද? සීමා සහිත බඩු ප්‍රමාණයක් සමුපකාර සංවිධානවලට ලැබෙනවා. සලාක ක්‍රමයට ඒවා ඒ මාරග යෙන් බෙදා හරිනවා. එම නිසා වර්ෂයක් පාසා ඒ සමිති මගින් කරගෙන යන වෙළ දාම විශාල අන්දමින් පහත වැටී තිබෙන වා. අද එම සමිති පවත්වාගෙන යන්නට බැරි තරම් තත්ත්වයකටයි වැටී තිබෙන් නේ.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*
(Mr. Lakshman Jayakody—Divulapitiya)
බංකොළොත්.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
ඔව්.

රටට ලැබෙන සීමා සහිත බඩු ප්‍රමාණ යෙන් වැඩි කොටසක් පුද්ගලික තොග වෙළෙන්දන් මාර්ගයෙන් බෙදා හැරීම නිසා අනවශ්‍ය අසාධාරණ බ්ලැක් මාකට් එකක් ඇති වී තිබෙනවා. මෙයින් පෙනෙ නවා එක පැත්තකින් ආණ්ඩුවේ නියම මිලට අවුන්ස ගණනින් බඩු බෙදා හරින අතර, අනික් පැත්තෙන් වැඩි ප්‍රමාණයක් බඩු වර්ග බ්ලැක් මාකට් පිළිවෙළට ඉතා අසාධාරණ මිල ගණන්වලට පුද්ගලික තොග වෙළෙන්දන්ගේ මාර්ගයෙන් බෙදා හරින බව. ඒ ක්‍රම දෙක අතර සට්ටන යක් තිබෙනවා. මෙන්න මේ සට්ටනය මැඩී මට නම්, සාධාරණ පිළිවෙළට බඩු බෙදා හරින්නට නම්, සමුපකාර ආයතනය තොග වශයෙන් බඩු බෙදා හැරීමේ ආයතන යක් කිරීම අත්‍යවශ්‍යයයි. ඒ වාගේම මේ රටේ සමුපකාර ව්‍යාපාරය බිඳ නොවැටෙන් නට නම් මීට වඩා වෙළඳ ද්‍රව්‍ය සමුපකාර ව්‍යාපාරයට සපයන්නට මාර්ග සකස් කළ යුතුයි. මීට කලින් සාර්ථක ලෙස පවත්වා ගෙන ආ සමුපකාර සමිති අද වැනෙන සුළු තත්ත්වයකට පත් වී තිබෙනවා. ඒවා අද පවත්වාගෙන යන්නේ ඉතා අමාරුවෙනයි. මේ ප්‍රශ්න ගැන කල්පනා කර වැඩ කරන් නට තවම සිතා ඇති බවක් පෙනෙන්නට නැහැ. සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ඇමති තුමා ගෙන යන ප්‍රතිපත්තිය කුමක්දැයි මා එතුමාගෙන් අහන්නට කැමතියි සමුප කාර ව්‍යාපාරය පිළිබඳව විශාල දොෂාති මෝත්තුවක් තිබෙනවා; හොඳ දක්ෂරුද නිලධාරීන් සිටිනවා. එහෙත් සමුපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

ව්‍යාපාරය පළිබඳව ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය කුමක්දැයි මා දැනගන්නට කැමතියි. මට පෙනෙන හැටියට නම් එක් දහස් නවසිය හතලිස් ගණන්වලදී සමූපකාරය පිළිබඳව පාලකයන් තුළ තිබුණු උනන්දුව අද නැහැ. යුද්ධ කාලය තුළදී ඒ පිළිබඳව පාලකයන් තුළ තිබුණු උනන්දුව අද නැහැ. ඊට පසු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු පැවති කාලයේ දීම වුණත් සමූපකාරය පිළිබඳව තිබුණු උනන්දුව අද පාලකයන් තුළ නැහැ. අද සමූපකාරය, ඕනෑ නම් තිබුනාවේ නැත්නම් වැටුනාවේ, කියන ප්‍රතිපත්තිය උඩ ගෙන යන බවයි පෙනෙන්නේ. සමූපකාරය දියුණු කිරීම පිළිබඳව අද කිසිම ප්‍රතිපත්තියක් නැහැ. ඒ දවස්වල සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කොපමණ ක්‍රියාත්මක වුණාද කියා මට මතකයි. දෙපාර්තමේන්තුවල නිලධාරීන් සමූපකාර සමිති සමග කොයි තරම් කිට්ටු සම්බන්ධතාවක් ඇතිව කටයුතු කළාද කියා මට මතකයි. ඒ තත්ත්වය අද නැහැ. අද විශාල දෙපාර්තමේන්තු එක පැත්තකින් තිබෙනවා; අනෙක් පැත්තෙන් සමූපකාර සමිති වැනෙනවා. මේ තත්ත්වය නැති කිරීමට වහාම වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. මේ සංශෝධනයෙන් වැඩක් වන්නෙ නැහැ. ඩී.ආර්.ඕ. මහත්වරුන් දෙතුන් දෙනකු පත්කර කවදාවත් මේවා සංවර්ධනය කරන්නට බැහැ. පුළුවන් තරම් ඉක්මනට මේවා මහජනයාට පවරා දී මහජනයා අතර තිබෙන අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව සලසන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.5

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)

*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*

(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මෙහි සාකච්ඡාවට භාජන කර තිබෙන සමපකාර (තාවකාලික විධිවිධාන) පනත පිළිබඳව මාත් වචන සවල්පයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවේදී සමූපකාර ව්‍යාපාරයේ ඉතිහාසය ගැන දීර්ඝ වශයෙන් සඳහන් කිරීම අවශ්‍ය නැතැයි මා සිතනවා. මගේ අත්දැකීම් අනුව කරුණු දෙක තුනක් පමණක් ඉදිරිපත් කිරීමටයි, මා බලාපොරොත්තු වන්නේ.

නොයෙක් විට සමූපකාර සංගම්වල කාරක සභා අවලංගු වන්නේ දූෂණය නිසා නැත්නම් අදක්ෂ පාලනය නිසයි. මේ හේතු දෙක නිසා කාරක සභා අවලංගු කර ඒවායේ පාලනය තමුන්නාන්සේ පාලන මණ්ඩලයකට භාර දෙනවා නම් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. ඇත්ත වශයෙන්ම සමූපකාර ව්‍යාපාරය දූෂණයෙන් තොරව, අදක්ෂ පාලනයෙන් තොරව ගෙන යාමට නම්, එවැනි බලතල තමුන්නාන්සේගේ අතේ තිබෙන්නට ඕනෑ. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් මෑත ඉතිහාසයේ නොයෙක් අවස්ථාවලදී අපට පෙනී ගොස් තිබෙනවා, නොයෙක් තැන්වල සමූපකාර සංගම්වල කාරක සභා දේශපාලන හේතූන් නිසා අහෝසි වී තිබෙන බව. ඒක නම් ඉතාම කණගාටු දායක කරුණක්. අප දේශපාලන හේතුය කිවාට තමුන්නාන්සේ සමහරවිට එය පිළිගන්නෙ නැහැ. මෙවැනි පක්ෂ ආණ්ඩු ක්‍රමයක් තිබෙන විට එය ස්වාභාවිකවම සිදු වන දෙයක්. අපේ පැත්තෙන් ඕවා කිව්වම තමුන්නාන්සේලා පිළිගන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පැත්තෙන් ඕවා කිව්වම අප පිළිගන්නෙ නැහැ.

මේ සම්බන්ධයෙන් ටිකක් සෝදිසි කළ විට අපට පෙනී යනවා, ඇත්ත වශයෙන්ම දූෂණයන්ගෙන් පිරුණු කාරක සභා අවලංගු කර නැති බව. සමහර තැන්වල දූෂණයෙන් පිරුණු කාරක සභා අවලංගු වී නැත්තේ ඒ ප්‍රදේශවල තිබෙන දේශපාලන බලපෑම් නිසයි. මා මේ ගරු ඇමතිතුමාට චෝදනා කරනවා නොවෙයි. එක එක මට්ටම්වලින් දේශපාලන බලපෑම් එනවා. නොයෙකුත් කූට මාර්ගවලින් දේශපාලන බලපෑම් එනවා. සමූපකාර සමිති ආඥාපනතේ 43 වැනි වගන්තිය යටතේ තමුන්නාන්සේට පැවරෙන බලතල ඉතාම කල්පනාකාරිව පාවිච්චි කරන්නට ඕනෑ. මේ චෝදනා ඉදිරිපත් වී තිබෙන්නේ ඇත්ත වශයෙන්ම අදක්ෂ පාලනය නිසා හෝ දූෂණය නිසාද, එසේ නැත්නම් දේශපාලන බලපෑම් නිසාද කියා සොයා බලා ඒ බලතල පාවිච්චි කරන්නට ඕනෑ. සමහර තැන්වල, මා කීවාක් මෙන්, දූෂණයෙන් පිරුණු කාරක සභාවලට, අදක්ෂ පාලනයෙන් යුත් කාරක සභාවලට ආණ්ඩු පක්ෂයේ බලපෑම නිසා—මා කියන්නේ නැහැ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නමුත් නාන්සේලාගේ පක්ෂයේ පමණක්ය කියා—අපේ කාලයේදීත් ඔවැනි දේවල් සිද්ධ වුණා—ඒ හැටියටම නවදුරටත් කටයුතු කරගෙන යන්නට පුළුවන් තත්ත්වයත් තිබෙනවා. නමුත් සමහර තැන්වල සුලු වැරදිවලට, ඉතාම සුලු වැරදිවලට, දේශපාලන බලපෑම් උඩ, ප්‍රදේශයේ තිබෙන දේශපාලන බලපෑම් උඩ, සමහර කාරක සභා අවලංගු කර තිබෙනවා; අහෝසි කර තිබෙනවා. එමනිසා මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් සහ ආදරයෙන් ඉල්ලීමක් කරනවා. මෑත කාලයේදී වූ සෑම සිද්ධියක් ගැනම සඳහන් කරමින් මේ ගරු සභාවේ කාලය ගත කරන්නට මා කැමති නැහැ. සුලු සුලු හේතූන් නිසා, සුලු අඩුපාඩුකම් නිසා සමහර තැන්වල මේ සමුපකාර සමිති සංගම්වල කාරක සභා අවලංගු කර තිබෙනවා. තවත් තැන්වල දූෂණයෙන් පිරී ඉතිරී ගිය අදක්ෂ පාලනය නිසා මුළු ප්‍රදේශයේම නරක නාමයක් ඇති කරගෙන තිබෙන කාරක සභාවලට එපරිද්දෙන්ම නවදුරටත් පාලනය ගෙන යන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. එමනිසා මේ 43 වන වගන්තිය ක්‍රියාත්මක කරන අවස්ථාවලදී දේශපාලනයෙන් තොරව එය ක්‍රියාත්මක කරන මෙන් මා ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

නොයෙක් තැන්වල සමුපකාර සභා අවලංගු කර තිබෙන්නේ දූෂණය නිසයි: නැත්නම් අදක්ෂ පාලනය නිසයි. මේ සමුපකාර සමිති සංගම්වල දූෂණය සහ අදක්ෂ පාලනය වන්නේ කෙසේද කියා අපි මොහොතකට කල්පනා කර බලමු. මිනුෂ්‍යයා ස්වභාව ධර්මයෙන්ම දූෂණයට පෙළෙඹෙන සුලු පුද්ගලයකුය කියා අපට මේ ප්‍රශ්නවලින් බේරෙන්නට බැහැ. ඇත්ත වශයෙන්ම මගේ කල්පනාවේ හැටියට මෙවැනි දූෂණ ඇති වන්නට ප්‍රධාන හේතුවක් තිබෙනවා. වර්තමාන කර්මාන්ත හා ධීවර ඇමතිතුමා 1958 දී එවකට සමුපකාර කටයුතු භාර ඇමතිවරයා වශයෙන් සේවය කළ කාලයේදී එක්තරා යෝජනාවක් ඉදිරිපත් කළා. අද වන තෙක් ඒ යෝජනාව ක්‍රියාත්මක වී නැහැ. එම යෝජනාව ඉදිරිපත් කර දැනට අවුරුදු දහයක් ගතවී තිබුණත් අද වන තෙක් එම යෝජනාව ක්‍රියාත්මක වී නැහැ. ඒ යෝජනාව මේ රටේ සිටින සමුපකාර සේවක පිරිස වෙනුවෙන් සමුපකාර සේවා කොමිෂන් සභාවක් පත් කිරීමයි. කළමනාකාරවරුන්, උප කළමනාකාරවරුන්, ගබඩාකරුවන්, උප ගබඩාකරුවන්, කැෂියර්වරුන්, සේල්ස්මන්වරුන්, ලිපිකරුවන්, යතුරු ලියන්නන්, ඔය ආදී වශයෙන් නොයෙකුත් තනතුරු දරණ සමුපකාර සේවක පිරිසක් මේ රටේ සිටිනවා. එම සේවක පිරිසට එක්තරා තත්ත්වයක්, සාධාරණ තත්ත්වයක් ලබා දීම පිණිස අර පළාත් පාලන සේවා කොමිෂන් සභාව වැනි සමුපකාර සේවා කොමිෂන් සභාවක් ඇති කළයුතුය කියා යෝජනාවක් ඉදිරිපත් කළා. මේ රටේ සමුපකාර ව්‍යාපාරයෙහි යෙදී සිටින සේවක සංඛ්‍යාව කොපමණද කියා මට හරියටම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නට බැහැ. සමහර විට ගරු ඇමතිතුමා මට වඩා හොඳින් ඒ සංඛ්‍යා ගැන දන්නවා ඇති. මගේ කල්පනාවේ හැටියට අඩු වශයෙන් කළමනාකරුවන්, උප කළමනාකරුවන්, ගබඩාකරුවන්, කැෂියර්වරුන්, සේල්ස්මන්වරුන්, ලිපිකරුවන්, යතුරු ලියන්නන්, ඔය ආදී වශයෙන් නොයෙකුත් තනතුරු දරමින් තිස් දහසක් පමණ දෙනා අද මේ රටේ සමුපකාර ව්‍යාපාරයෙහි නියුක්තව සිටිනවා. මේ සමුපකාර සේවක පිරිසට ස්ථිර සේවා තත්ත්වයක් සාධාරණ සේවා තත්ත්වයක් අද වන තෙක් නැහැ. මේ සේවකයින්ගේ වර්තමාන තත්ත්වය කුමක්ද? එක්කෝ සමුපකාර සමිතියේ සභාපතිට පන්දම් අල්ලන්නට ඕනෑ; නැත්නම් සමුපකාර සමිතියේ සභාපති සහ ලේකම් කරන දූෂණ සඟවන්නට ඕනෑ; නැත්නම් දූෂණයට සහ අදක්ෂ පාලනයට තමනුත් සම්බන්ධ වෙන්නට ඕනෑ. එවැනි තත්ත්වයක් අද තිබෙන්නෙ මේ රටේ සමුපකාර සේවක පිරිස ඔය සභාපතිවරුන්ගෙන්, ලේකම්වරුන්ගෙන්, නිලධාරි මණ්ඩලවලින් නිදහස් කරන්නට ඕනෑ. ඔවුන් වෙනුවෙන් අර පළාත් පාලන සේවා කොමිෂන් සභාව මෙන් සමුපකාර සේවා කොමිෂන් සභාවක් පිහිටුවා එම සේවක පිරිසේ පාලනය සම්පූර්ණයෙන්ම ඒ කොමිෂන් සභාවට පවරන්නට ඕනෑ. එම පියවර ගත්තොත් දූෂණයෙන් සහ අදක්ෂ පාලනයෙන් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

රටේ සමුපකාර ව්‍යාපාරය බේරා ගන්නට නැත නම් මුදා ගන්නට පුළුවන් වෙයි. ඒ විධියේ සමුපකාර සේවා කොමිෂන් සභාවක් පත් කරනවා නම්, සමුපකාර සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, පඩි වැඩිවීම් හා විනයානුකූල කටයුතු ආදිය ඒ මගින් කරන්නට පුළුවනි. දැන තත්ත්වය අනුව සමුපකාර සේවකයෙකු කොතරම් සාධාරණ හේතුවක් උඩ වුණත් ඔහු සේවය කරන සමිතියේ සභාපති සමග හෝ එහි නිලධාරි මණ්ඩලයේ කෙනෙකු සමග හෝ හිත් වේදනාවකින් නැත්නම් භේදයකින් පසු වෙනවා නම් ඔහුට මාරුවීමක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. එක්කො ඔහු එතැනම ඉන්න ඕනෑ; නැත්නම් අස් වෙලාම යන්න ඕනෑ. එවැනි කරුණකදී සමුපකාර කොමසාරිස්තුමාට ඇපෑලක් ඉදිරිපත් කරන්නට පුළුවන්කම තිබෙන බව මම දන්නවා. කොයිතරම් ඇපැල් ඉදිරිපත් කළත් සභාපතිගේත්, නිලධාරීන්ගේත් තත්ත්වය ආරක්ෂා වෙනවා මිස ඒවායින් සේවකයන්ගේ තත්ත්වය තව දාවත් ආරක්ෂා වෙන්නෙ නැහැ. ඒ නිසා මේ රටේ සමුපකාර ව්‍යාපාරයේ යෙදී සිටින සේවක පිරිසට නියම තත්ත්වයක් ලබා දී සමුපකාර ව්‍යාපාරය දැන් තිබෙන දූෂිත පාලනයෙන්, අදක්ෂ පාලනයෙන් මුදවා ගෙන සමුපකාර ව්‍යාපාරයේ මනා පාලනයක් ඇති කරන්නට නම් සමුපකාර සේවා කොමිෂන් සභාවක් ඉතා ඉක්මණින්ම පිහිටුවන්නට ඕනෑ. ඒ නිසා ඒ අදහසට කාරුණික අවධානය යොමු කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

එක සමුපකාර සමිතියක එක පඩි ක්‍රමයක්. තවත් සමුපකාරයක තවත් පඩි ක්‍රමයක්. පඩි වැඩිවීමේ ක්‍රමත් එකිනෙකට වෙනස්. කිසිම සමානත්වයක් නැහැ. සමුපකාර සංගම් අතරෙත්, සමුපකාර සමිති අතරෙත් මේ තත්ත්වය තිබෙනවා. සමහර සමුපකාර සමිතිවල හා සමුපකාර සමිති සංගම්වල හොඳ තත්ත්වයක් තිබෙන අතර, තවත් සමහර සමිතිවල හා සංගම්වල ඉතා දුර්වල තත්ත්වයක් තිබෙනවා. අද සමුපකාර සේවක පිරිසට මුහුණ දෙන්නට සිදු වී තිබෙන්නේ එවැනි තත්ත්වයකටයි. මේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට වුවමනා නම් මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර සමුපකාර සමිති හා සංගම්වල සේවය කරන සේවක පිරිසට සාධාරණ නිදහස් සේවා ජීවිතයක් ගත කරන්නට ඉඩ කඩ සලසා දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර සමිතිවලත්, සමුපකාර සමිති සංගම්වලත් මුදල් අංශයේ දූෂණත්, අදක්ෂ පාලනයත් ඇති වෙන්නේ, මගේ කල්පනාවේ හැටියට, දවසින් දවස සමුපකාර ව්‍යාපාරය මගින් කර ගෙන යන වෙළඳ කටයුතු පුළුල් වන නමුත් ඒ අනුව සමුපකාර දෙපාර්තමේන්තුවේ ගණන් පරීක්ෂණ අංශය ශක්තිමත් නොවන නිසයි. සමුපකාර සමිති හා සංගම්වල දැනට පවතින දූෂණ නැති කරන්ට නම් වාර්ෂික ගණන් පරීක්ෂණ පමණක් නොවෙයි, හදිසි ගණන් පරීක්ෂණත් පැවැත් විය යුතුයි. ඒ නිසා මා ඉතා කරුණාවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ සමුපකාර දෙපාර්තමේන්තුවේ ගණන් පරීක්ෂණ අංශය දැනට වඩා දියුණු කරන්ට කියායි; දැනට වඩා ශක්තිමත් කරන්ට කියායි. සංවර්ධන අංශය විතරක් දියුණු කළාට මදි. ගණන් පරීක්ෂණ අංශය ඊටත් වඩා ශක්තිමත් කරන්ට ඕනෑ. මෙතෙක් කල් සමුපකාර පරීක්ෂකයින් බඳවා ගැනීමේදී, ගණන් පරීක්ෂා කිරීමට ගණන් ශාස්ත්‍රය ගැන විශේෂ දැනුමක් ඇති උදවිය අපට තෝරා ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. දැනට අවුරුදු 10 කට විතර කලින් චාර්ටඩ් ගණකාධිකාරීවරුන් හා ලියාපදිංචි වූ ගණකාධිකාරීවරුන්ගේ සංඛ්‍යාව ඉතා සීමිතව තිබුණා. දැන් ක්‍රමයෙන් අවුරුදුපතා ඔවුන්ගේ සංඛ්‍යාව වැඩි වෙනවා. ඒ නිසා අනාගතයේදී සමුපකාර දෙපාර්තමේන්තුවට උප කොමසාරිස්වරුන් බඳවා ගැනීමේදීත්, පරීක්ෂකයන් බඳවා ගැනීමේදීත් ගණකාධිකරණය ගැන විශේෂ දැනුමක් ඇති මහත්වරුන් විශේෂයෙන් බඳවා ගන්නා මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා ගණන් අංශයට හෙවත් ඔඩිට් අංශයට චාර්ටඩ් එකවුන්ටන්ට් මහත්වරුන් හෝ රෙජිස්ටර්ඩ් එකවුන්ටන්ට් මහත්වරුන් කීපදෙනෙක් පත් කර එය වෙනම අංශයක් හැටියට ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගියොත් තමයි දැනට තිබෙන දූෂණ නැත්නම් අදක්ෂ පාලනය නැති කරන්නට පුළුවන් වන්නේ කියා මා හිතනවා. ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එමෙන්ම, හෙට අනිද්දා සමුපකාර ව්‍යාපාරය ගැන කොමිසමක් පත් කරනවා නම් විශේෂයෙන්ම ඒ අංශය ගැන සලකා බලන්නය කියා ගරු ඇමතිතුමා අණ කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

කලින් කෙරුණු පිළිවෙළට ජෝෂඃ විභාගය පමණක් සමත් අය සමුපකාර පරීක්ෂක මහත්වරුන් වශයෙන් පත් කරගෙන මේ වැඩේ කරගෙන යන්නට ඕනෑය කියා අපි කල්පනා කරන්නට හොඳ නැහැ. පරීක්ෂක මහත්මයෙක් හැටියට උපාධිධාරියෙක් පත් කර ගන්නට දැන් පුළුවන්කම තිබෙනවා. ඒ විධියට ඒ අංශය දියුණු කළොත් පමණයි මෙයට නව පණක් ලැබෙන්නේ. එසේ කළොත් පමණයි දූෂණයෙන් තොරව නියම පාලනයක් ගෙනයන්නට පුළුවන්කම ලැබෙන්නේ. ඇත්ත වශයෙන්ම ශාස්ත්‍රීය වශයෙන් කල්පනා කරන විට මෙය ලොකු විහිළුවක්. සමහර සමුපකාර සමිති සංගම්වල "ටර්න්ඕවර්" එක දස ලක්ෂයකට නැත්නම් කෝටියකට වැඩියි. එහෙත් එවැනි සංගම්වල ගණන් පරීක්ෂා කරන්න යන පරීක්ෂක මහත්මයෙකුට ලැබෙන වැටුප මසකට රුපියල් 150 යි. එවැනි සුළු වැටුපකට යන්නේ ගණන් ශාස්ත්‍රය නැත්නම් "එකවුන්ටන්සි" ගැන වැඩි දැනීමක් නැති අයයි. එවැනි පරීක්ෂක මහත්වරුන් යවා ලක්ෂ ගණනක "ටර්න්ඕවර්" එකක් ඇති ව්‍යාපාරයක ගණන් පරීක්ෂා කර බැලීමෙන් වැඩි ප්‍රයෝජනයක් නොලැබෙන බව මා නොකීවාට තමුන්නාන්සේලාටම පැහැදිලි වෙනවා ඇති. ඒ නිසා ඒ කරුණු ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර දෙපාර්තමේන්තුවේ සිටින පරීක්ෂක මහත්වරුන්ගේ සංඛ්‍යාව 3,000ක් පමණ වෙනවා. ඒ අයගේ පඩි ක්‍රමය දැනට වඩා සාධාරණ ලෙස සකස් කරන හැටියට උද්ඝෝෂණයක් ගෙනගියා. මා සමුපකාර මහ කොමසාරිස් වශයෙන් සිටි කාලයේ පරීක්ෂකවරයකුගේ මුළු වැටුප—එලවන්ස් සමග—රුපියල් 150 යි. එවැනි වැටුපකට සමුපකාර පරීක්ෂකවරයෙකු පත් කරගෙන මෙවැනි විශාල වෙළඳ ව්‍යාපාරයක්, එමෙන්ම සංවර්ධන ව්‍යාපාරයක්, ගෙනයන්නට බැහැ. මෙය මේ රටේ ආර්ථික සංවර්ධනයට ඉතාම අවශ්‍ය ව්‍යාපාරයක්. ආර්ථික සංවර්ධනයට මෙතරම් අවශ්‍ය ව්‍යාපාරයක් නිසියාකාරව පාලනය කරන්නට නම් මීට වඩා හොඳ සාධාරණ පඩි ක්‍රමයක් සමුපකාර පරීක්ෂක මහත්වරුන්ට ලබා දෙන හැටියට මා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සංශෝධනයක් අවශ්‍යයි කියා කටුගම්පොල ගරු මන්ත්‍රීතුමා (වී. බී. සුබසිංහ මයා.) දැක් වූ අදහස මාත් අනුමත කරනවා. වර්තමාන කර්මාන්ත හා ධීවර ඇමතිතුමා 1958 දී සමුපකාර ව්‍යාපාරයට නව පණක් දුන්නා; විශේෂ වෙනසක් ඇති කළා. එහෙත් එසේ ඇති කළ විවිධ සේවා සමුපකාර සමිතිවලින් නියම ප්‍රතිඵල ලබා ගන්නට අද වනතුරුත් අපට බැරි වී තිබෙනවා. එහි පරමාර්ථය ඉටු කර ගන්නට පුළුවන් වුණේ නැහැ. අද වන තුරුත් නියම අන්දමින් විවිධ සේවා ලබාගැනීමට අපට බැරි වී තිබෙනවා. අගලවත්ත, මතුගම, බුලත්සිංහල වැනි රබර් නිපදවන ප්‍රදේශවල සුළු රබර් නිෂ්පාදකයන්ගේ රබර්, ඔටුපාළු ආදි හැම දෙයක්ම සමුපකාර සමිතිවලට ගෙනවිත් දී සාධාරණ නියම මිලක් ලබාගැනීමට හැකිවනු පිණිස අලෙවි මාර්ගයක් ඇති කිරීමටයි එතුමා එදා කල්පනා කළේ.

විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය යටතේ අද කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, ඉඟුරු ආදි ද්‍රව්‍යවල මිල වැඩි වී තිබෙන නමුත් ඒවා නිපදවන සුළු ඉඩම් හිමියන්ට ඒ ද්‍රව්‍ය සඳහා නියම සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. එහෙත් විවිධසේවා සමුපකාර සමිතිවල තිබෙන අලෙවි කිරීමේ අංශය නියම ආකාරයට ක්‍රියා කරතොත් මේ දේවල් නිපදවන්නන්ට මීට වඩා හොඳ සාධාරණ මිලක් ලබා ගන්නට පුළුවන්කමක් ඇති වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙළක් ඇති කර ගරු ඇමතිතුමා මේ උදවියට පහසුකම් සලසා දෙන්නට ඕනෑ. රබර් නිපදවන පළාත්වල ඔටට පාල් එකතු කරන උදවියටත්. රබර් ශීට් එකක් දෙකක් නිපදවන උදවියටත් සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

නයක් ලැබෙන සේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. ඒ අය සූරා කන්නට මුදලාලිලාට ඉඩ නොදී විවිධසේවා සමුපකාර සමිති මගින් නියම මිලක් ගෙවීමට ක්‍රියා කරන්නට පුළුවනි. විශාල වශයෙන් දෙඩම් නිපදවන ප්‍රදේශයක් වන බිබිලෙ වැනි කොට්ඨාශවල දස දහස් ගණන් දොඩම් නිපදවන නමුත් ගෙඩියක් බොහොම අමාරුවෙන් ශත දෙකක් වැනි සුළු මුදලකටයි විකුණන්නට සිදු වී තිබෙන්නේ. ඒ තරම් සුළු මුදලකටයි පිට පළාත්වලින් පැමිණෙන මුදලාලිලා දෙඩම් අරන් යන්නේ. කොළඹ දොඩම් ගෙඩියක් විකුණන්නේ රුපියලකටයි. ශත දෙකකට ගන්න දොඩමක් රුපියලකට විකිණීමෙන් ශත 98ක් ලාභ ගන්නවා. ඒ තරම් විශාල ලාභයක් ගන්නේ කවුරුදැයි කල්පනා කරන්නට ඕනෑ. එදා විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය මේ රටේ ඇති කළ අවස්ථාවේ සමුපකාර දෙපාර්තමේන්තුවේ මහා කොමසාරිස්වරයා හැටියට සිටියේ මම තමයි. මුලින්ම මේ ක්‍රමය ආරම්භ කෙළේ ඒ කාලයේදීයි. ඒ කාලයේ මෙවැනි ව්‍යාපාරයක් ඇති කෙළේ බිබිලෙ වැනි ප්‍රදේශවල නිපදවන්නන්ටත් සාධාරණ මිලක් ලබා දෙන්නටයි. එය කරන්නට පුළුවන් වේයැයි එදා කල්පනා කළ නමුත් අපේ ඒ පරමාර්ථය හෙවත් බලාපොරොත්තුව ඉටු වුණේ නැහැ. සමුපකාර විවිධසේවා සමිති මගින් නියම විධියේ අලෙවි කිරීමේ ක්‍රමයක් ඇති වුණේ නැහැ. මාකටිං ඩිපාට්මන්ට් නමිනුත් හඳුන්වන ද්‍රව්‍ය අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මේ රටේ තිබෙන අදක්ෂ දෙපාර්තමේන්තුවක් බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ අදක්ෂකම ගැන කථා කරන්නට ගියොත් දවස් දෙකක් වුණත් කථා කරන්නට පුළුවනි. ඒ නිසා, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නම් කවදාවත් මේ රටේ ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ. මේ රටේ නිපදවන්නන්ට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නම් සහනයක් ලැබෙන්නේ නැහැ. නිපදවන්නන්ට සාධාරණ මිලක් ලබා දීමට උපයෝගි කරගත හැකි එකම ක්‍රමය නම් විවිධසේවා සමුපකාර සමිති සංගම්වල අලෙවි කිරීමේ අංශය වඩාත් විධිමත් ලෙස ක්‍රියාත්මක වන්නට සැලැස්සීමයි. එසේ නොකළොත් ලෙවික් ක්‍රමයකින් නම් බිබිලේ දොඩමකට ශත දෙකකට වැඩි මුදලක් ඒ දොඩම නිපදවන්නාට කවදාවත් ලැබෙන්නේ නැහැ. බලපිටිය, දෙවිනුවර, අගලවත්ත, මතුගම ආදි ප්‍රදේශවල සිටින යම් යම් දේවල් නිපදවන්නන් සම්බන්ධයෙනුත් තත්ත්වය ඊට වඩා වෙනස් නැහැ. ෂීට් රබර්, ඔට්ටපාල්, කුරුඳු වැනි දේ නිපදවන උදවියට සහනයක් ලැබෙන්නට නම් විධිමත් වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. ඒ සඳහා අලෙවි කිරීමේ අංශය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිනවා. නොයෙක් ප්‍රදේශවල මේ අංශයෙන් හොඳ ප්‍රයෝජන ලැබෙන බව මා දන්නවා. එහෙත් දැනට වඩා විධිමත් ලෙස ඒවා ක්‍රියාත්මක කරන්නට ඕනෑ. මීට වඩා පණක් ඒ සමිතිවලට දෙන්නට පුළුවනි.

ආහාර වගා ව්‍යාපාරය කවුරු කළත් හොඳයි. එවැනි හොඳ වැඩවලට මගේ සහාය නිතරම ලැබෙනවා. මම එවැනි කටයුතුවලට නිතරම සහාය දෙන මන්ත්‍රීවරයෙක්. එහෙත් ඒ ව්‍යාපාරයෙන් නියම ප්‍රයෝජනය ලබා ගන්නට නම් අලෙවි කිරීමේ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ. මේ රටේ අලෙවි කිරීමේ ක්‍රමය තරම් දූෂණයෙන් පිරුණු දෙයක් තවත් නැහැ. එළවලු නිපදවන්නන්ට නියම මිලක් ලැබෙන්නේ නැහැ. පලතුරු නිපදවන්නන්ටත් ඒ තත්ත්වයමයි තිබෙන්නේ. පැපොල් ගෙඩියක් කොළඹ රු. 1.20 යි. එහෙත් ඒවා බහුල වශයෙන් නිපදවන පළාත්වල ගෙඩියක් ශත දහයකටවත් විකුණන්නට බැහැ. එවැනි තත්ත්වයක් මේ රටේ තිබෙනවා. එළවලු සහ පලතුරු ජාති අලෙවි කිරීමේ මණ්ඩලයක් පිහිටවන්නට 1958 දී අපි යෝජනාවක් ඉදිරිපත් කළා. එහෙත් අද වනතුරු එය ක්‍රියාත්මක වී නැහැ. ඒවා ක්‍රියාත්මක වුණත් නැතත්, විවිධ සේවා සමුපකාර සමිති සංගම් මාර්ගයෙන් එළවළු, පළතුරු, කුරුඳු, රබර්, ඔටුපාලු, තේ දළු යනාදී වූ සියලුම දේවල් අලෙවි කිරීමේ වැඩ පිළිවෙළක් යොදන්නට පුළුවන් බව මා ගරු ඇමතිතුමාට මතක් කර දෙන්නට කැමැතියි. එම නිසා, මේ රටේ විවිධ සේවා සමපකාර සමිති බෝඩ් ලෑල්ලට පමණක්, නමට පමණක් සීමා වන්නට නොදී, මේ රටේ ගොවි ජනතාවට නියම වශයෙන්ම විවිධ සේව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක් සිදු වන තැනට ඉඩකඩ සලසා දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ආදර යෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර ව්‍යාපාරයේ සංශෝධනයක් ඇති කිරීම සඳහා ගරු ඇමතිතුමා විසින් කොමිෂන් සභාවක් පත් කරන්නට යෙදුණු බව පුවත්පත් මගින් අපට ආරංචි වුණා. ඒ කොමිසම එහි වැඩ කටයුතු ආරම්භ කළාද නැද්ද යන වග අප තවම දන්නේ නැහැ. එහි කටයුතු ආරම්භ වුණාද, එසේ නම් එහි "ටර්මිස් ඔෆ් රෙපරන්ස්" හෙවත් පරීක්ෂණයට භාජන වන කරුණු මොනවාද යනාදී විස්තර ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී තෝරා පහදා දුන්නොත් අප එතුමාට කෘතඥ වෙනවා.

ගම්බද ජනතාවගේ ණය ප්‍රශ්නය ගැන මහා බැංකුව මගින් 1956 දී විශේෂ පරීක්ෂණයක් පැවැත්වුණා. ඒ අවස්ථාවේදී මේ රටේ ගම්බද ගොවි ජනතාව අඩු වශයෙන් කෝටි 55 ක පමණ ණය බරකින් මිරිකී සිටි බව අපට පෙනී ගියා. ආහාර වගා ව්‍යාපාරය නිසා දැන් ගම්බද පළාත්වල මුදල් වැඩි වී කසිප්පු, කානිවල්, බුකි යනාදී දේ වෙනුවෙන් ගම්බද ජනතාව මුදල් නාස්ති කරන බව ධනපති පුවත්පත් නම් දැන් පොල් ගෙඩි අකුරෙන් පළ කරන බව අපට දකින්නට ලැබෙනවා. මා නම් එය තව ම පැහැදිලි වශයෙන් පිළිගෙන නැහැ. ආහාර වගාවේ නියම තත්ත්වය දැන ගන්නට නම් නැවත වරක් ගම්බද ගොවි ජනතාවගේ ණය ප්‍රශ්නය පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. මේ රජයේ ආහාර වගාවේ නියම ප්‍රතිඵල ගොවි ජනතාවට ලැබුණා නම් ඔවුන් දැන් සම්පූර්ණයෙන්ම ණය බරින් මිදී ඇති. ධනපති මුදලාලිලාට ණය නොවී ඔවුන් ජීවත් වනවා ඇති. එම නිසා, ආහාර වගාවේ නියම ප්‍රතිඵල ගොවි ජනතාවට ලැබී තිබෙන බව රටට ඔප්පු කරන්නට නම් ගම්බද ජනතාවගේ ණය ප්‍රශ්නය ගැන විශේෂ පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. මහා බැංකුවේ විශේෂඥයන් ලවා එය කරවන්නට පුළුවනි. කලින් වතාවේ පරීක්ෂණය පැවැත්වූ ආචාර්ය තිලකරත්න මහත්මයා ඇතුළු කීපදෙනකුම තවම එහි සිටිනවා. ඒ අයත් අලුත් අයත් යොදවා මේ රටේ ගම්බද ජනතාවගේ ණය ප්‍රශ්නය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල වාර්තාවක් වශයෙන් අප වෙත ඉදිරිපත් කළහොත් ආහාර වගාවේ නියම ප්‍රතිඵල ජනතාවට ලැබී තිබෙනවාද නැද්ද යනන් එයින් අපට තේරුම් ගන්නට පුළුවනි.

මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා විසින් පත් කරන ලද කොමිෂන් සභාව මේ රටේ සමුපකාර ව්‍යාපාරය ගැන නියම විධියේ පරීක්ෂණයක් පවත්වනවා ඇතැයි මා විශ්වාස කරනවා. පිටරටින් එන විශේෂඥයන්ගේ අදහස් අනුව වැඩ කරන්නට ගියොත් නම් මේ වැඩේ හරියන්නේ නැහැ. ස්වීඩන්හි තිබෙන්නේ එක්තරා විධියක සමුපකාර ක්‍රමයක්. ඩෙන්මාර්කයේ ක්‍රියාත්මක වන්නේ තවත් පිළිවෙළක්. එංගලන්තයේ, එක්සත් රාජධානියේ පවතින සමුපකාර ක්‍රමය ඊට වෙනස්. 1845 දී ජීවත් වුණු රොබට් ඕවන් නම් පුද්ගලයකුගේ ප්‍රතිපත්ති අනුව ඒ රටවල් සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යනවා. ජර්මනිය, ඉන්දියාව වැනි රටවල තිබෙන්නේ එකිනෙකට වෙනස් සමුපකාර ප්‍රතිපත්ති. එම නිසා, මේ රටේ සමුපකාරය ලංකාවේ ආර්ථික තත්ත්වයට ගැළපෙන පිළිවෙළට සකස් කර ගත යුතුයි. පිටරටින් එන විශේෂඥයන් ගැන මගේ නම් වැඩි විශ්වාසයක් නැහැ. එහෙත්, මොන රටකින් එන විශේෂඥයන් වුවත්, මේ රටේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ වැඩ කටයුතු කළ අය සමග එක් වී මේ රටේ සෑම ප්‍රදේශයකටම ගොස් අවුරුද්දක් පමණ මහන්සි වී නියම පරීක්ෂණයක් කළ හොත් සමුපකාර ව්‍යාපාරයේ නියම තත්ත්වය අවබෝධ කර ගෙන සාර්ථක වාර්තාවක් ඉදිරිපත් කරන්නට ඔවුන්ට පුළුවන් වනවා ඇති. එවැනි පුළුල් වැඩ පිළිවෙළකින් මේ රටේ සමුපකාර ව්‍යාපාරයට නව පණක්, නව ජීවනයක් ලබා දෙන්නට තමුන්නාන්සේලාට පුළුවන් වේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.47

**එස්. එම්. රාසමානික්කම් මයා. (පඩ්දිරිප්පු)**

(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)

**(Mr. S. M. Rasamanickam—Paddiruppu)**

கௌரவ உப சபாநாயகர் அவர்களே, கௌரவ உணவு அமைச்சர் அவசரகாலச் சட்டத்தின் கீழ் அண்மையில் பெற்றுக் கொண்ட அதிகாரங்களின் அடிப்படையில் கூட்டுறவு அபிவிருத்தி நலன்களை ஒரு சில காலத்துக்கு உறுதிப்படுத்தும் நோக்கமாக ஒரு சில சட்டங்களைச் சமர்ப்பித்துள்ளார். தவறுதலாக நிர்வாகம் செய்யும் கூட்டுறவு ஸ்தாபனங்களின் நிர்வாக சபைகளைக் கலைக்கவும் அந்தச் சபைகளை நிர்வகிப்பதற்கும் ஒரு நிர்வாகத்தை அமைப்பதற்குமான அதிகாரங்களை இந்தச் சட்டத்தின் கீழ் ஒரு சில காலங்களுக்கு அவர் வேண்டுகின்றார். இன்றைய சூழ்நிலையில் இந்த அதிகாரங்களை அவர் பெறவேண்டியது அவசியமென நான் கருதுகின்றேன். இந்தச் சந்தர்ப்பத்தில் இந்த நாட்டின் கூட்டுறவு ஸ்தாபனங்களின் நிலையென்ன, அவற்றின் எதிர்காலம் என்ன, இவை எவ்வாருகப் பொது மக்களுக்குப் பயன்படவேண்டும், அதற்கான முன்னேற்றங்களை எப்படி ஏற்படுத்த வேண்டும் என்பனவற்றைச் சிந்திப்பது ஓரளவு பொருத்தமாக இருக்கும் எனக் கருதுகின்றேன்.

எனக்கு முன்னர் பேசிய கட்டுகம்பளைப் பிரதிநிதி (திரு. ரீ. பி. சுபசிங்ஹ) அவர்களும் முன்னை நாள் கூட்டுறவு ஆணையாளராக இருந்து இளைப்பாறிய தெவிநுவரைப் பிரதிநிதி (திரு. ஆர். ஜே. ஜீ. டி மெல்) அவர்களும் சில ஆலோசனைகளைக் கூறினர்கள். முன்னொரு காலத்தில் கூட்டுறவு இலாகாவோடு சம்பந்தப்பட்ட ஒருவனாக இருந்தவன் என்ற கோதாவில் எனக்கும் இதில் அனுபவமும் அக்கறையும் உண்டு. ஆகவே, அதுபற்றிச் சில கருத்துக்களைக் கூறுவது பொருத்தமாக இருக்குமென நினைக்கின்றேன்.

பல ஆண்டுகளாக, கூட்டுறவு ஸ்தாபனங்களின் எதிர்காலத்தை ஆராய்வதற்காக ஒரு கமிஷன் நியமிக்கப்பட வேண்டுமென நான் பல சந்தர்ப்பங்களில் இந்தச் சபையில் வாதாடி வந்திருக்கிறேன். அப்படி வாதாடியது மாத்திரமன்றி, இந்தச் சபையிலே, கூட்டுறவு ஸ்தாபனங்களின் எதிர்காலத்தை ஆய்வதற்காக உடனடியாக ஒரு கமிஷனை நியமிக்க வேண்டுமென்ற ஒரு பிரேரணையையும் நான் கொண்டு வந்து அதனைச் சபை நிறைவேற்றியும் இருக்கின்றது. ஆகவே, ஒரு கமிஷனை நியமித்து, கூட்டுறவு ஸ்தாபனங்களின் எதிர்காலத்தை நிர்ணயிப்பது மிகவும் அவசியமாகும். 1912 ஆம் ஆண்டிலே முதன் முதலாக ஆரம்பிக்கப்பட்ட இந்தக் கூட்டுறவு இயக்கம் இந்த நாட்டிலே மிகவும் மெதுவாக வளர்ச்சியடைந்து, பின்னர் 1940 ஆம் ஆண்டளவில் இருந்து அதிவேகமாக வளர்ச்சியடைந்தது கூட்டுறவாளர் அனைவரும் அறிந்த சரித்திரமாகும்.

முதலாவது மகா யுத்த காலத்தில் உணவு நெருக்கடி ஏற்பட்ட பொழுது குறைந்த அளவிலிருந்த உணவுப் பொருட்களைப் பொது மக்களுக்கு விநியோகிப்பதற்கு வழிகளை ஆராய்ந்த பொழுது கூட்டுறவு ஸ்தாபனங்களே அதற்குத் தகுதியானவை என்ற நோக்கத்தோடுதான் இந்தக் கூட்டுறவுச் சங்கங்கள் ஆரம்பிக்கப்பட்டன. 1940 ஆம் ஆண்டுக்கு முன்னர், அனேகமாகக் கடன் வசதிகளைப் பெறக்கூடிய சங்கங்கள்தான் இருந்தன. அதற்குப் பிறகுதான் உணவு விநியோகம், உணவு உற்பத்தி ஆகியவைகளை அபிவிருத்தி செய்யும் சங்கங்கள் ஆக்கப்பட்டன. இதற்கும் பிறகு ஏறக்குறையப் பத்து ஆண்டுகளுக்கு முன்னர்தான் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் ஆக்கப்பட்டன. கூட்டுறவு இயக்கம் எமது நாட்டில் ஒரு உறுதியான இடத்தைப் பெற்றிருக்கின்றது. இன்று கிராம வாசிகள், பட்டண வாசிகள், விவசாயிகள் உட்பட நாட்டு மக்கள் எல்லோருடைய பொருளாதார வளர்ச்சிக்கும் கூட்டுறவு இயக்கம் ஒரு அச்சாணியாக அமைந்திருக்கிறது என்பதை எவரும் மறைக்க முடியாது. ஆகவே, இந்தக் கூட்டுறவு இயக்கத்தைப் புனிதப்படுத்தி உறுதியானதாக்க வேண்டியது எமது கடமையாகும். இந்த இயக்கத்தின் புனிதத் தன்மையிலும் உறுதியிலும்தான் இந்த நாட்டு மக்களின் எதிர்காலம் தங்கி இருக்கின்றது என்று கூறினுல் அது மிகையாகாது. ஆகவே இன்று இந்த இயக்கத்தின் குறைபாடுகள் என்ன, அவைகளை எவ்வாறு நிவர்த்தி செய்யலாம் என்பதை மிகவும் கூர்மையாக ஆராயவேண்டியது எமது கடமையாகும்.

இந்த நாட்டு மக்களுடைய பலதரப்பட்ட தொழில்களையும் பல கோணங்களில் இருந்தும் அபிவிருத்தி செய்வதற்காகவே இந்த நாட்டில் அரசாங்கம் பல நோக்குக் கூட்டுற

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

வுச் சங்கங்களை ஆரம்பித்தபோதிலும் இன்று இந்தச் சங்கங்கள் ஒரு நோக்குக் கூட்டுறவுச் சங்கங்களாகவே இயங்கி வருகின்றன. இந்த நாட்டில் நெல் உற்பத்தி செய்யும் பகுதிகளைப் பொறுத்த அளவில் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் அங்கு நெல் வியாபாரத்திலே ஈடு பட்டுக் கொண்டிருக்கின்றன. வடபகுதியில் இந்தப் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்கள் வெண்காயம் முதலிய பொருட்களை வியா பாரம் செய்யும் சங்கங்களாக இயங்குகின் றன. மத்திய இலங்கையில் இயங்கும் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் மரக்கறி வகைகளையும் அவற்றோடு சம்பந்தப்பட்ட பொருட்களையும் வியாபாரம் செய்யும் சங்கங் களாக இருந்துகொண்டு இருக்கின்றன. ஆகவே பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் எந்த நோக்கங்களுக்காகச் செயற்பட வேண்டுமென்று ஆரம்பிக்கப்பட்டனவோ அவை இன்று அந்த நோக்கங்களுக்காகச் செயற்படவில்லை. இந்தச் சங்கங்கள் மூல மாகப் பொது மக்கள் தங்களுடைய தேவை கள் அனைத்தையும் பெறமுடியாது கஷ்டப்பட வேண்டியிருக்கின்றது. பல நோக்குக் கூட்டுற வுச் சங்கங்கள் இன்று பலநோக்கை விடுத்து ஒரு நோக்கில் இயங்குவதே இதற் குக் காரணமாகும்.

அரசாங்கம் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்களை நாடு முழுவதும் ஏற்படுத்த வேண்டுமென்ற அங்கலாய்ப்பினுலும் அவா வினுலும் ஆசையாலுந்தான் அவைகளை ஏற்படுத்தியது. இந்தச் சங்கங்கள் அர சாங்கத்திற்கு தரகர்களாக அதாவது— as agents of the Government— உணவுப் பொருட்களைப் பொது மக்களுக்கு விநியோகம் செய்யும் சங்கங்களாகவும் பொது மக்களுடைய விவசாயப் பொருட்களை வாங்கி விற்கும் பொழுது அவர்களுக்கு ஒரு கொமி ஷன் அடிப்படையில்—ஒரு லாப அடிப்படை யில் வாங்கி விற்கும் சங்கங்களாகவும் உத்தர வாதவிலைத்திட்டத்தின் கீழ் நெல்லை வாங்கும் சங்கங்களாகவும் அமைந்துகொண்ட காரணத் தால், தங்களுடைய லாபங்களுக்கு அரசாங் கத்திலேயே பெரிதும் தங்கியிருக்கிறுர்கள். ஆகவே, அரசாங்கம் அதனுடைய உணவு விநி யோகத் திட்டங்களை மாற்றுகின்ற பொழுது, அநேக சங்கங்கள் இன்று வருமானங்களை இழந்து, தன்நிறைவு பெற்று இயங்க முடி யாத நிலையில் தத்தளித்துக் கொண்டிருக்கின் றன. இதனால், இரண்டு விடயங்கள் இன்று தோன்றியிருக்கின்றன :

முதலாவது, தேவைக்கதிகமான பல நோக் குக் கூட்டுறவுச் சங்கங்களும், கூட்டுறவுச் சங் கங்களும், இந்நாட்டிலே இன்று இருந்து கொண்டிருக்கின்றன. இந்தச் சங்கங்கள், ரசாங்கத்தின் தரகர்களாக இயங்கும் காரணத்தினல் பெறும் லாபத்தைக் கொண்டு, அவற்றின் நிருவாகத்தை நடத்திக்கொள்ள முடியாமல் இன்று தத்தளிக்கின்றன. இதன் விளைவாக, இச் சங்கங்களிலேயுள்ள நிருவாகிகள் சங்கங் களின் முதலீட்டைத் துஷ்ப்பிரயோகம் செய் கின்ற அல்லது மோசடி செய்கின்ற நிலைக்கு வந்திருக்கிறுர்கள். எனவே, நாட்டிலே இன்று இருக்கின்ற பலநோக்குக் கூட்டுறவுச் சங்கங் களோ, ஏனைய சங்கங்களோ அனைத்தும் தொடர்ந்திருக்க வேண்டுமா அல்லது அவற் றில் ஒரு சிலவற்றை நிறுத்தி மற்றவைகளைப் பலப்படுத்தவேண்டுமா என்பதைக் கௌரவ அமைச்சரவர்கள் ஆலோசனை செய்ய வேண்டும்.

இரண்டாவதாக, அரசாங்கத்தின் தரகர் களாக இருக்கின்ற காரணத்தாலும் இன்று இலவச அரிசி விநியோகம் செய்யப்படுகின்ற காரணத்தாலும், முன்புபோலல்லாது சிறிய கொமிஷனைப் பெற்று, இதனுல் பெறும் இலா பம் நிருவாகத்திற்குப் போதாமலிருக்கின்ற சங்கங்களும் உண்மையிலே தொடர்ந்து இருக்கவேண்டுமாவென்பதையும் அமைச்சர வர்கள் ஆலோசிக்க வேண்டும். ஆகவே தேவைக்கு மேலதிகமாக இருக்கின்ற சங்கங் களை ஒன்றுபடுத்துவதில் அரசாங்கம் கூடிய கவனம் செலுத்தவேண்டுமென்பதைச் சுட்டிக் காட்ட விரும்புகிறேன். தவறுதலாக நிரு வகிக்கப்படும் கூட்டுறவுச் சங்கங்களின் நிர் வாக சபைகளைக் கலைத்து அவைகளுக்குப் பதிலாக வேறு ஒரு நிருவாகத்தை அமைக் கும் அதிகாரத்தை கௌரவ அமைச்சர் கோரும்பொழுது, பல சங்கங்கள் இன்று இயங்க முடியாத நிலையில் இருக்கின்றனவென் பதை அவர் ஒப்புக்கொள்ளுகின்றுர். இதற் கான முக்கிய காரணத்தை கௌரவ தெவி நுவரைப் பாராளுமன்ற அங்கத்தவர் சுட்டிக் காட்டியிருக்கிறுர்.

கூட்டுறவு இயக்கத்திலே இன்று இருக் கின்ற ஒரு பெரிய குறைபாடு என்னவென்றுல், அந்தச் சங்கங்களின் கணக்குகளை உரிய காலத்தில் பரிசோதனை செய்யாமல் விடுவது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

தான். எந்த ஒரு ஸ்தாபனத்திலும்—பணத்தோடு இயங்கும் அல்லது பணத்தோடு அலுவல்களைச் செய்யும் எந்த ஒரு ஸ்தாபனத்திலும்—அந்தப் பணம் எவ்வாறு செலவு செய்யப்படுகிறது என்ற கண்காணிப்புக் குறைவாக இருந்தால் அங்கு மோசடிகள், பண துஷ்ப்பிரயோகங்கள் ஆதியன ஏற்படுவது சகஜம். ஆகவே, கூட்டுறவு இயக்கங்களில் உரிய காலத்தில் கண்காணிப்பும், கணக்குப் பரிசோதனையும் இல்லாமலிருந்தால் அந்தச் சங்கங்கள் பிழையான வழியில் செல்லும் என்பதில் எந்தவிதமான ஐயத்துக்குமிடமில்லை.

கூட்டுறவு இலாகாக்களில் கணக்குப் பரிசோதனை செய்யும் உத்தியோகத்தர்கள் குறைவான காரணத்தினால் வருடம் ஒரு முறை கணக்குப் பரிசோதனை செய்ய வேண்டிய சங்கங்களை இரண்டு வருடங்களுக்கு அல்லது அதற்குக் கூடிய காலத்துக்கு கணக்குப் பரிசோதனை செய்யாமல் விடுவதை நாம் காணக் கூடியதாக இருக்கிறது. ஆகவே, கூட்டுறவு இலாகா கணக்குப் பரிசோதனைப் பகுதியை பலப்படுத்த வேண்டியதும், அதனால் கூட்டுறவுச் சங்கங்களை நேர்மையான வகையில் வழி நடத்த வேண்டியதும் அத்தியாவசியமாகும். எனவே கூட்டுறவுச் சங்கங்களுக்குத் தேவையான கணக்குப் பரிசோதகர்களைக் கொடுக்க வேண்டியது கூட்டுறவு இலாகாவினுடைய கடமையாகும்.

கூட்டுறவு உத்தியோகத்தர்கள் இணைக்கப்பட்ட ஒரு சேவையின் கீழ்க் கொண்டு வரப்பட வேண்டும் என்று கௌரவ தெவிநுவர பிரதிநிதி கூறிய ஆலோசனையை நான் ஆமோதிக்க விரும்புகிறேன்—a unified service for the co-operative employees. இன்று கூட்டுறவு உத்தியோகத்தர்களுக்கு மிகவும் முக்கியமாகத் தேவைப்படுவது இணைக்கப்பட்ட ஒரு சேவை என்பதை இந்தச் சந்தர்ப்பத்திலே சுட்டிக்காட்ட விரும்புகிறேன்.

கூட்டுறவு இயக்கத்தில் ஈடுபட்டிருக்கும் ஆயிரக்கணக்கான ஊழியர்கள் தங்களது எதிர்காலம் எவ்வாறு இருக்குமோ என்று தெரியாமல் இருப்பதனாலும், கூட்டுறவு இயக்கங்களின் வருமானம் நாளுக்கு நாள் குறைந்து போகக் கூடிய நிலை இருப்பதனாலும், நான் முன்பு கூறியது போல அவர்களுடைய நிர்வாகத்தில் இருக்கும் ஊழியர்களுக்கு நியாயமான சம்பளம் கொடுக்கக் கூடிய நிலையில் அவ்வியக்கங்கள் இல்லாமலிருக்கும் காரணத்தினாலும் அந்த ஊழியர்கள் சங்கங்களின் பணத்தின் மேல் தங்களுடைய கைகளை வைக்கத் தொடங்குகிறார்கள். ஆகவே, இந்த நிலை மாறுவதற்கு கூட்டுறவுச் சங்கங்கள் தங்களுடைய வருமானத்தில் தங்களுடைய நிர்வாகத்தைச் செய்யக் கூடிய ஒரு அமைப்பு நிலையை ஏற்படுத்த வேண்டும். Co-operative societies must be made viable units. They must be able to run their entire administration on the profits they earn. பெறும் இலாபத்திலிருந்து நிர்வாகத்தை நடத்தவும் ஊழியர்களுக்குச் சம்பளம் கொடுக்கவும் கூடிய நிலை இருக்க வேண்டும். அப்படியில்லாவிட்டால் சங்கங்கள் நடக்க இயலாது. It is the duty of the department now to amalgamate and eliminate societies which are unnecessary.

ஆகவே, கூட்டுறவு இலாகா, இலாபம் குறைந்த சங்கங்களை ஒன்று சேர்க்கவோ அல்லது அவற்றைக் குறைக்கவோ வேண்டிய நிலை ஏற்பட்டிருக்கிறது. தேவைப்பட்டால் உற்பத்திப் பொருட்களை வாங்குவதற்காக கிராமங்களில் கிளை ஸ்தாபனங்களை ஏற்படுத்துவதற்கான ஒழுங்குகளை இலாகா செய்து கொடுக்க வேண்டியது அத்தியாவசியம் என்பது என்னுடைய கருத்து. ஆகவே, இந்த ஊழியர்களுக்கான ஒரு சேவையைத் தாமதிக்காமல் ஆரம்பிப்பது அவசியம்.

இறுதியாக நான் மீண்டும் அமைச்சர் அவர்களை வேண்டுவது என்னவென்றால், ஏறக்குறைய 56 ஆண்டுகளாக எமது நாட்டிலே இயங்கி வரும் கூட்டுறவு இயக்கத்தின் நிலையையும் அதன் எதிர்காலத்தையும், காலத்துக்கு ஏற்றவாறு அதனை எவ்வாறு எமது வாழ்க்கைக்காக உபயோகிக்கலாம் எனும் தன்மையையும் நாம் நிர்ணயிப்பதற்கு ஒரு கமிஷன் நியமிக்கப்பட வேண்டியது மிகவும் அவசியமும் முக்கியமுமாகின்றது. ஆகவே, கூட்டுறவு இயக்கத்தின் பலன்கள், பலவீனங்கள் ஆகியவற்றைக் கணிக்கவும் எதிர்காலத்தில் எவ்வாறு இந்த இயக்கம் பொதுமக்களின் நலனுக்காகவும் இந்நாட்டின் பொருளாதார முன்னேற்றத்துக்காகவும் இந்த நாட்டு மக்களின் சிறந்த வாழ்க்கைக்காகவும் இயங்க வேண்டுமென்பதை ஆராய

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அமைச்சர் அவர்கள் காலம் தாழ்த்தாமல் ஒரு சிறந்த குழுவை நியமிக்க நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கேட்டு எனது குறிப்புரையை முடிக்கின்றேன்.

අ. භා. 3.55

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක පනත යටතේ කටයුතු කිරීමෙන් පසුව ගරු ඇමතිතුමා විසින් සමුපකාර සමිති ගණනාවකම බලතල තමාගේ අතසක යටතට ගැනීමට පනතක් අප ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. එම පනතේ තිබෙන කරුණුවලට වඩා පුළුල් වශයෙන් මෙය මේ අවස්ථාවේදී සාකච්ඡාවට භාජනය වීම ඇත්තවශයෙන්ම ඉතාමත් ප්‍රයෝජනවත් විය හැකියයි මා කල්පනා කරනවා. එපමණක් නොවෙයි, අනාගතයේදී එතුමා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කොමිෂන් සභාවක් පත් කර කරුණු දැනගැනීමට බලාපොරොත්තු වෙනවාද—යම් ප්‍රතිඵලයක් බලාපොරොත්තු වෙනවාද—ඒ හැම දෙයක් ගැනම හොඳ අවබෝධයක් මේ සාකච්ඡාවෙන් එතුමාට ලැබෙන්න ඇතැයි මා සිතනවා. ඒ නිසා මේ පනතේ තිබෙන යම් යම් කරුණුවලට පිටස්තර යම් යම් ප්‍රකාශයන් මා විසින් කෙරුණත් එයට තමුන්නාන්සේ සමාවෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාත් මේ අවස්ථාවේදී මෙහි සිටින නිසා 1957 අවුරුද්ද ගැන අපි මෙහිදී ප්‍රීතියෙන් මතක් කළ යුතුව තිබෙනවා. සමුපකාර ව්‍යාපාරයේ ස්වර්ණමය යුගය නම් ඒ 1957 කාලය නැත්නම් බණ්ඩාරනායක යුගය බව අපට මේ අවස්ථාවේදී පිළිගන්න සිදු වී තිබෙනවා. ඒ කියන්නේ ඉතාමත් වැදගත් තීරණයක් ඒ කාලයේදී ගෙන තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා ඇති. මේ රටේ සෑම තැනම විහිදී තිබුණ, සමුපකාර සමිති ක්‍රමානුකූලව එක් බලවත් සංවිධානයක් යටතට ගැනීමට එදා කටයුතු යෙදුවා. එපමණක් නොවෙයි, විවිධ සේවා සමුපකාර ක්‍රමය ගැන අලුත් ස්වරූපයක්, අලුත් හැඟීමක් ඇති කර එය මහජනතාවගේ පුළුල් අවබෝධයට ලක්වන අන්දමට සකස් කර මහජනතාවගේ ව්‍යාපාරයක් හැටියට පරිවර්තනය කිරීමට කටයුතු කරන්න යෙදුනා. ඒ තාක් කල් සමුපකාර ව්‍යාපාරයේ යම් බලතල රාශියක් රජයේ නිලධාරීන් යටතේ නැත්නම් රජය යටතේ තිබුණාද, ඒ සියල්ල රජයෙන් ඈත් කර, සම්පූර්ණයෙන්ම මහජන ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නට වැදගත් පියවර දෙක තුනක් එදා තිබුණ රජය ගත් බව තමුන්නාන්සේට මතක ඇති.

එයින් එක් පියවරක් තමයි, කුඹුරු පනත ඇති කිරීම. විවිධ සේවා ක්‍රමයට පරිවර්තනය කළ සමුපකාර පනත දෙවැන්නයි. මහජන බැංකුව නමින් පිහිටුවන්නට යෙදුන. එවකට තිබුණ සමුපකාර සංවර්ධන බැංකු පනත තුන්වැන්නයි. මෙම පනත් තුන ඇති කිරීමෙන් අදහස් කළේ කුමක්ද යන්න අප හොඳට පැහැදිලිව සිතේ තබා ගන්න ඕනෑ. සමුපකාර ව්‍යාපාරයේ බලතල ඇමතිතුමාගේ යටතට ගන්නවාද, එහෙම නැත්නම් සමුපකාර ව්‍යාපාරයේ පාලනය මහජනයා අතට පත් කරනවාද යන්න ගැන පැහැදිලි අවබෝධයක් තිබෙන්න ඕනෑ. මගේ විශ්වාසයේ හැටියට එදා තිබුණ ආණ්ඩුව එම පියවර කිහිපය ගත්තේ සමුපකාරය ව්‍යාපාරය රජය සන්තක දෙයක් හැටියට තබා ගන්නටවත් ඇමතිවරුන්ගේ පාලනය යටතේ තියා ගන්නටවත් නොවෙයි. මේ රටේ විහිදී ගොස් තිබුණ සමුපකාර සමිති සියල්ල එක් කොට නියම සමුපකාර පදනමක් උඩ යම්කිසි අර්ථ ක්‍රමයක් සකස් කිරීමටයි එදා එම පියවර කිහිපය ගත්තේ. ඒ නිසා මෙම පනත ඉදිරිපත් කිරීමෙන් මේ ආණ්ඩුව ගෙන යන්නේ සමුපකාර ව්‍යාපාරයට ඇත්තවශයෙන්ම රුකුලක් දෙන වැඩපිළිවෙළක්ද එහෙම නැත්නම් අභාග්‍ය සම්පන්න තත්ත්වයක් ඇති කර දීමේ වැඩ පිළිවෙළක්ද කියන කාරණය ගැන අප තුළ අවබෝධයක් තිබිය යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended for half an hour. On resumption the hon. Deputy Chairman of Committees will take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் (திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா) தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු සභාපතිතුමනි, තේ පානයට ප්‍රථමයෙන් මා කථාව පටන් ගත්තා පමණයි. දැනට ගණපූරණයක් නැති වුණත් ඒ බව සඳහන් කර ගණ පූරණයක් ඉල්ලා සිටීමට මා කැමති නැහැ. ඒ මොකද? කැමෙන් බීමෙන් සතුටු සාමිච්ච පසු වන ආණ්ඩු පක්ෂයේ උදවිය දැන් දැන් එනවා ඇත යන හැඟීම උඩයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

ඒක හොඳ අදහසක්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඇමතිතුමා නම් පැමිණෙනවා. ඇමතිතුමාට විශේෂයෙන් පෙන්වා දිය යුතු කරුණු කීපයක් තිබෙනවා. අනාගතයේදී කොමිෂන් සභාවක් මගින් ලංකාවේ සමුපකාර ප්‍රතිපත්තිය සකස් කරන්නට බලාපොරොත්තු වී සිටින මේ මොහොතේ වැදගත් අදහස් කීපයක් එතුමාගේ සිතේ තබාගතහොත් මා හිතන හැටියට අනාගත සමුපකාර සංවර්ධනයට එය විශාල ප්‍රයෝජනයක් වෙනවා ඇති. ලංකාවේ සමුපකාර ක්‍රමය පිළිබඳව මුලින්ම සැලැස්මක් ඇති කෙළේ රොබට් ඕවන් ක්‍රමය උඩයි. නොයෙක් රටවල නොයෙක් විධියේ ක්‍රමවලට මෙම සමුපකාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙනවා. එංගලන්තය, ස්වීඩනය, ඩෙන්මාර්ක් ආදී රටවල එක්තරා විධියක සමුපකාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන අතර සමාජවාදී රටවල වෙනත් විධියක ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙනවා. සමාජවාදී රටවල නම් මුළු ආර්ථික පදනම, මුළු සමාජ පදනමම සම්පූර්ණයෙන්ම සකස් වී තිබෙන්නේ, බොහෝ දුරට සමුපකාර ක්‍රමය උඩ බව තමුන්නාන්සේ දන්නවා ඇති. එහෙත් ධනවාදී ස්වරූපය තිබෙන රටවල සමුපකාර ක්‍රමය ඊට වඩා වෙනස් තත්ත්වයකිනුයි ක්‍රියාත්මක වන්නෙ. ඒ අනුව බලන විට අපේ ලංකාවට සුදුසු ක්‍රමය කුමක්ද කියා තීරණය කිරීම කළ යුත්තේ අපම බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති.

විශෙෂයෙන්ම සෑම සාමාජිකයකුටම සම සාමාජිකත්වයක් ලැබීම, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, දේශපාලනයෙන් තොර වීම, මූල ධනයක් යෙදීම, සුළු ලාබයක් ලබ ගැනීම ආදී ප්‍රතිපත්ති උඩයි මුලින්ම ලංකාවේ සමුපකාර ක්‍රමය පටන් ගත්තේ. ඊටපසුව, යුද්ධ කාලයේදී මහජනතාවගේ බඩගිනි නිවාගැනීම පිණිස බඩු බාහිර දිය බෙදා හැරීමට පුළුල් ලෙස කටයුතු කිරීමට ආණ්ඩුවට සිදු වුණා. විශේෂයෙන්ම පිටකොටුවේ බලවත්ව සිටි බෝරාකාරයන් සහ ඉන්දියන්කාරයන් ලංකාවෙන් පිට වී ගියාට පසුව එය සකස් කර ගැනීමට පුළුවන්කම ලැබුණා. ඉන් පසුව සමුපකාර ව්‍යාපාරයේ වැදගත්කමක් තිබුණා නම් තිබුණේ අර කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවි කිරීමේ සමුපකාර සමිති ඇති කිරීමෙන් සෑහෙන දුරට කෘෂිකර්මය දියුණු තත්ත්වයකට පත් වීම නිසායි. එහෙත් ඇත්ත වශයෙන් 1956 න් පසුව තමයි සෑහෙන දුරට පුළුල් ලෙස සමුපකාරය දියුණු කළ යුතුය කියා තීරණය කෙළේ.

1956 න් පසුව යයි කියන විට ගරු රාජ්‍ය ඇමතිතුමා සිනහ වෙනවා. එහෙත් එතුමාට වම්පසින් සිටින කර්මාන්ත ඇමතිතුමාගෙන් ටිකක් අසා බැලුවොත් එතුමා කියාවි, විශෙෂයෙන්ම පෞද්ගලික වෙළෙන්දන්ට විරුද්ධව ඉතාම වැදගත් පියවර කීපයක් ගැනීමට—තීරණ රාශියක් ගැනීමට—එතුමාට සිදු වුණ බව. කොළඹ නගරයේ තිබුණු පෞද්ගලික බඩු බෙදා හැරීම සමුපකාර ව්‍යාපාරය යටතට ගන්නට වර්තමාන කර්මාන්ත ඇමතිතුමා එදා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටියදී වේගයෙන් ක්‍රියා කළා. ඇත්තෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1965 න් පසුව සමුපකාර ව්‍යාපාරය ආපසු ගමනක යෙදුණු බව කියන්නට පුළුවනි. එය කනගාටුදායකයි. බඩු බෙදා හැරීම සම්බන්ධයෙන් මේ රජයට පිළිගත් ප්‍රතිපත්තියක් නොමැති වීම මෙසේ වන්නට හේතුවයි. පෞද්ගලික, සමුපකාර, රජය යන අංශ තුනම මාධ්‍ය කොටගෙන බඩු බෙදා හරිනවාද? එසේ නැත්නම් සමුපකාර අංශයත්, රාජ්‍ය අංශයත් ඒ කටයුත්තට යොමු නොකොට පෞද්ගලික අංශය ලවාම එය කරගෙන යනවාද යන්න ගැන තවම මේ රජය තීරණයක් ගෙන නොමැති නිසයි, විශේෂයෙන්ම සමුපකාර ව්‍යාපාරයට පහර වැදී තිබෙන්නෙ. එසේ හෙයින් මේ ප්‍රශ්නය පැහැදිලි වශයෙන් නිරාකරණය කළ යුතුයි.

ගරු කෘෂිකර්ම ඇමතිතුමා ඉදිරිපත් කොට තිබෙන මෙම සංශෝධන පනත නිසා සමුපකාර රෙජිස්ට්‍රාර්වරයාගේ තත්වය කුමක්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. මෙම අලුත් සංශෝධන පනත යටතේ සමුපකාර රෙජිස්ට්‍රාර්වරයා වෙත තිබුණු සියලුම බලතල පැවරෙන්නේ ඇමතිවරයාටයි. මේ පනතේ යම් යම් වගන්ති කියවාගෙන යන විට රෙජිස්ට්‍රාර්වරයා සිටි තැන්වල ඇමතිවරයා සිටින බව පේනවා. සමුපකාර සමිති ලියාපදිංචි කිරීමට අදාළ බලතල තිබෙන්නේ රෙජිස්ට්‍රාර්වරයාට වුණත්, යම් සමිතියක සාමාජිකයන්ගේ අඩුපාඩුවක් හෝ පාලනයේ දුර්වලකමක් හෝ ඇති වුවහොත් ඒ සමුපකාර සමිතිය අවලංගු කිරීමට දැන් තිබෙන 1949 පනවන ලද, ආඥාපනත අනුව රෙජිස්ට්‍රාර්වරයාට බලයක් නැහැ. එවැනි ප්‍රතිපත්තියක් ඒ පනතෙන් ඉදිරිපත් කර තිබුණේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා මේ බලතල පාවිච්චි කරන්නට යන්නේ මොන ක්‍රමයක් යටතේදැයි අප ටිකක් කල්පනා කරන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් උදාහරණයක් වශයෙන් පසුගිය යුද්ධ කාලය ගැන සඳහන් කරන්නට පුළුවනි. යුද්ධ කාලයේදී වුණත් පැවතුණේ දැන් තිබෙන ක්‍රමයේ පාලන යන්ත්‍රයක් නොවෙයි. එදා තිබුණේ යටත් විජිත පාලනයක්. ඒ යටත් විජිත පාලනයෙන් පැන නැඟුනු සැලැස්මේ අදහස්ම ගැබ් කරගෙන ක්‍රියා කරන්නට ඇමතිවරයා කල්පනා කරනවා නම් එය සාධාරණ පාලන ක්‍රමයක් යයි කියන්නට බැහැ.

සමුපකාර ව්‍යාපාරය සඳහා සාමාජිකයන් බන්දවා ගැනීම ඉතාමත්ම වැදගත් කාරණයක්. එහෙත් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ඒ සඳහා කිසිම පියවරක් ගෙන නැහැ. වැඩිපුර සාමාජිකයන් සමුපකාර ව්‍යාපාරයට බන්දවා ගැනීම සඳහා මේ ආණ්ඩුව කිසිම ප්‍රචාරක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැහැ. සමුපකාරයේ තිබෙන උතුම් පරමාර්ථ මේවා යයි පෙන්නුම් කිරීම සඳහා ක්‍රියා නොකිරීමේ හේතුවෙන් අද මහජනයා සමුපකාරයෙන් ඇත් වීගෙන යනවා. එම නිසා 1962 සහ 1963 යන වර්ෂවලදී අපට සිද්ධ වුණා, අළුත් කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීමේ වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යන විට, මේ රටේ සමුපකාර ව්‍යාපාරවලට සම්බන්ධ වීමෙන් ලැබෙන වරප්‍රසාදයන් ගැන විශාල ප්‍රචාරයක් ගෙන යාමට. නමුත් මේ රජය එබඳු ප්‍රචාරයක් මේ මොහොත දක්වාම ගෙන යන බවක් පෙනෙන්න නැහැ. ඉදිරියටත් එබඳු වැඩ පිළිවෙළක් සකස් කරාවිය කියන විශ්වාසයක් තබන්න බැහැ.

ගරු සභාපතිතුමනි, කෘෂිකාර්මික ප්‍රදේශවල සමුපකාර සමිතිවලට ණය පහසුකම් සලසා දීමේ අලුත් වැඩ පිළිවෙළක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ කෘෂිකාර්මික කටයුතු දියුණු කර ගැනීම සඳහා සමුපකාර සමිතිවලට විශාල වශයෙන් ණය පහසුකම් වෙළඳ බැංකුවලින් ලබා දීමයි ඒ අලුත් වැඩ පිළිවෙළ. කලින් ගොවිජන සේවා කොමසාරිස්තුමාගේ මාර්ගයෙන් මෙම සමිති වලට ණය ලබාගත හැකිව තිබුණා. එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම වෙනස් කොට, ඒ වෙනුවට සමුපකාර සමිතිවලට අවශ්‍ය මුදල් වෙළඳ බැංකුවලින් ලබා දීමට කටයුතු යෙදීමයි, ඇමතිතුමාගේ අළුත් සැලැස්ම.

නමුත් මෙයින් සිදු වී තිබෙන්නේ මොකක් ද? ඇති වී තිබෙන තත්ත්වය කුමක් ද? යම් අවස්ථාවකදී කලින් බලාපොරොත්තු නොවුණු ආපදාවකින් නියඟයෙන් හෝ වෙනත් ස්වභාවික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
ආපදාවකින් හෝ වෙනත් හේතුවකින් තමන්ගේ වගාව විනාශ වී ගියා නම්, අස්වැන්න නොලැබී ගියා නම්, ගොවියාට දුන් ණය ආපසු ගෙවීමේ වගකීම කෙලින්ම සමුපකාර සමිතියට පවරනවා; වෙළඳ බැංකුවෙන් ලබාගත් ණය පියවීමේ සම්පූර්ණ බර සමුපකාර සමිතියට පැවරෙනවා. කලින්, ගොවිජන සේවා කොමසාරිස්තුමා අනිවාර්ය වශයෙන්ම සමුපකාර සමිතිවලට ණය ලබා දුන්නා. නමුත් අද ඒ අන්දමට අනිවාර්ය වශයෙන්ම ණය ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කර නැති නිසා, ගොවියාට ලැබිය යුතු ණය පහසුකම් ලැබෙන්නේ නැහැ. එම නිසා සමුපකාර සමිතිවලට ලබා දිය යුතු ණය මුදල්, අවශ්‍යයෙන්ම දිය යුතු ණය මුදල්, පහසුවෙන් ලබා ගැනීමට මාර්ගයක් නොමැති වීමෙන් තමුන්නාන්සේලා අපේක්ෂා කරන සශ්‍රීක භාවය කවදාවත් ලබාගන්න හැකි වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, සමුපකාර සමිති අද පරිහාණියට වැටී තිබෙන්නේ අවශ්‍ය තරම් මූලික ධනයක් නොමැතිකම නිසයි. ගමක, ඕනෑම සුළු සමුපකාර සමිතියක් දිහා බැලුවාම, ඕනෑම සංගමයක් දිහා බැලුවාම, පුදුම අන්දමින් ඒවායේ තත්ත්වය පහත වැටීගෙන එන බව පෙනී යනවා; පාඩු සිදු වෙගෙන යනවා. කිසිම ව්‍යාපාරයකින් ලාබ ලැබෙන්නේ නැහැ; මුදල් ලැබෙන්නේ නැහැ. පාරිභෝගික අංශය අඩපණ වී තිබෙනවා. ගරු කර්මාන්ත ඇමතිතුමා ආරම්භ කළ විවිධ සේවා සමුපකාර සමිති ව්‍යාපාරය එහෙම පිටින්ම ගම්වලින් අහෝසි වෙමින් පවතිනවා. එබඳු තත්ත්වයට පත්ව තිබෙන්නේ නොයෙකුත් සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කිරීමට තරම් අවශ්‍ය මූල ධනයක් නොමැති වීම හේතුකොට ගෙනයි. එම නිසා, හිතු මනාප අන්දමට ණය දෙනවා වෙනුවට යම්කිසි සමුපකාර සමිතියක් ණය ඉල්ලා සිටියොත්, අනිවාර්යෙන්ම එම සමිතියට ණය පහසුකම් සලසා දෙන ලෙස වෙළඳ බැංකුවලට නියම කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමතියි. එහෙම නැති නම්, එබඳු පහසුකමක් සැලසීමට හැකි අයුරින් ආඥා පනතකින් හෝ නියමයක් කිරීම ඇමතිතුමාගේ යුතුකමක් හැටියට මේ අවස්ථාවේදී පෙන්නා දෙන්න කැමතියි.

ඊළඟට, සියයට දොළහේ ණය ක්‍රමය ගැනත් කියන්නට සිදු වී තිබෙනවා. ගරු ඇමතිතුමා මේ ගරු සභාව තුළදී අනන්තවත් බැණුම් අහන්නේ, ඔය ප්‍රශ්නය සම්බන්ධයෙනුයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් හැම දාමත් කියන්නේ, සියයට දොළහේ පොළිය අඩු කිරීම සඳහා වැඩ පිළිවෙළක් යොදන හැටියටයි. මේ ක්‍රමය අනුව ණය දෙන්නේ වෙළඳ බැංකු වුණත්, වෙළඳ බැංකු දෙන ඒ ණය පිළිබඳව වගකියන්නා හෙවත් ආරක්ෂකයා වශයෙන් ශ්‍රී ලංකා මහා බැංකුව සියයට එකක පොළියක් අය කරනවා. ණය දෙන වෙළඳ බැංකුත් සියයට දෙකතුනක පොළියක් අය කරනවා. ඒ වාගේම, වෙළඳ බැංකුවෙන් ණය ලබා ගෙන ගම්බද කුඩා සමුපකාර සමිතිවලට, කෘෂිකාර්මික සංවිධානවලට ණය දෙන මහා සමුපකාර සංගම් හා මහා කෘෂිකාර්මික සංගම් සියයට හතරක පමණ පොළියක් අය කරනවා. මේ ක්‍රමය අනුව දිගටම ඇවිත්, අන්තිමටම ණය ලබා ගත් කුඩා සමිති සමාගම් ගම්බද ගොවියාට ණය දීමේදී සියයට තුන හතරක පොළියක් අය කරනවා. ඔය ක්‍රමය අනුව අවසානයේදී සාමාන්‍ය ගොවියාට, සිය ණය මුදල් වෙනුවෙන් අර සියලුම පොළී එකතු කොට සියයට දොළහක පමණ පොළියක් ගෙවන්නට සිදු වෙනවා. මෙය ඉතා අසාධාරණ ක්‍රමයක්. පොළියට මුදල් දෙන වෙට්ටියාර්ලාවත් සියයට දොළහක පොළියක් ගන්නේ නැහැ. ඔවුන්ගෙන් සියයට එකොළහක පමණ පොළියට ණයට මුදල් ගන්න, ගම්බද මිනිසුන්ට පුළුවන්කම ලැබෙනවා. මෙසේ අධික පොළියක් අය කිරීමෙන් ගම්බද සාමාන්‍ය ජනතාව ණය බරින් මිරිකෙන බව අප මතක තබා ගන්න ඕනෑ. එම නිසා, සියයට දොළහක විශාල පොළියක් ගෙවීමට අසරණ ගොවියාට ඉඩ නොතබා, මේ සම්බන්ධයෙන් යම්කිසි සහනදායක සැලැස්මක් ඉදිරිපත් කරනවා නම්, වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම්, එය ඉතාමත් හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර සමිතිවල පාලන කටයුතු හරියාකාරව නොකිරීමෙනුත් සමුපකාර ව්‍යාපාරයට ඉතාමත් විශාල බාධා ඇති වෙනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයෙන් ඒ පිළිබඳ නිදර්ශනයක් පෙන්වන්නට පුළුවනි. කැලැපෙතිමුල්ලේ සමුපකාර ණය දෙන සමිතිය පිහිටුවන ලද්දේ 1931 දීයි. ඒ ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාවට විශාල වශයෙන් මුදල් ණයට ලැබුණා නම් ලැබුණේ, ඒ සමුපකාර සමිතියෙනුයි. එහෙත් සමුපකාර නිලධාරීන් හරිහැටි කටයුතු නොකිරීම නිසා, පරීක්ෂා නොකිරීම නිසා, ඒ සමිතිය සතු රුපියල් 94,000 ක පමණ මුදලක් නැති වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දැනටමත් උසාවිය ඉදිරියේ නඩුවක් තිබෙන නිසා, ඒ ගැන මීට වඩා විස්තර කරන්නට මා අදහස් කරන්නේ නැහැ. සමුපකාර පරීක්ෂකවරුන්ගේ අඩුපාඩුකම්, අදක්ෂකම් නිසයි. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. විශේෂයෙන් "ඔඩිට්" අංශයේ, හෙවත් ගිණුම් පරීක්ෂා කිරීමේ අංශයේ නිලධාරීන්ගේ දුර්වලකම් නිසා, එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා. සමුකාර කටයුතු සම්බන්ධයෙන් මීට වඩා හොඳ නිලධාරි මණ්ඩලයක සේවය ලබා ගන්නට පළුවන් නම්, විශේෂයෙන් ගම්බද සමපකාර සමිතිවල දියුණුවට, පැවැත්මට එය හුඟාක් දුරට උපකාරී වෙනවා.

සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කිරීම සඳහා ගරු ඇමතිතුමා ආණ්ඩුව තුළ සටනක් ගෙන යන බවක් අපට නම් පෙනෙන්නේ නැහැ. එතුමාගේ දකුණු අත පැත්තේ වාඩි වන රාජ්‍ය ඇමතිතුමා පෞද්ගලික අංශය භාරව කටයුතු කරන නිසා, සමුපකාර අංශය ආරක්ෂා කර ගැනීම සඳහා විශාල සටනක් කරන්නට සිදු වී තිබෙනවා. එහෙත් පෞද්ගලික අංශයේ දියුණුව පතන රාජ්‍ය ඇමතිතුමාගෙන් සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීම සඳහා, ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා ඒ තරම් උනන්දුවෙන් සටන් කරන බවක් අපට නොපෙනෙන බව කණගාටුවෙන් වුණත් නැවතත් කියන්නට සිදුවී තිබෙනවා. ලූනු, මිරිස්, උම්බලකඩ ආදිය කලං, මංචාඩි ගණනින් බෙදා දෙන්නට සිදුවුණ අවස්ථාවේදී අපේ ගම්වල විශාල ආහාර හිඟයක් ඇති වුණ බව අප දන්නවා. එම හිඟය කොතරම් දුරට තිබුණද කිව්වොත් ඇත්ත වශයෙන්ම සමුපකාරය මගින් දෙන ආහාර ටික වුවත් කලට වේලාවට ලැබුණේ නැහැ. අපේ ප්‍රදේශය විශාල අන්දමින් ආහාර හිඟයෙන් මිරිකුණු ප්‍රදේශයක් බවට පරිවර්තනය වුණා. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ සිටින අපට වුවත් මේ පිළිබඳව යම්කිසි පියවරක් ගන්නට සිදු වුණා. අපට පෙනී ගියා රජය වැඩිපුර සැළකිල්ලක් දක්වන්නේ පුද්ගලික අංශයට බව. කරුණාකර අපේ ප්‍රදේශයටත් ආහාර ද්‍රව්‍ය ටිකක් සපයන්නටය කියා මා ඉල්ලා සිටියා. අපි වෙළෙන්දන් ටික සංවිධානය කොට පුද්ගලික අංශයේ තත්ත්වයක් ඇති කළ හෙයින් ඒ උදවිය මාර්ගයෙන් අපේ ආහාර ද්‍රව්‍ය ටික දැන් බෙදා හැරෙනවා. එහෙත් මා එක කාරණයක් මතක් කරන්නට කැමතියි. එම ක්‍රියා මාර්ගය වුවත් ඉතාම යෝග්‍යයයි මා දැන් විශ්වාස කරන්නේ නැහැ. authorized dealers කියන උදවිය ඊට කලින් ලැබුණු ද්‍රව්‍ය ප්‍රමාණයන් පවා ගම්බද සුළු වෙළෙන්දන්ට දුන්නේ නැහැ. ඒ උදවියගේ හිතවතුන්ට හෝ ප්‍රදේශයෙන් පිට පළාත්වලට හෝ ඒවා දුන්නා. එම නිසා අපේ ප්‍රදේශවලට වුවමනා ආහාර ප්‍රමාණය ඔවුන්ගෙන් අපට ලැබුණේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තොග වෙළෙන්දෝ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
තොග වෙළෙන්දෝ තමයි. තමුන්නාන්සේත් මාත් මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. තමුන්නාන්සේ දකුණු අළුත්කුරු කෝරළේ මෙවැනි සංවිධානයක් ඇති කළා. අපි උතුරු අළුත්කුරු කෝරළේ බී කොට්ඨාශයේ මෙවැනි සංවිධානයක් ඇති කළා. [බාධා කිරීමක්] තොග වෙළෙන්දාය කියන පුද්ගලයාගෙන් නියම වශයෙන් ආහාර ටික සුළු වෙළෙන්දාට ලැබුණේ නැහැ. එහෙත් මෙම සංවිධාන ඇති කළාසින් පසු එදාට වඩා බඩු ලැබෙනවා. එහෙත් අද සිදු වීගෙන යන්නේ කුමක්ද? පුද්ගලික වෙළෙන්දාත් සමුපකාරයත් අතර විශාල තරඟයක් ඇති වේගෙන යනවා. එනම්, කාටද වැඩිපුර බඩු ලැබිය යුත්තේ කියන තරඟයයි. මෙම තරඟය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
ගමේ පමණක් නොව සී. ඩබ්ලිව්. ඊ. එක ඇතුළේත් යනවා. සමහර විට ඇමති වරුන් අතරත් මෙම තරඟය පවතිනවා ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
විරුද්ධ පාර්ශ්වයේත් තිබෙනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
අපට බෙදාහැරීමේ තරඟයක් කොහොම වත් ඇත්තේ නැහැ. අප එවැනි දෙයක් බලාපොරොත්තු වන්නේත් නැහැ. එසේ හෙයින් සමුපකාරය ආරක්ෂා කරනවාද පුද්ගලික අංශය ආරක්ෂා කරනවාද කියන තීරණය ගන්නට ඇමතිතුමාට සිදු වී තිබෙනවා. [බාධා කිරීමක්] අපි කියන්නේ රජයයි සමුපකාරයයි පුද්ගලික අංශයයි කියන තුන ගැනයි.

මාකටින් ඩිපාට්මන්ට් එක හැරෙන්න තමුන්නාන්සේගේ සී. ඩබ්ලිව්. ඊ. එක සම්පූර්ණයෙන්ම රජයේ ආයතනයක් හැටියට පරිවර්තනය වුණා. ඒ මගින් බඩු බෙදා හැරියා. එහෙත් අපේ කොට්ඨාශවල තිබුණු සී. ඩබ්ලිව්. ඊ. ආයතන වසා දැම්මා. [බාධා කිරීමක්] මගෙ අම්මේ, දිවුල පිටිය කොට්ඨාශයේ තුනෙන් දෙකක් කැපුවා. Retail Stores—Divulapitiya was closed down; Madampella was closed down. සී. ඩබ්ලිව්. ඊ. එකේ කිසිම වංචාවක් වුණේ නැහැ. [බාධා කිරීමක්] දිවුලපිටියේ නම් කිසිම වංචාවක් වුණේ නැහැ. තමුන්නාන්සේ කියනවාද, එහි වංචාවක් වුණාය කියා. වුණේ නැහැ. මඩම් පැල්ලේ වංචාවක් වුණේ නැහැ. කීනදෙනි යේ වංචාවක් වුණේ නැහැ. බෝතලේ ගමේ කීනදෙනිය කියන ප්‍රදේශයේ එකක් තිබ්බා. ඒකත් වසා දැම්මා. [බාධා කිරීමක්] රජයේ අංශයත් පුද්ගලික අංශ යත් සමකාර අංශයත් කියන තුනයි අපේ ප්‍රතිපත්තියක් හැටියට තිබ්බේ. එහෙත් අද ක්‍රමක්‍රමයෙන් සමුපකාර අංශය අඩු වෙන අතර පද්ගලික අංශය වැඩි වේගෙන යනවා. ඊයේ පෙරේදා ආණ්ඩු පක්ෂයේ සිටින මස්කෙළියේ ගරු මන්ත්‍රීතමා (එඩ්මන්ඩ් විජේසූරිය මයා.) මේ ගැන පැහැදිලි වශයෙන් කරුණු කිව්වා. එතුමා අද මෙම ස්ථානයේ සිටියා නම් සමුපකාර සම්මේලනයේ සභාපතිවරයා වශයෙන් කියනවා ඇති, කුමන ආකාරයකටද සමුප කාර අංශයටත් පුද්ගලික අංශයටත් රජය සලකන්නේ කියා. ඒ නිසා මේ ක්‍රම දෙක පිළිබඳව පැහැදිලි විස්තරයක් කරන ලෙස මා ගරු අමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සමුපකාර අංශයත් පෞද්ගලික අංශයත් අතර තරඟය මේ පිළිවෙළට තිබෙන්නට හැරියොත් අවසානයේදී සමුපකාර අංශ යත් මිරිකී යන්නට පුළුවන්ය, පෞද්ග ලික අංශයත් මිරිකී යන්නට පුළුවන්ය කියා අප තුළ ලොකු සැකයක් තිබෙනවා. එම නිසා පිටරටින් බඩු ගෙන්වීම සම්බන්ධ යෙනුත් මෙරට තුළ බඩු බෙදා හැරීම සම්බන්ධයෙනුත්, පෞද්ගලික අංශයත් සමුපකාර අංශයත් රජයේ අංශයත් යොදා ගන්නේ කොයි පිළිවෙළටද යන්න ගැන කරුණු කර ප්‍රකාශයක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් එක කාරණයක් කියන්නට තිබෙ නවා. සිංහල මිනිසාගේ වාණිජ දක්ෂකම පෙන්වීමට අවස්ථාව ලැබුණේ—වාණිජ දක්ෂකම තවත් දියුණු කර ගැනීමට අවස් ථාව ලැබුණේ—සමුපකාර ව්‍යාපාරය ඇති වුණායින් පසුව බව කව්රුත් පිළිගන්න කාරණයක්. පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලය වැනි තැන්වලින් අධ්‍යාප නය ලත් අය විශාල සංඛ්‍යාවක් අද රටේ සැම තැන්වලම රක්ෂාව නැතිව සිටිනවා. මේ අය පුහුණු කිරීම සඳහා රජය විශාල වියදමක් දරා තිබෙන බව ඇත්තයි. එහෙත් මේ අයගෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්න බවක් පෙනෙන්නෙ නැහැ. පෞද් ගලික ස්ථානයක හෝ සමුපකාර සමිතියක හෝ රක්ෂාවක් ඇති වුණොත්, ඉල්ලුම් පත්‍ර යවා ඇතුළත් වීමේ වරප්‍රසාදය පම ණක් ඒ අයට තිබෙනවා. මේ අයගේ දැනීමෙන් ප්‍රයෝජන ගන්නට ආණ්ඩුව ස්ථිර වැඩපිළිවෙළක් සකස් කර නැහැ. ඒ අයට කෙළින්ම රැකියාව දෙන්නය කියා මා කියන්නෙ නැහැ. ඒ අයට රැකියාව කිරීමට අවස්ථාවක් සලසා දෙන්නට ඕනෑ. පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාල යෙන් සමත් වන උදවියට රැකියාවක් කර ගැනීමට හෝ වෙළඳ ව්‍යාපාරයක් පටන් ගැනීමට හෝ ණය මුදලක් දෙන්නට ඕනෑ. ග්‍රාමීය මට්ටමේ තිබෙන සමුපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංගම්වලිනුත් දිස්ත්‍රික් සමුපකාර සංගම් වලිනුත් ලැබුණු විශාල තැන්පත් මුදලක් ලංකා සමුපකාර ඒකාබද්ධ සංගමයේ තිබෙනවා. ඒ මුදල කිසි ප්‍රයෝජනයකට ගන්නෙ නැතිව පුස් කකා තිබෙනවා. ඒ නිසා එවැනි උදව්ය සඳහා යම්කිසි වැඩපිළිවෙළක් යෙදීමේදී ගරු ඇමතිතුමාට මේ මුදල යොදන්නට පුළුවන්කමක් තිබෙනවා නම් එයින් ඔවුන්ට විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා.

සමුපකාර ව්‍යාපාරයේ දුර්වල තැන් රාශියක් තිබෙන බව අපට පෙනෙනවා, ඒ අතරම සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම ටත් අවස්ථාවක් තිබෙනවා. සමුපකාර ව්‍යාපාරයේ අනාගතය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව කිසිම ස්ථිර ප්‍රතිපත්තියක්—ස්ථිර වැඩ පිළිවෙළක්—අනුගමනය කරන බවක් අපට පෙනි නැහැ. සමුකාර ව්‍යාපාරය අළුත් දෙයක් හැටියට ඉදිරිපත් වූ මුල් කාලයේදී එක්සත් ජාතික පක්ෂයත් ඊට ලැදිකමින් කටයුතු කළ යුගයක් තිබුණා. ඊට පසුව ඇති වූ බණ්ඩාරනායක යුගවලදී සමාජවාදී රජයකට සමාජවාදී ප්‍රතිපත්ති අවශ්‍යය යන හැඟීම උඩ සමුපකාර ව්‍යාපාරයේ විශාල දියුණුවක් ඇති වුණා. නමුත් ආණ්ඩුව වෙනස් වූවාත් සමගම සමුපකාර ව්‍යාපාරය එකවරම ගිලා බැස ගෙන යෑමේ තත්ත්වයකට පත් වුණා. ඒ ගිලාබැසගෙනයෑම එතරම් හොඳ ලකුණක් ය කියා මා විශ්වාස කරන්නේ නැහැ. සම හර විට මේ රටේ සමුපකාර ව්‍යාපාරයේ අවසානය තෙක් ඒ ගිලාබැසීම කෙරෙන්නට පුළුවනි. එවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීමට තිබෙන එකම මාර්ගය මේ ව්‍යාපාරය දියුණු කිරීමට රජයේ සහයෝගය දීමයි. රාජ්‍ය අංශයත් සමුපකාර ව්‍යාපාරයත් අතර තිබෙන මිත්‍රත්වය පළුදු වුණොත් වාසිය ලබා ගන්නේ ගසා කන්නායි; කූට වෙළෙන්දායි; කළු කඩකාරයායි.

මේ ආණ්ඩුව බලයට පත් වූ සැටියේම සමුපකාර ව්‍යාපාරය විනාශ කරන්නට රාජ්‍ය අංශය කටයුතු කරනවාය කියා හැඟීමක් ඇති වුණා. ඒ හැඟීම නිසා මේ රටේ සමුකාර ව්‍යාපාරයට විශාල පහරක් වැදුණා. සමුපකාර ව්‍යාපාරය අද මෙවැනි දුර්වල තත්ත්වයකට වැටී තිබෙන්නේ අන්න ඒ හැඟීම මේ රටේ ප්‍රචාරය වූ නිසයි. සමුපකාර තොග වෙළඳ ආයතනය මේ රටේ සමුපකාර ව්‍යාපාරයට පහරක් ගසන්නට ඇති කළ ව්‍යාපාරයක්ය කියාත් නමුන්නාන්සේලා රටේ ප්‍රචාරයක් ගෙන ගියා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය නැවතත් තිබුණු තත්ත්වයට ගෙන ඒමට මේ ආණ්ඩුවට පුළුවන් වේවියයි මා නම් විශ්වාස කරන්නේ නැහැ. නමුත් මේ අවස්ථාවේදී හෝ ඇත්ත වශයෙන්ම මේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කළ යුතුය කියා කල්පනා කර, නිදැල්ලේ වැඩ කරන යම් ශ්‍රමයක් තිබෙනවාය, අපතේ යන යම් ශ්‍රමයක් තිබෙනවාය කියා කල්පනා කර පියවරක් ගත්තොත්, අනාගතයේදී හෝ අද මේ දුර්වල තත්ත්වයකට වැටී තිබෙන සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට පුළුවන් වෙනවා. එසේ ක්‍රියා නොකළොත් සමුපකාර ව්‍යාපාරය අහෝසි වන්නට ඉඩ තිබෙනවා.

අ. භා. 5

එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)
(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)
(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පුළුල් වශයෙන් සමුපකාර ව්‍යාපාරය ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අපේ රටේ පොදු ජනතාවගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම පිණිස මෙතෙක් කල් සමුපකාර ව්‍යාපාරයෙන් කොයි තරම් ප්‍රයෝජනයක් ලැබී තිබෙනවාද යන්න සොයා බැලීමට හැකි තත්ත්වයක් දැන් තිබෙනවා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය ගැන සොයා බැලීමේ, කරුණු පරීක්ෂා කර බැලීමේ කොමිෂන් සභාවක් පත් කරන්නට ගරු ඇමතිතුමා අදහස් කරනවාය කියාත් අපට දැනගන්නට ලැබී තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නියම තත්ත්වය කුමක්ද කියා අප දන්නේ නැහැ. ඒ පත් කරන්නට යන කොමිෂන් සභාව ඒක පුද්ගල කොමිෂන් සභාවක්ද නැත්නම් පුද්ගලයින් කීප දෙනෙකුගෙන් යුත් කොමිෂන් සභාවක්ද? ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී ඒ ප්‍රශ්නයට උත්තරය ලැබේවියයි මා විශ්වාස කරනවා. නමුත් මේ අවස්ථාවේදීම ඒක පැහැදිලි කළොත් මගේ කථාව කෙටි කරන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)
එක් කෙනෙකුට වැඩියි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
එසේ නම් දීර්ඝ වශයෙන් කථා කිරීම අවශ්‍යයයි මා සිතන්නේ නැහැ.

දැන් තිබෙන තත්ත්වය අනුව කාල පරිච්ඡේද දෙකකට බෙදා මේ රටේ සමූපකාර ව්‍යාපාරය ගැන කරුණු පරීක්ෂා කර බලන්නට සිද්ධ වී තිබෙනවා. පළමුවෙන් 1956 වන තෙක් සමූපකාර ව්‍යාපාරයෙන් මේ රටේ පොදු මහජනතාවගේ නිෂ්පාදන කටයුතුවලටත්, පාරිභෝගික කටයුතුවලටත්, වෙළඳ ව්‍යාපාරාදියටත් කොයි තරම් සේවයක් වූවාද කියා බැලිය යුතුයි. 1956න් පසු වර්තමාන කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා එවකට සමූපකාර ඇමති වශයෙන් වැඩ කළ කාලයේදී පිරිසිදු සිතින් සමූපකාර ව්‍යාපාරයේ යම් වෙනසක් කිරීමට පියවර කිපයක් ගත්තා. ඒ පියවරවල් අරගෙනත් දැන් අවුරුදු දහයක් ගත වී තිබෙනවා. දෙවනුව මේ කාල පරිච්ඡේදය තුළදී, එනම් 1956 න් පසු, සමූපකාර ව්‍යාපාරයෙහි ඇති වූ වෙනස කුමක්ද කියා සොයා බැලිය යුතුයි. මේ ආකාරයට කාල පරිච්ඡේද දෙකකට බෙදා මේ රටේ සමූපකාර ව්‍යාපාරය ගැන කරුණු පරීක්ෂා කර බලා වර්තමාන තත්ත්වයට ගැළපෙන පරිද්දෙන් ප්‍රතිකර්ම යෙදීමේ අවශ්‍යතාවක් දැන් තිබෙනවා.

විශේෂයෙන්ම මුල් කාලයේ සිටම අපේ රටේ සමූපකාර ව්‍යාපාරය මගින් බොහෝ දුරටම සිත යොමු කරවා තිබෙන්නේ පරිභෝජනය ගැනයි. බඩු බාහිරාදිය බෙදා හැරීමේ කටයුතුවලට—වෙළඳාමට—මිස වැඩි පුර නිෂ්පාදන කටයුතුවලට හිත යොමු කරන්නෙ නැහැ. අද සමූපකාර ව්‍යාපාරය බොහෝදුරට තිබෙන්නේ ඒ තත්ත්වයේයි. අපේ වැනි රටක සමූපකාර ව්‍යාපාරය ඒ විධියේ අංශයකට පමණක් සීමා කිරීම සුදුසුයයි මා හිතන්නේ නැහැ. ගම්බද ජනතාව තුළ පොදු හැඟීම් ඇති කර වැඩ කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන ගැන කල්පනා කර බලන විට, වැරදී වැළැක්වී

මේ ක්‍රම ඇතිව සමූපකාරය පිළිබඳව ගම්බද මහජනතාවට හරි අවබෝධයක් ලබා දෙනවා නම් මීට වඩා ප්‍රයෝජනවත් වැඩි කොටසක් නිෂ්පාදන අංශයෙනුත්, පරිභෝජන අංශයෙනුත් ලබා ගැනීමට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. එම නිසා සමූපකාර ව්‍යාපාරයේ පරිවර්තනයක් ඇති කරන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා නම් එවැනි අංශයන් ගැන හිත් යොමු කිරීම වැදගත් බවයි මා කියන්නේ. බොහෝවිට මා හිතන දෙයක් තමයි, සමූපකාර ක්‍රම පාසල් විෂයයක් වශයෙන් අපේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උගන්වන්න පුළුවන්ද කියන කාරණය. අද ගම්බදව සමූපකාර ව්‍යාපාරය බොහෝ දුරට අසාර්ථක වී තිබෙන්නේ සමූපකාර ව්‍යාපාරය ගැන ගම්බද මහජනතාව තුළ තිබෙන අවබෝධයේ අඩුකම නිසයි. මේ ක්‍රමය ගැන ආශාවක් තිබෙන නමුත් අවබෝධයේ අඩුකම නිසා සමූපකාර ක්‍රමයට ආරම්භ කරන ඇතැම් කටයුතු කල් යාමේදී අසාර්ථක වෙනවා.

1956 දී පටන් ගත් විවිධ සේවා සමූපකාර සමිති අද හුඟක් දුරට අඩු වී ගොස් දැන් සමිති ඒකාබද්ධ කිරීමේ ක්‍රමයකටත් හිත යොමු කරන්නට දෙපාර්තමේන්තුවට සිදු වී තිබෙනවා. මේ කාරණය නිසා සමූපකාර ව්‍යාපාරය පස්සට ගියා කියන හැඟීමකුත් ඇති වෙනවා. අපේ නිෂ්පාදන කටයුතු වැඩි කර ගැනීමටත්, මහජනතාවට පහසුවෙන් බඩු බාහිරාදිය ලබා ගැනීමේ ක්‍රම යෙදවීමටත් මේ සමූපකාර ව්‍යාපාරයේ ප්‍රයෝජන ලබා ගැනීමට අපට සිදු වෙනවා.

අද බොහෝ සමූපකාර සමිති අහෝසි වී යන තත්ත්වයට පත්ව තිබෙන්නේ අදක්ෂ පාලනය නිසයි. පාලන අදක්ෂතා ගැන කල්පනා කරන විට සමිතිවල කාරක සභාවලටත්, දෙපාර්තමේන්තුවටත් යන දෙපැත්තටම දොස් කියන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. කාරක සභාවලට පැවරෙන වගකීම හරියාකාර ඉෂ්ට කරන්නට තරම් ගණනාධිකරණය ආදී විෂයයන් ගැන අවබෝධයක් තිබෙන අය සොයා ගැනීම අපහසුයි. එවැනි අවබෝධයක් තිබෙන අයන්ට මෙවැනි දේවලට කාලය මිඩංගු කිරීම ලෙහෙසි වැඩක් නොවෙයි. එහෙම දැනුමක් තිබෙන උදවිය කාරක සභාවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් කරනවා නම් ඔවුන්ට වේතනයක් දෙන්නට සිදු වෙනවා. අනික් පැත්තෙන් බැලුවාම දෙපාර්තමේන්තුවේ පරීක්ෂක යින්ට සමුපකාර සමිති විස්සක්-තිහක් පරීක්ෂා කිරීම පැවරී තිබෙන නිසා ඔවුන් වත් මේ කටයුත්ත හරියාකාර කරන්නට පුළුවන්කමක් නැහැ. මේ කරුණු දෙක නිසා වැදගත් ව්‍යාපාරයක් වන සමුපකාර ව්‍යාපාරය දැන් මහජනයාට එපාවන විධියට සකස් වී ගෙන යනවා. සමුපකාර ව්‍යාපාර යේ විශාල මුදලක් පරිහරණය වන නමුත් ඒ මුදලේ නියම ප්‍රයෝජනය පොදු මහජන තාවට ලබා ගැනීමට අවස්ථාව සැලසෙන් නේ නැහැ. ඒ නිසා සමුපකාර සමිතිවල පරි පාලනය දැන් සම්පූර්ණයෙන්ම සකස් කළ යුතුව තිබෙනවා. එක්කෝ සමුපකාර සමිති ගැන විශේෂ පරීක්ෂණ පැවැත්වීම සඳහා නිලධාරීන් පත් කරන්නට ඕනෑ. අද තිබෙන තත්ත්වයේ හැටියට නම් සමුප කාරය ගැන හරි අවබෝධයක් ඇති පොදු පිරිසක් බිහිවන තුරු එක සමුපකාරයක් භාරව එක රජයේ නිලධාරියකු බැගින් සිටි යත් වරදක් නැහැ කියා මා විශ්වාස කරනවා. එසේ නොවනවා නම් වන්නේ මුදල් අපතේ යෑමකට නැත්නම් විශාල මුදල් නාස්තියකට අප මුහුණ පෑමයි. ඒ පමණක් නොවෙයි, මෙවැනි වැදගත් ව්‍යා පාරයක් මහජනතාවට පිළිකුල් වන්නටත් පුළුවන්. මහජනතාවට එය තිත්ත වන්න ටත් පුළුවන්. එසේ වුණොත් නැවත එය මහ ජනතාවට රුචි කර, මහජනයා එයට කැමති කර, නැවතත් එය මහජනතාවට ආපසු දිය නොහැකි තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා කාලපරිච්ඡේදයන් දෙකක තත්ත්ව යන් ගැන පරීක්ෂා කර බලා, මහජනතාව හිතට අරගෙන අපේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කර ගැනීමට මෙය මෙහෙයවා නැත් නම් යොදවා තිබෙන්නේ කෙසේද කියා බලාගැනීමට ගරු ඇමතිතුමාට මෙය හොඳම අවස්ථාවක්. ඒ එකක්.

දෙවැනි කරුණ ව්‍යාපාරය සාර්ථක කර ගැනීම පිණිස අවශ්‍ය සංවිධාන සකස් කර ගැනීමයි. හැමදාමත් වගකීම කාරක සභා වට පවරා දෙපාර්තමේන්තුව නිකම් පරීක් ෂණ තත්ත්වයෙන් කටයුතු කරන්නට නියෙොත් මුදල් අපතේ යෑම්, නැත්නම් මුදල් නාස්තිය වැඩි වේවි; මහජනයාට මෙය පිළිකුල් වේවි; සමහරවිට පොදු මහ ජනතාව අතර සමුපකාර හොරු වැඩි වේවි. ගම්සභා ආදියේ අද හුඟක් හොරමැරකම් අඩුයි. එයට හේතුව හොඳ පාලන ක්‍රමයයි. ඒ නිසා සමුපකාරයේත් කාරක සභාව පොදු පරීක්ෂණ තත්ත්වයකින් කටයුතු කරන අතර, ස්ථිර තත්ත්වයේ සිටගෙන වැඩ කරන්නට පරීක්ෂක මහත්වරුන් එක සමිතියට එක්කෙනා බැගින් යොද නවා නම් මේ ව්‍යාපාරය සාර්ථක කර ගන් නට පුළුවන් වේවි. කාරක සභාව උපදේ ශක තත්ත්වයේ සිටගෙන මහජනතාවට ඕනෑ කරන විධියට ප්‍රතිපත්ති මාලාව සකස් කළ යුතුයි. පාලනය හැම විටම නීතිරීතිවලට එකඟව දූෂණ යන්ගෙන් තොරව කරගෙන යෑමට වග කිවයුතු නිලධාරි මහත්වරුන් එක සමිති යට එක්කෙනා බැගින් හෝ යොදා මේ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට කටයුතු කරනවා නම් ඒ මගින් පොදු මහජනයාට ලැබෙන ප්‍රයෝජනය විශාලයි; පාඩුලයි. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා ඒ ගැනත් කල්පනා කර බලන්නට ඕනෑ.

එමෙන්ම සමුපකාරය කොතරම් අපතේ යෑම්වලට මුහුණ දෙනවාද කියා බලන්න. බඩුමුට්ටු ආදිය ගැන බලන්න. එක එක සමිතිවල එක එක විධියේ අපතේ යෑම් සිදු වෙනවා. එමෙන්ම එම සමිතිවලට බඩු දෙන සංගම්වල තවත් විධියේ අපතේ යෑම් සිදු වෙනවා. ඒ අනුව බඩුමුට්ටුවල විශාල නාස්තියක් සිදු වෙනවා. එය වළක්වන් නට ඕනෑ කොහොමද කියා අපි බලන්නට ඕනෑ. බොහෝවිට විදේශ විනිමය පවා වැය කොට ගෙන්වූ, ප්‍රයෝජනයට ගන් නට පුළුවන්, භාණ්ඩ අපතේ යනවා නම් එය රජයටත් රටටත් පොදු මහජනතාව ටත් විශාල පාඩුවක්. ඒ නිසා එවැනි අපතේ යෑම් නැති කිරීමට අප විසින් ගත යුතු ක්‍රියාමාර්ගයන් මොනවාද කියා සොයා බැලීම කාලෝචිතයි කියා මා කල්පනා කරනවා. බඩු පරිහරණය කිරීමේදී විශාල තොගයක් එක්කෙනෙක් පරිහරණය කිරී මේදීත් විශාල වශයෙන් අපතේ යෑම් සිදු වෙනවා. පරිහරණය කරන බඩු ප්‍රමාණය අඩු නම් අපතේ යෑම් අඩුයි. එමෙන්ම ඒ මගින් ප්‍රවේශමත් වැඩි වෙනවා. ඒ නිසා සංගම් මගින් බඩු පරිහරණය කිරීමේදී ඇති වන අපතේ යෑම් හා එක එක සමිති වල පරිහරණයෙන් ඇති වන අපතේ යෑම්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගැන පරීක්ෂා කර එවැනි අපතේ යෑම් ඇති නොවීමට යම් ස්ථිර ක්‍රියා මාර්ගයක් යෙදීම අවශ්‍යය යන කාරණය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන වේය කියා මා හිතනවා.

නිෂ්පාදන කටයුතු සඳහා කොයි තරම් දුරට සමූපකාර ව්‍යාපාරයෙන් ප්‍රයෝජන ගත හැකිදැයි සොයා බැලීම වැදගත් දෙයක්. පසුගිය කාලයේ විවිධ සේවා සමූපකාර සමිති ඇති කළ අවස්ථාවේ ඒ සමිතිවලට නොයෙක් විධියේ කොන්ත්‍රාත් වැඩ බොහෝ තැන්වලින් ලැබුණා. එහෙත් එය අසාර්ථක බවට පත් වූ නිසා දැන් කොන්ත්‍රාත් වැඩ දීමත් නවත්වා තිබෙනවා. බොහෝ තැන්වල ඒ කාර්යය අසාර්ථක වුණේ ඒ වැඩ වැරදි විධියට කළ නිසයි. මේ සමිතිවල වැඩ කටයුතු හරියාකාර මෙහෙයවනු ලැබුවා නම්, අසාර්ථක වන්නට කිසිම හේතුවක් නැහැ. සමූපකාර සමිතියට තිබෙන හැකියාවන් උඩ සලකා බලන කෙනකුට මෙවැනි වැඩක් අසාර්ථක වීමට හේතුවක් නැති බව පෙනෙනවා ඇති. එහෙත් අසාර්ථක වී තිබෙන්නේ වැරදි විධියට මෙහෙයනු ලැබූ නිසයි.

සාමාන්‍ය කොන්ත්‍රාත් වැඩ පමණක් නොව පොදුවේ මහජන ශුභ සිද්ධියට අදාළ වන පාරවල් තැනීම, පාසල් ගොඩනැගිලි ඉදි කිරීම, වැනි වැඩ රජයෙන් නොකර සමූපකාර සමිතිවල ලාභයෙන්ම වුවත් සමහර විට කරන්නට පුළුවන් අවස්ථා ඇති විය හැකියි. නිකවැරටියේ විවිධ සේවා සමූපකාර සමිතියට නිකවැරටියේ මහා විද්‍යාලයට වටිනා ස්ථිර ගොඩනැගිල්ලක් තැනීම සඳහා එම සමිතියේ ලාභවලින් රු. 10,000 ක් යොදා උපකාර කරන්නට පුළුවන් වුණා. සමිතිවල ලාභ මුදල් යොදා එවැනි පොදු වැඩ කරන්නට පුළුවන්කම තිබෙනවා. අවශ්‍ය වී තිබෙන්නේ ඒ සඳහා ශක්තියක් ඇති වන ආකාරයට සමූපකාර සමිති සකස් කිරීම පමණයි.

විධිමත් අන්දමට සමිති සකස් නොකළොත් ඒවා මහජනයාට ඉබේම එපා වෙනවා. 1956 දී පටන් ගත් විවිධ සේවා සමූපකාර සමිති දැන් අසාර්ථක තත්ත්වයට වැටී තිබෙන නිසා ඒවා ඉස්සර තිබුණු තත්ත්වයට ගෙන ඒමට කටයුතු සම්පාදනය කිරීම අවශ්‍යයි. අවුරුදු දහයකට පස්සේ දැන් අපට නැවතත් ආපසු, 1958 තත්ත්වයට යන්නට සිද්ධ වේගන එනවා. වැඩ ටික හරියාකාර කරනවා වෙනුවට වැරදි විධියට කළ නිසයි එවැනි තත්ත්වයක් ඇති වූයේ. ඒ නිසා සමූපකාර ක්‍රමය මහජනයාට එපා නොවන අන්දමට සකස් කිරීම ගැන උනන්දු වන මෙන් මා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

සමූපකාර සංවර්ධන කටයුතුවල නිරත වී සිටින නිලධාරීන්ගේ පහසුව පිණිස ඇති කළ යුතු අවශ්‍යතාවන් කිහිපයක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ කල්පනාව යොමු කළ යුතුව තිබෙනවා. දුෂ්කර පළාත්වල සේවය කරන නිලධාරීන්ට ගමනාගමන පහසුකම් නැති නිසා, විඳින්නට සිදු වන කරදර ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. ඈත, දුර බැහැර ප්‍රදේශවලට ගිහිල්ලා සමූපකාර සමිති පරීක්ෂා කිරීම සාර්ථක ප්‍රතිඵල ලැබෙන ආකාරයට කෙරෙන්නට නම්, ඒ වැඩ භාරව කටයුතු කරන නිලධාරීන්ට ගමන් පහසුව තිබෙන්නට ඕනෑ. මේ සඳහා තමන්ගේම වාහනයක් තිබීම නිලධාරියකුට විශාල පහසුවක් බව අමුතුවෙන් විස්තර කරන්නට වුවමනා නැහැ. වාහනයක් ගැනීම පිණිස දැනටමත් රජයෙන් මුදලක් ඒ නිලධාරීන්ට ණයට ගන්නට පුළුවනි. මෝටර් බයිසිකලයක් ගැනීම සඳහා නිලධාරීන්ට යම් මුදලක් ණයට දෙනවා. මට දැනගන්නට ලැබී තිබෙන හැටියට, මුදලක් ණයට ලැබෙන නමුත් වාහනයක් ගැනීමට අවශ්‍ය බලපත්‍රයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා සමහර නිලධාරීන්ට අපහසුකම්වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. උතුරුමැද පළාතෙත් වයඹ පළාතේත් සේවය කරන නිලධාරීන්ට මේ නිසා විශේෂයෙන්ම කරදර විඳින්නට සිදු වන්නේ ඈත ගම්වලට ගොස් සමූපකාර සමිති පරීක්ෂා කිරීමට තිබෙන නිසයි. මේ අයට වාහන පහසුව ඉතාමත් අවශ්‍යයි. තමන්ගේ සුදුසුකම් අනුව මුදල් ලබා ගත්තත්, වාහන ලබා ගන්නට බැරි වෙනවා. කෘෂිකර්මාන්තයේ දියුණුවට වැඩ කරන උදවියට වාහන ලබා දුන්නා වාගේ, සමූපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්මරුන්ටත් මෝටර් බයිසිකල් වැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාහනවත් ලබා ගැනීමට පහසුකම් සලස්වන්නට ඕනෑ. ඉල්ලුම් ගැන සලකා බැලීමේදී නිලධාරීන්ගේ සුදුසුකම් සහ අවශ්‍යතාවන් ගැන සලකා බලා ඒ අයට අවශ්‍ය වාහනයක් ලබා ගැනීමට බලපත්‍ර නිකුත් කරන්නට විධිවිධාන යොදන මෙන් ඉල්ලා සිටිමින්ද, එය මේ අවස්ථාවේ හැටියට ඉතා මත් අවශ්‍ය දෙයක් බව ප්‍රකාශ කරමින්ද, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 5.19

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා අප ඉදිරිපිට තබා ඇති පනතින් අදහස් කරන්නේ, හදිසි අවස්ථාව යටතේ එතුමාට මේ රටේ තිබෙන සමුපකාර සමිති සංගම් ආදිය විසුරුවා හැර ඒ තැන්වලට තමන් සතුටු අයවලුන් පත් කිරීමට දී තිබෙන හිතුවක්කාර බලය නැති කිරීමටයි. ඒ සමගම, මේ හිතුවක්කාර බලය පාවිච්චි කොට සමුපකාර සමිති සමාගම් කීපයක් අහෝසි කර ඒවායේ බලය පවරන ලද පාලක මණ්ඩලවල අකටයුතු වැඩ අවුගණනේ තව අවුරුදු 4 ක් වත් ගෙනයාමට ඉඩ දීමටත් මෙයින් බලාපොරොත්තු වෙනවා.

"හිතුවක්කාර බලය" යන වචන පාවිච්චි කරන විට ගරු ඇමතිතුමා සිනාසුණා. එහෙත්, මා ඒ වචන පාවිච්චි කෙළේ ඇත්ත වශයෙන්ම ඒ බලය හිතුවක්කාර බලයක්ම වන නිසායි. දැන් මදක් අහෝසි කරන්නට යන මේ බලය යටතේ, කිසිම විගවිභාගයක් නැතිව. ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කෝලාම්වලට ඇහුම්කන් දී, ඉතා හොඳට වැඩ කරගෙන යන සමිති හා කාරක සභා පවා විසුරුවා හැර ඇමතිතුමා කැමැති ආකාරයේ කෙනකු අතට ඒවායේ බලතල පවරා දෙන්නට ඇමතිතුමාට බලය ලැබී තිබෙනවා. සාමාන්‍ය සමුපකාර නීති යටතේ එවැනි බලයක් නැහැ. සමුපකාර සමිති ආඥාපණතේ 43 වන වගන්තිය යටතේ එක්තරා බලතල වගයක් සමුපකාර රෙජිස්ට්‍රාර්තුමාට ලැබෙනවා. එහෙත්, මේ විධියේ හිතුවක්කාර බලතල එයින් දීලා නැහැ. යම් සමුපකාර සමිතියකට විරුද්ධව චෝදනා එල්ල වී තිබෙනවා නම් එම චෝදනා ඒ සමිතිය වෙත ඉදිරිපත් කොට, ඒවාට සමිතියෙන් ලැබෙන කට උත්තර සලකා බලා, සාමාජිකයන්ගේ රැස්වීමක් කැඳවා ඔවුන් කියන දේත් විමසා බලා, ඊට පසු යම් සමිතියක් හෝ කාරක සභාවක් හෝ විසුරුවා හැරීමේ බලතල යට කී නීතියෙන් සමුපකාර රෙජිස්ට්‍රාර්තුමාට ලැබී තිබෙනවා. එහෙත්, මේ හිතුවක්කාර බලය එවැනි දෙයක් නොවෙයි. කිසිම චෝදනාවක් ඉදිරිපත් නොකර, කිසිම ප්‍රශ්නයක් අහන්නේ නැතිව, සාමාජිකයන්ගේ රැස්වීමක් පවා නොකැඳවා, කවුරුන් හෝ පැමිණ ඇමතිතුමාගේ හෝ ස්ථිර ලේකම්තුමාගේ හෝ කනට කර කියන දෙයක් පිළිගෙන, හිතුවක්කාර අන්දමට, යම් සමිතියක් හෝ කාරක සභාවක් හෝ අවලංගු කිරීමේ බලතල මේ හදිසි නීති යටතේ ඇමතිතුමාට ලැබී තිබෙනවා. අනාගතයේදී මේ බලය ඇමතිතුමාගේ අතින් ඉවත් කිරීමට යාම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ සමගම, ඒ බලය එසේ ඉවත් කරන්නේ මොන හේතුවක් නිසාද යන කාරණයත් මේ අවස්ථාවේදී කල්පනාවට භාජන කළ යුතුව තිබෙනවා. සමුපකාර සමිති පාලනය කිරීම සඳහා හිතුවක්කාර බලයක් යෙදීමේ අවශ්‍යතාවක් මීට අවුරුද්දකට හමාරකට කලින් තිබුණා නම්, දැන් ඒ අවශ්‍යතාව නැති වී තිබෙන්නේ මොන හේතු නිසාද? මට මෙය ප්‍රශ්නයක්. අප රටේ සමුපකාර ව්‍යාපාරය පහළ තත්ත්වයකට බැස තිබෙන නිසා, එය නගා සිටුවීමට ටිකක් හිතුවක්කාර විධියට වුවත්, සුළු ඒකාධිපති බලයක් යටතේ වුවත් "A little bit of totalitarianism" අනුව වුවත් ක්‍රියා කිරීම අවශ්‍යයි ඇමතිතුමා කියනවා නම් එයත් එක්තරා විධියක තර්කයක්. විශේෂ හිතුවක්කාර බලතල ඇමතිතුමා අතට ගත්තේ ඒ තර්කය උඩ නම්, අද එය අනවශ්‍ය වී තිබෙන්නේ මොන කරුණක් නිසාද? මෙය මොහොතකට සිතා බැලිය යුතු ප්‍රශ්නයක්.

මට පෙනී යන හැටියට නම්, අප රටේ සමුපකාර ව්‍යාපාරය පසුගිය අවුරුදු කීපය මුළුල්ලේ, ඇමතිතුමාගේ හිතුවක්කාර බලතල කරණකොටගෙන හෝ වෙනයම් හේතුවක් නිසා හෝ හොඳ අතට හැරී තිබෙනවායි කියන්නට පුළුවන්කමක් නැහැ. එහෙම නම්, දැන් මේ බලතල අනවශ්‍යයි කියන හේතු මොනවාද? මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා,]

හිතනවා ඒ හේතුවත් අපේ අගමැතිතුමා හදිසි නීතිය අස් කර දැම්මේ හේතුව වගේ එකක් වෙන්න ඇත කියා. එසේ නම් ඒ හේතුව කුමක්ද? මැතිවරණයකට සූදානම් වී සිටීමේ හේතුවයි. සමුපකාර සමාගම් විසුරුවා හැරීමට රාජ්‍ය ඇමතිතුමාට තිබෙන හිතුවක්කාර බලතල, ජනදින පත්‍ර වැනි පත්‍ර තහනම් කිරීමට අගමැතිතුමාට තිබෙන හිතුවක්කාර බලතල හෙමින් සීරුවේ අයින් කරගෙන යන්නේ වැඩි කල් යන්නට මත්තෙන් මහා මැතිවරණයක් බලාපොරොත්තු වන නිසායි. මහජනයා ඉදිරිපිටට ගොස් මහෝපාසකයින් වාගේ පෙනී සිට අප හිතුවක්කාර විධියට රට පාලනය කරන ඇත්තන් නොවේය, හදිසි නීති රීති අස් කර තිබෙනවාය, සමුපකාර සමාගම් විසුරුවා හැරීමේ බලතල අස් කර තිබෙනවාය, බලයෙන් කටයුතු කිරීමට අප බලාපොරොත්තු වෙන්නේ නැත, අපි නියම පිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදීන් හැටියට පෙනී සිටින අයය, කියා මහජනයා රවට්ටන බලාපොරොත්තුවෙන් තමයි, මේ බලතල හෙමින් හෙමින් අස් කරගෙන යන්නේ. හැබැයි, මැතිවරණයෙන් දිනුවොත් ඊට පසුව ඔය සියලුම බලතල නැවතත් අර ගන්නවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
හදිසි අවස්ථාවක් වුණොත්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
හදිසි අවස්ථාවක් ඇති කරන්න තමුන්නාන්සේලාට අමාරුවක් නැහැ. හදිසි අවස්ථා ඇති කිරීමට තමුන්නාන්සේලා අතරම මිනිස්සු ඉන්නවා. වෙන කාගෙවත් ආධාර ඕනෑ නැහැ. [බාධා කිරීම්] නැහැ නියෝජ්‍ය සභාපතිතුමනි, විශෙෂයෙන්ම මහා මැතිවරණයක් ළඟ ළඟම එන නිසා මා දේශපාලන පක්ෂ හජ්ජනයෙන් මෙසේ අයුතු ආකාරයකට එල්ල කරන චෝදනා යයි යමෙකුට හිතන්නට ඉඩ තිබෙන බැවින්, මා ඉදිරිත් කර ඇති තර්ක සහ චෝදනාවලට හොඳ අත්තිවාරමක් තිබෙන බවත්, නිකරුණේ දේශපාලන පක්ෂ හජ්ජනය උඩ එල්ල කළ චෝදනා නොවන බවත් පෙන්වා දීම සඳහා, ඇමතිතුමා අතේ බලය තිබුණු අවස්ථාවේදී ඒ බලය පාවිච්චි කර කළ ක්‍රියා පෙන්වා දීමෙන් දේශපාලන පක්ෂ හජ්ජනය උඩ ඒ බලය පාවිච්චි කර තිබෙන ආකාරය ඔප්පු කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරන්නේ මා දන්නා කරුණු ගැන පමණයි. මා වැඩියෙන් හොඳට දන්නේ මා නියෝජනය කරන පානදුරේ කොට්ඨාශය පිළිබඳවයි. එනිසා පානදුරේ කොට්ඨාශයෙන් වැදගත් නිදසුනක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මා එය මෙම ගරු සභාවේ ඉදිරිපත් කරන පළමුවන අවස්ථාව නොවෙයි, මේ. මීට කලින් දෙවතාවක්ම ඉදිරිපත් කර තිබෙනවා. දෙවැනි විතාවේ අපේ ගරු ඇමතිතුමාගෙන් යම්කිසි පිළිතුරක් ලැබුණා. ඒ පිළිතුරට පිළිතුරු දෙන්නයි මා දැන් බලාපොරොත්තු වන්නෙ. පානදුරේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය මා දන්නා ආකාරයට එක් කාල පරිච්ඡෙදයකදී ප්‍රයෝජනවත්ව වැඩ කටයුතු කරමින් තිබුණා. මෑත කාලයක සිට එහි යම්කිසි ආරාවුල් තත්ත්වයක් ඇති වී තිබුණා. එහි කෙරී තිබුණ වැරදි වගයක් නිසා රෙජිස්ට්රාර්තුමා විභාගයක් පවත්වා—දැන් කරනවා වාගේ නොවෙයි—ඒ විභාගයෙන් පසුව අලුත් කාරක සභාවක් පත් කරන්නට යෙදුණා. එහි සභාපති හැටියට සිටියේ රජයේ නිලධාරියෙක්. ඒ විධියට වැඩ කරගෙන යන විට හිටිගමන් කිසිම දැනුම්දීමක් නැතුව, ඇමතිතුමාට ඇති හිතුවක්කාර බල තල යටතේ 1967 ජූනි මාසයේ 28 වෙනිදා ඒ කාරක සභාව විසුරුවා හරිනවාය, ආදායම් පාලක නිලධාරී තැනගේ සභාපතිත්වයෙන් යුත් පාලක මණ්ඩලයක් ඒ වෙනුවට පත් කරනවාය කියා දැනුම් දුන්නා. මෙය පුදුම ක්‍රියාවක්. යුක්තිසහගත අන්දමට කල්පනා කරනවා නම් මෙයට හේතුව කුමක්ද කියා සිතන්නත් අමාරුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විධියට මා කියන්නේ මෙන්න මේ නිසයි. එම සමුපකාර සංගමයේ කාරක සභාව වෙනස් කර, එය ප්‍රතිසංවිධානය කර, එම කොමිටියේ සභාපති හැටියට වෙනත් නිලධාරියෙක් පත් කර ගත්තා. ඊටපසු නරක තත්ත්වයක තිබුණ සමුපකාර සංගමය හොඳ තත්ත්වයකට පරිවර්තනය වුණා. හොඳ ලාභයක් ලබා ගන්න පුළුවන් වුණා. ඊටපසුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිකුත් කළ ඔඩිට් වාර්තාවල් හැම අතින්ම සතුටුදායකය කියා කියන්න පුළුවනි. ඒ විධියට ප්‍රතිසංවිධානය කිරීමෙන් පසුව පසුගිය අවුරුදු දෙක තුන ඇතුළත එම සංගමය මගින් ප්‍රයෝජනවත් සංවර්ධන වැඩ කටයුතු කිහිපයක්ම කර තිබෙන බවත් ඇත්තක්. ඒ විධියේ හොඳ තත්ත්වයකට එම සමුපකාර සංගමය පැමිණ තිබියදී පසුගිය අවුරුද්දේ මාර්තු 10 වෙනි දින මහා සභාවක් පවත්වන බවටත් දැනුම් දී තිබුණා. නමුත් කොමසාරිස්තුමා විසින් තමන්ගේ විශේෂ බලතල පාවිච්චි කර එම රැස්වීම කල් දමන්න අණ කළා. එයට හේතුව කුමක්ද කියා කිව්වේ නැහැ. එවිට මේ කාරක සභිකයන් කිහිප දෙනෙක් එකතුව කොමසාරිස්තුමා හමුවීමට ගොස් ඒ අයට විරුද්ධව යම්කිසි චෝදනාවක් තිබෙනවාද, එසේ තිබේ නම් කරුණාකර කියන්නය කියා ඉල්ලා සිටියා. කොමසාරිස්තුමා කිව්වා එහෙම දෙයක් නැත කියා. ඒ නිසා කාරක සභිකයන් ආපසු පැමිණියා. ඔන්න ඔය විධියටයි කටයුතු සිදු වුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි එක් වරටම ඇමතිතුමාගේ හිතුවක්කාර බලය පාවිච්චි කර මේ කොමිටිය විසුරුවා හරින්නය කියා තීන්දුවක් දුන්නා. ඔය විධියට තමයි කරුණු සිදු වුණේ.

මේ ප්‍රශ්නය මීට ප්‍රථමයෙනුත් මා මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ අයගේ වැරදි මොනවාද කියා අසන්නේවත් නැතිව, මේ විධියට කාරක සභාව විසුරුවා හැරීම අකටයුත්තක් නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඒ ගැන ප්‍රශ්න කළා. ඇමතිතුමා එයට පිළිතුරක් දුන්නා. සමුපකාර කොමසාරිස්තුමාගේ වාර්තාවක් ගෙනැවිත් එතුමා මෙහිදී කියෙව්වා. මා හිතන අන්දමට නම් ඇමතිතුමා එම වාර්තාව පළමු වැනි වරට කියවා ඇත්තේ මේ ස්ථානයේදී විය යුතුයි. කිසිම සත්‍යයක් නැති කරුණු කිහිපයක්ම එම වාර්තාවේ සඳහන් වී තිබුණ නිසයි මා එසේ කියන්නේ. එම සංගමය මගින් කිසිම අවසරයක් ලබා ගන්නේ නැතිව රුපියල් 60,000 ක් පමණ වියදම් කර අලුත් ගොඩනැගිල්ලක් සාදා තිබෙනවාය කියා එම වාර්තාවේ සඳහන් වුණා. එය සම්පූර්ණ අසත්‍යයක්. වර්ෂ ගණනකට පෙර එයට අවසර ලබා ගෙන තිබෙනවා. කිසිම අවසරයක් නැතිව කළ වැඩක්ය කියා කියන්න පුළුවන්කමක් නැහැ. ඒ වගේම තවත් කරුණක් ඒ වාර්තාවේ සඳහන් වුණා. එනම් එම කාරක සභාවේ සාමාජිකයෙක් තමන් විසින් කළ වැඩකට රුපියල් 800 ක් ලබා ගත්තාය කියා එහි සඳහන් වී තිබුණා. මා ඒ ගැන විභාග කර බැලුවා. මට දැන ගන්න ලැබුණ විධියට නම් එය සම්පූර්ණ අසත්‍යයක්. කාරක සභාවේ සිටින සාමාජිකයෙකුට කිසිම කොන්ත්‍රාත් වැඩක් භාර දී නැහැ. මේ කරුණු ඇත්තද නැත්තද කියා සොයා ගන්නවත් ඇමතිතුමා කිසිම උත්සාහයක් ගෙන නැහැ. කෙනෙකුට විරුද්ධව යම්කිසි චෝදනාවක් ඉදිරිපත් කළ විට ඔහුට තමන්ගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. නිදහසට කරුණු මොනවාද කියාවත් ඇසුවේ නැහැ. මට පෙනෙන හැටියට නම් මේ විධියට ක්‍රියා කර තිබෙන්නේ ඒ කාලයේ සිටි සමුපකාර කොමසාරිස්තුමා විසිනුත් ඒ කාලයේ සිටි ස්ථිර ලේකම් හෝ සහකාර ලේකම් විසිනුත් කරන ලද නියමයන් අනුවයි. මේ විශේෂ බලතල ලබා ගැනීමේ තේරුම ඔන්න ඕකයි. චෝදනා එල්ල කරනු ලැබූ නැනැත්තාගේ නිදහසට තිබෙන කාරණා කියන්නට ඉඩ නොතැබීමට තමයි, මේ විධියේ විශේෂ බලතල අවශ්‍ය වී තිබෙන්නේ.

ලියමනකුත් ලැබී තිබෙන බව එදා ඇමතිතුමා පිළිතුරු දෙන අවස්ථාවේදී ප්‍රකාශ කළා. ඒ ලියමන අනුව හුඟක් දූෂණ තිබෙන බවත් එතුමා කීවා. ඒ ලියමන එවා තිබෙන්නේ පානදුරේ කෙළින් වීදියේ වෝල්ටර් ප්‍රනාන්දු නමැත්තෙක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේට එවූ ලියමනක පිට පනකුයි, මට ලැබුණේ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඇමතිතුමා කීවේ ලිපියක් ලැබී තිබෙන බවයි. මටත් ලියමනක් එවා තිබුණු බව ඇත්තයි. පානදුරේ කෙළින් වීදිය ඒ තරම්ම කෙළින් තිබෙන එකක් නොවෙයි. හැබැයි, ඒක දිගයි. එහි එක කොණක සිට අනෙක් කොණ දක්වා බැලුවත් මේ වෝල්ටර් ප්‍රනාන්දු නමැත්තා සොයා ගන්නට පුළුවන් වුණේ නැහැ. සමහර විට වෙනත් වීදියක ඔහු ඉන්නවාදැයි මා දන්නේ නැහැ. කෙසේ වුණත් ඒ චෝදනා ගැන කිසිම විභාගයක් නොකර ඒ කාරක සභාව විසුරුවා හැරියා. ඒ චෝදනා එකිනෙක සම්බන්ධයෙන් ක්‍රියාකාරී සාමාජිකයන් සමග මා සාකච්ඡා කළා. එවිට ඒ චෝදනා සම්පූර්ණයෙන්ම අසත්‍ය බව පෙනී ගියා. කවුරුන් හෝ චෝදනාවක් ඉදිරිපත් කළ විට ඒවා ගැන සොයා බැලිය යුතුයි එසේ සොයා නොබලා ඒ චෝදනා අනුව එක පාරටම ක්‍රියා කරනවා නම් සමුපකාර සමිතියක් තබා මොනම ව්‍යාපාරයක්වත් ගෙන යන්නේ කොහොමද ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමුපකාර සමිතිය සම්බන්ධයෙන් මේ විධියට ක්‍රියා කර තිබෙන්නේ මන්දැයි තමුන්නාන්සේට කල්පනා වෙනවා ඇති. මේ වැඩ පිළිවෙළ සකස් වුණු හැටි සමහර විට ඇමතිතුමා නම් අද වනතුරුවත් නොදන්නවා ඇති. ඒ වුණත් පානදුරේ සිටින මිනිසුන් නම් මේ ගැන දන්නවා. අවුරුදු ගණනකට පෙර මේ සංගමය පානදුරේ සිටින යූ.එන්.පී. කාරයන් දෙදෙනකුගේ අතට වැටී තිබුණා. ඉන් එක් කෙනෙක් නම් "පින්වල රාලහාමි" නමින් ප්‍රසිද්ධ විශ්‍රාම ලත් ගම්මුලාදෑනියෙක්. අනෙක් තැනැත්තා මා සමග දෙවරක් තරඟ කොට පරාජයට පත් වූ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයායි. 1960 පැවැත්වුණු මහා මැතිවරණ දෙකේදීම ඔහු මා සමග එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් තරඟ කොට පරාජයට පත් වුණා. මේ දෙදෙනා මේ සමුපකාර සංගමයේ වැඩ කරමින් සිටියදී කවුදෝ දුන් ඔත්තුවක් අනුව විභාගයක් පැවැත්වීමෙන් අක්‍රමිකතා රාශියක් අසු වුණා. ඒ නිසා ඒ අනුව ක්‍රියා කරන්නට යෙදුණා. මේ දෙදෙනා සංගමයේ නිලතලවලින් ඉවත් වුණා. එදා සිට මේ දෙදෙනාට වුවමනා වී තිබෙන්නේ ආයෙත් මේ සංගමයේ බලය ලබා ගන්නටයි. එසේ බලය ලබා ගන්නට බැරි වුණොත් බලයට පත් වුණු අයට වැඩ කරගෙන යන්නට ඉඩ නොදෙන්නට මේ අයට වුවමනා වී තිබෙනවා. ඒ අය ඒ කාලයේ සිටි තමුන්නාන්සේගේ ස්ථිර ලේකම්වරයාට කියා තමුන්නාන්සේ නොමග යවා මේ වැඩේ කරවාගෙන තිබෙනවා. හොඳට වැඩ කරගෙන ආ සමුපකාර සමිතියක් විසුරුවා හැර තිබෙන්නේ ඒ විධියටයි. එය පාලනය කිරීම සඳහා පත් කර සිටින අයට මා දොස් කියන්නේ නැහැ. ඩී. ආර්. ඕ. හොඳට වැඩ කරන කෙනකු වන්නට ඇති. එහෙත් මේ වැඩේ තේරුම මොකක්ද ? මෙතැන සභාපති හැටියට වැඩ කරමින් සිටියේ තමුන්නාන්සේලාගේම නිලධාරියෙක්. හොඳට සමුපකාර වැඩ කරන තවත් දෙතුන් දෙනකු ඔහුට ආධාර කළා. කොටින්ම ඒ සමිතිය හොඳට වැඩ කරගෙන ආවා. එහෙත් පින්වල රාළහාමිත්, එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයාත් චෝදනා ඉදිරිපත් කළ නිසා විභාගයක් පවත්වන්නේවත් නැතිව, නිදහසට කියන්නට තිබෙන කාරණා අසන්නේවත් නැතිව ඒ සංගමයේ කාරකසභාව විසුරුවා හැරියා. සාමාජිකයන්ගේ රැස්වීමකුත් කැඳවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නීත්‍යනුකූල විධියටයි, ඒ කාරකසභාව වැඩ කරගෙන ආවේ. එහෙත් එය විසුරුවා හැරියා. එම නිසා තමයි, ඇමතිතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව මෙම හිතුවක්කාර බලතල අයුතු විධියට පාවිච්චි කර තිබෙනවාය, පාවිච්චි වී තිබෙනවාය කියා මා කියන්නෙ. යම්කිසි විධියකින් එම සමුපකාර සමිති සංගමයේ කාරක සභාව වීසුරුවා හැරීමට තරම් වැරදි අන්දමට ක්‍රියා කර තිබුණා නම්, එහි සභාපති හැටියට පත් ව සිටි ආණ්ඩුවේ නිලධාරියාත් එක්තරා ප්‍රමාණයකට හෝ ඒ ගැන වග කියන්න ඕනෑ. ආණ්ඩුවේ නිලධාරියා පළාතේ සමුපකාර පරීක්ෂක මහත්මයෙක්. ඒ මහත්මයා එතැනින් ඉවත් කළා පමණක් නොවෙයි, ඊට පසුව උසස් වීමක්ද දී තිබෙනවා. වැරදි කළ නිලධාරීන්ට උසස් වීම් දීමේ සිරිතක් කොහේද තිබෙන්නේ? නමුත් මෙම සංගමයේ කාරක සභාවේ සභාපති වශයෙන් ක්‍රියා කළ එම සමුපකාර පරීක්ෂක නිලධාරියාට ඊට පසුව උසස් වීමක් දී තිබෙනවා. මා දන්නා හැටියට, ඒ මහතා කාරක සභාවේ සභාපති හැටියට හොඳින් වැඩ කළ නිසා උසස් වීමක් දෙන්න වටිනවා. මෙයින් පැහැදිලි වනවා බලතල ප්‍රයෝජනයට ගනිමින් කොයි විධියෙ අකටයුතුකම් සිදු කර තිබෙනවාද කියා. ඇමතිතුමාට දී ඇති හිතුවක්කාර බලතල පාවිච්චි කර තිබෙන්නේ කොයි අන්දමටදැයි අපට දැන් පැහැදිලි වෙනවා. දැන් එම කාරක සභාවේ සභාපති වශයෙන් ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි මහතා පත් කර තිබෙනවා. ඒ මහත්මයා හොඳ කෙනෙක් වුණත් සමුපකාර වැඩ කටයුතු ගැන දැනුමක් නැහැ. සමුපකාර කටයුතු කරන්නත් ඒ මහතාට කාලයක් නැහැ. අලුත් කාරක සභාවක් පත් කිරීමෙන් ලාභ ලැබූ සංගමයක් අද පාඩු විඳිනවා. නොයෙකුත් අයගේ ඇඟිලි ගැසීම් නිසා, දේශපාලන ඇඟිලි ගැසීම් නිසා, එක්සත් ජාතික පක්ෂයේ බලකනු ඇවිත් කණට කර කියන දේවලට ඇහුම්කන් දී ක්‍රියා කිරීම නිසා එම සංගමය පාඩු විඳිනවා. මෙය තමයි නියම තත්ත්වය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමාට බලතල පවරා තිබෙන්නේ යම්කිසි සමිතියක් වැරදි අන්දමට ක්‍රියා කරනවා නම්, දූෂිත පාලනයක් ගෙන යනවා නම් එය නිවැරදි කිරීමටයි. එතුමාට තිබෙන බලතල පාවිච්චි කළ යුතු අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. පානදුරයේම එබඳු තැන් තිබෙනවා. පානදුරේ නගරයේ එක් කෙළවරක පිහිටි වලානේ විවිධ සේවා සමුපකාර සමිතියේ ක්‍රියා කලාපයට විරුද්ධව බරපතල චෝදනා රාශියක් එල්ල වී තිබෙනවා; එහි පාලනයට විරුඬව චෝදනා රාශියක් අඩංගු ලිපි එවා තිබෙනවා. මෙයින් 1967 මාර්තු මස 27 වනදා එවන ලද ලිපියක් ගැන සඳහන් කරන්න කැමතියි. නැවත නැවතත් මේ ලිපිය ගැන මතක් කර යවා ඇතත් එහි අඩංගු චෝදනා ගැන අද වනතුරුවත් විභාගයක් පවත්වා නැහැ. අප කියන්නේ නැහැ, එක් වරටම සමිතියක් විසුරුවා හරින්නටය කියා. යම්කිසි චෝදනාවක් එල්ල කරනවා නම් ඒ පිළිබඳව විභාග කර බලා සත්‍ය නම් එම කාරක සභාව විසුරුවා හැරීම ඇමතිතුමාගේ යුතුකමක්. එසේ නැතුව ඇමතිතුමාගේ හිතුවක්කාර බලතල පාවිච්චි කරමින් කිසියම් විභාගයක් නොකර සමිතියක් විසුරුවා හැරීම සාධාරණ යයි මා කියන්නේ නැහැ. එබඳු ඉල්ලීමක් කවරදාවත් අප කරන්නේ නැහැ. එම නිසා මෙම චෝදනාවන් සම්බන්ධයෙන් විභාගයක් පවත්වන ලෙස ඉල්ලා සිටිනවා. රෙදි කූපන් වංචාවක් පිළිබඳව එම සමිතියේ කාරක සභිකයනට විරුඬව චෝදනාවක් එල්ල වී තිබෙනවා. දැනට ඒ පිළිබඳව නඩුවකුත් තිබෙනවා. නමුත් කිසිදු විභාගයක් මේ වනතෙක් පවත්වා නැතුවා පමණක් නොවෙයි, එබඳු සමිති විසුරුවා හරින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමූපකාර සමිති (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත

—දෙවන වර කියවීම

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

නේත් නැහැ. මන්ද? ඒවාට පත් වී සිටින අය සමසමාජ කාරයන් නොවෙයි; ඒ නිසයි.

ඊයේ පෙරේදා නල්ලූරුවේ සමූපකාර සමිතියේත් එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

යාපනේ ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

නැහැ, පානදුරේ. පානදුරේ උතුරු කෙළවරේ තිබෙන්නේ, වලාන. දකුණු කෙළවරේ තමයි, නල්ලූරුව තිබෙන්නේ. ඒ සමූපකාර සමිතියේ සභාපති තමයි, මා සමගම පානදුර ඡන්දදායක කොට්ඨාශයට දෙවරක්ම තරග කර පැරදුණු අපෙක්ෂකයා. ඒ සමූපකාර සමිතිය සම්බන්ධයෙන් මට අද පැමිණිල්ලක් ලැබුණා. ඒ පැමිණිල්ලේ හැටියට කටයුතු සිදු වී තිබෙන්නේ, මේ විධියටයි: ඒ සංගමයේ සංවත්සර මහා සභා රැස්වීම, ඔක්තෝබර 19 වැනි ද පවත්වා තිබෙන්නේ, පානදුරේ ශ්‍රී සුමංගල විද්‍යාලයීය ශාලාවේදීයි. අවුරුදු 7 කට පසුවලු, ඒ සාංවත්සරික රැස්වීම පවත්වා තිබෙන්නේ. එහෙම නම් ඒ සමූපකාර සමිතියේ කාරක සභාව නීත්‍යානුකූලදැයි මා අහන්න කැමතියි. අවුරුදු 7 ක් වන තුරු මහා සභා රැස්වීමක් පැවැත්තුවේ නැත්නම්, ඒ කාරක සභාව විසුරුවා හරින්න ඇමතිතුමා කටයුතු නොකළේ ඇයි? එහි සභාපති, මා සමග තරග කළ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු වීම නිසාද, එය විසුරුවා නොහැරියේ? ඒ විතරක් නොවෙයි. එදා මහා සභා රැස්වීමේ කටයුතු කර තිබෙන්නේත්, නීති විරෝධි අන්දමටලු. රජයේ ශණ්ඩ්

පරීක්ෂකවරයකු විසින් අනුමත නොකළ අයවැය වාර්තාවක්, එදා ඉදිරිපත් කර තිබෙන්නේ. මහා සභාවෙන් ඒ පිළිබඳ විවේචන මතු වුණාම, එය ඡන්දය සඳහා ඉදිරිපත් නොකර, ඊළඟ අංකයට බැස තිබෙනවා. සමූපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුත් ඒ අවස්ථාවේ එතැන සිටියාලු. මේ අකටයුතු දේවලට ඔවුන්ගේ අනුබලයත් ලැබුණු බවයි, පැමිණිල්ලෙන් කියා තිබෙන්නේ. මේ පැමිණිල්ලේ අඩංගු සියලුම දේවල් කියන්නට මා අදහස් කරන්නේ නැහැ. මෙය යවා තිබෙන්නේ සමූපකාර කොමසාරිස් තුමාටයි. ගරු ඇමතිතුමාට හා මටත් එහි පිටපත් එවා තිබෙනවා. මෙයින්, ඉල්ලීම් දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. පළමුවැන්න, සමූපකාර සහකාර කොමසාරිස් වරයකුගේ හෝ වෙනත් සුදුසු නිලධාරියකුගේ සභාපතිත්වයෙන් නැවතත් මහා සභාවක් පැවැත්වීමයි. දෙවැන්න, එදා අර අකටයුතු දේවලට අනුබල දුන් ඒ සමූපකාර නිලධාරීන් දෙදෙනාට විරුද්ධව සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමයි. මේ විධියේ කටයුතු කරාවි යයි මා නම් හිතන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, එසේ කටයුතු සිදු වුණා යයි දක්වමින් පෙත්සමක් ලැබී තිබෙනවා.

මා ඒ පෙත්සම මා ළඟ තබා ගන්නවා. ලබන මැතිවරණයෙන් මා දිනාවිද පරදීවිද කියන්න බෑ. සමහර විට පරදින්න පුළුවනි. මා දිනුවත් පැරදුණත් මේ ආණ්ඩුව නම් දිනන්නේ නැති බව සහතිකව කියන්නට පුළුවනි. එම නිසා, බලයට පත් වන අළුත් ආණ්ඩුවට මේ පෙත්සම ඉදිරිපත් කර, සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු සලස්වන්නට මා බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන්, හදිසි අවස්ථාව අයින් කර, ඇමතිතුමාට දී ඇති විශේෂ බලතල අහෝසි කර, කල් නොගොස් මැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරණයක් තබා, අළුත් ආණ්ඩුවක් තෝරා ගැනීමේ අවස්ථාවට මෙරට ජනතාවට ලබා දීමට අදහස් කිරීම ගැන මගේ ප්‍රීතිය ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.50

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වචනයක් දෙකක්වත් නොකියා ඉන්නට බැරි නිසායි, වචන ස්වල්පයක් කථා කිරීම සඳහා ටික වේලාවක් දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටියේ. මා මුලින්ම පුළුල් වශයෙන් වචනයක් කියන්නට කැමතියි. හදිසි නීති ක්‍රමය පවත්වන්නට තිබුණු හේතුන් දැන් නැති නමුත් එය අතහරින්නට පුළුවන් වන්නේ විශේෂයෙන් මේ සමුපකාර සමිති ප්‍රශ්නය පිළිබඳවද යම් යම් රැකියාවල පඩි වැඩිකිරීමාදිය පිළිබඳවද එම බලතල පාවිච්චි කර තිබුණු හෙයින් එම පියවරවල් ආරක්ෂා වන ආකාරයට ස්ථිර නීති පැනෙව්වායින් පසුව පමණක්ය යන ප්‍රකාශය කලකට පෙර ගරු අගමැතිතුමා මේ ගරු සභාවේදී ප්‍රකාශ කර තිබෙනවා. කුමන අන්දමකට වුවත් හදිසි නීති ක්‍රමයක් රටේ පවත්වාගෙන යාම කෙළවර කිරීමට ආධාර දීම අපකාගේත් යුතුකම බව මා මුලින්ම ප්‍රකාශ කරන්නට කැමතියි. එක්තරා අවස්ථා දෙක තුනකදී නම් අගමැතිතුමාගේ කතාවලින් හඟවන්නට උත්සාහ කළේ පඩි වැඩි කිරීම වැනි දේවලට මේ හදිසි නීති ක්‍රමය තබාගෙන තිබෙනවාය යන්නයි. යම් කිසි නුවුවමනා ක්‍රමයක් ඇති කර බැරිවෙලා හෝ ඒකෙන් හොඳ ප්‍රතිඵලයක් ඇති වුණාම, එක හොඳ ගෙඩියක් ආ නිසා නරක ගහක් කපන්නට අකමැතිය වැනි අදහසක් පිළිගන්නට අපට බොහොම අමාරුයි.

කෙසේ වෙතත් මා අද හදිසි නීති ක්‍රමය ගැන කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. එය මේ ප්‍රශ්නයට අදාලය කියා මා සිතන්නේ නැහැ. එහෙත් වචනයක් පමණක් කිව යුතුයි. ඉංග්‍රීසි පත්‍රවල මේ ගැන හොඳ වචනයක් පළවුණා. දැන් ඉතින් පවතින්නේ Reduced emergency එකක් බවයි ඒ පත්‍රවල පළවුණේ.

Reduced කියන්නේ අඩුවෙච්ච කියන එකයි. එතකොට දැන් තිබෙන්නේ අඩුවෙච්ච හදිසියක්. මෙම හදිසිය අළුතෙන් වැඩි වෙන කාලයක් තිබෙන බවට අගමැතිතුමාගේ බියක් තිබෙන බව පේනවා. මා සිතන්නේ මෙම ස්ථානයේදීම එතුමා එක් අවස්ථාවකදී ඒ ගැන ප්‍රකාශ කර තිබෙනවා, ආණ්ඩුවේ සේවක පිරිසක් යම් කිසි කටයුත්තකට සූදානම් වීම ගැන එතුමාට ආරංචි වී තිබෙන නිසා. පනවා තිබුණු රෙගුලාසිවලින් විශාල කොටසක් අස් කර ගත් නිසා අඩු වෙච්ච හදිසි තත්ත්වයක් වෙනවා ඇති. ඒ ගැනත් මගේ සන්තෝෂය ප්‍රකාශ කරන්නට කැමතියි. හේතූන් දෙකක් නිසා හදිසි තත්ත්වය ගැන මෙහිදී මතක් කළ යුතුයි. මෙවැනි භයානක නීති පැනවීම ගැන මගේ විරුද්ධතාවය මා කීප වරක්ම ප්‍රකාශ කර තිබෙනවා. ඒකයි පළමුවන හේතුව. දෙවන හේතුව අදට බොහොම වැදගත් වන බව මෙහිලා සඳහන් කළ යුතුයි. පාවිච්චි කිරීමට බලාපොරොත්තුවක් නැති එවැනි නීති ඊනි පොතක තබා ගැනීම සම්පූර්ණයෙන් වැරදියි. එය නීතියට තිබෙන ගරු කිරීමක් නැති කිරීමට, අඩු කිරීමට නැති නම් සිඳී යාමට හේතු වන ක්‍රියාවක්. මෙවැනි නීති සකස් කරන්නේ හදිසි තත්ත්වයක් ඇත්තටම තිබෙනවා නම් ඒවා පනවන්නට අවශ්‍ය වෙනවාය කියන විශ්වාසය උඩ විය යුතුයි. එවැනි හදිසියක් ඇත්තටම නොතිබෙද්දීත් හදිසි තත්ත්වයක් පවත්වාගෙන යාමේ ස්වරූපයෙන් එවැනි නීති සහ එවැනි ආයුධ ඕනෑ වේලාවට තම අතට ගැනීමට සූදානමින් තබා ගැනීම වැරදියි.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

එදා අර පඩි ප්‍රශ්නය ගැනත් අගමැති තුමා නීතියක් ගෙනෙන බව කී අවස්ථා වේදී කවුරු කෙසේ කිව්වත් මම මේ සභාව හරහා අගමැතිතුමාට කිව්වා, එම පඩි ප්‍රශ්නය පිළිබඳව ගෙනෙන නීතිය හැකි ඉක්මණින් පිළිගන්නට මා නම් උදව් කරන්නට ලෑස්ති බව. ඔය තරම මදි, තව දියන්, කියමින් අප එය දික්ගස්සාවිය කියා අගමැතිතුමාගේ සිතේ ලොකු සැකයක් තිබුණා. එක දවසක් එතුමා ඒ වචනම පාවිච්චි කළා. [බාධාකිරීමක්] තව ඉල්ලීම එකක්; තිබෙන එක අල්ලා ගැනීම තව එකක්. එම නිසා ඒ නීතිය පැනවීම ගැන සැකයක් ඇති වීමට හේතුවක් නැති බව පිළිගන්නට පුළුවන්. හදිසි තත්ත්වය නැති කිරීම සම්බන්ධයෙන් මේ නීතියෙත් එවැනි තත්ත්වයක් තිබෙන්නේ වී නමුත්, යම් කිසි කරුණු ස්වල්පයක් ඉදිරිපත් නොකර මේ වැඩේට සහභාගි වන්නට අවස්ථාව වැදගත් වැඩියි.

සමුපකාර ක්‍රමය ගැන හෝ සමුපකාර ව්‍යාපාරය ගැන හෝ පළල් ලෙස කථා කරන්නට මා උත්සාහ කරන්නෙ නැහැ. එය මේ අවස්ථාවට ගැළපෙන්නෙ නැති නිසා නොවෙයි, මා ඒ ගැන උත්සාහ කරන්නෙ නැහැ. මේක මහජන ව්‍යාපාර යක්ය, ජනතාව සහභාගි වන ව්‍යාපාර යක්ය, මේ ව්‍යාපාරය සම්බන්ධයෙන් අපේ රටේ ලොකු උත්සාහයක් දරා තිබෙනවාය, ආදි කථා දැන් කාටත් පුරුදුයි. ඒ වගේම දැන් මේ ව්‍යාපාරයට ගුල්ලන් ගසා තිබෙනවාය, ඒ තත්ත්වය නැති කිරීමට ක්‍රමයක් නොහැදුවොත් මේ ව්‍යාපාරයත් නැති වී යනවාය කියන විධියේ කථාත් හොඳට පුරුදුයි. ලංකාවේ සමුපකාර සමිති ක්‍රමය ගෙන යන ආකාරය අනුව මේ ආණ්ඩුවේ එක අරමුණක් ඉෂ්ට වී තිබෙන බව මා කියන්නට ඕනෑ. එය සමුපකාර ක්‍රමයෙන් මේ රටේ මහජනතාව වත් අපවත් බලාපොරොත්තු වන අරමුණක් නොවෙයි, වෙනත් දෙයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තේරෙන හැටියට—පළල් ලෙස කියනවාට සමා වන්න—මේ ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළේ අර්ථය සහ එකම අරමුණ වන්නේ ධනපති පන්තිය තව තවත් දියුණු කිරීමයි. ඒ කියන්නේ, ඇති අය තව තර කිරීමත්, ධනපතින් සියන කොටසට තවත් අළුත් කොටස් එකතු කිරීමත් තමයි, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය. අළුත් ඉඩම් ප්‍රතිපත්තියේ අර්ථයත් එයයි. පසුගිය දවසක අගමැතිතුමා තමන්ගේ ඉඩම් ප්‍රතිපත්තියේ වැදගත් වෙනස් කිරීමක්, සාමාන්‍ය යමක් කියන විධියට ප්‍රකාශ කළ ඒ අවස්ථාවේ මා මේ ගරු සභාවේ නොසිටීම ගැන මා කණගාටු වෙනවා. අවුරුදු 30 ක කාලයකට පසු අගමැතිතුමා පිළිගෙන තිබෙනවා, රක්ෂා රහිත භාවයට පිළියමක් වශයෙන් රජයේ ඉඩම් ප්‍රතිපත්තිය සකස් කිරීම වැරදිය කියා. කෘෂිකර්මය දියුණු කිරීම අදහස් කර ගෙන ඉඩම් ප්‍රතිපත්තිය සකස් කළ යුතුය යන්න ආණ්ඩුව පිළිගෙන තිබෙනවාය කියා ගරු අගමැතිතුමා ප්‍රකාශ කර තිබෙනවා. මා එය පත්‍රයේ සහ හැන්සාඩ් වාර්තාවේ දැක්කේ පසුවයි. දැන් ගොවි රජවරුන් තෝරාගෙන යනවාය, ඔවුන් කෘෂිකර්ම කටයුතුවලට විශේෂ දක්ෂයන් බව ඔප්පු වී තිබෙනවාය, එවැනි අයට, වෙනත් සාමාන්‍ය ගොවීන්ට දෙන්නාවූ ඉඩම් කැබෙලිවලට වඩා විශාල ඉඩම් කැබෙලි හෝ ඉඩම් යායවල් දෙන්නට ආණ්ඩුව තීන්දු කර තිබෙනවාය, කියා අගමැතිතුමා ප්‍රකාශ කර තිබුණා. එසේ තීන්දු කරන්නේ අළුත් ප්‍රතිපත්තියක් අනුවලු. යම් පළාතක කෘෂිකර්මයේ යෙදී සිට එතැන තමන්ගේ කටයුතු ගෙන යාමට ශක්තියක් නැති බව එතැන තමන්ගේ ඉඩමත් නැති වීමෙන් ඔප්පු වූ අයට අළුතෙන් ජනපදවල ඉඩම් දී එහි හොඳින් වැඩ කරන්නට පුළුවන්ද බැරිද කියා බලනවා වෙනුවට, ඇත්තටම මේ කටයුත්තට දක්ෂයන් බව ඔප්පු කර තිබෙන අයට ප්‍රමාණවත් වන ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැබෙලි දීමට දැන් තීරණය කර තිබෙන වලු. මෙතැන තිබුණු වැදගත්ම වෙනස මේකයි.

මා ගැනම වචනයක් කියනවාට සමා වෙන්න. 1947 වර්ෂයේ මේ ගරු සභාවට පැමිණි දිනයේ සිටම මේ ඉඩම් ප්‍රශ්නය ගැන මා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ වර්ෂයේ මුල්ම අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී මා මේ ඉඩම් ප්‍රශ්නය ගැන යම් අදහසක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම මා කෘෂිකාර්මික ප්‍රශ්න ගැන විශේෂඥයකු නොවෙයි. නමුත් නියම අරමුණ කුමක් විය යුතු ද, කෙසේ ක්‍රියා කළ යුතු ද යන්න පැහැදිලි කර ගන්නවා නම් ඉඩම් ප්‍රතිපත්තිය කුමක් විය යුතුද යන ප්‍රශ්නය ගැන කථා කරන්නට විශේෂඥයකු වන්නටම වුවමනා නැහැ. ආණ්ඩුවේ එදත් තිබුණු, ඉන්පසු ඊයේ පෙරේදා වන තුරුත් තිබුණු ඉඩම් සංවර්ධන වැඩ පිළිවෙළේ එක්තරා දෙගිඩියාවක් තිබෙනවා. ඒක දැන් සිටින ඉඩම් සංවර්ධන ඇමතිතුමා පිළිපදින දෙගිඩියාවක්. මොකක්ද ඒ දෙගිඩියාව ? එක් අතකින් කෘෂිකර්මය දියුණු වුණත් නූතන රටේ උග්‍රවේගෙන යන රක්ෂා රහිතභාවයට පිළියමක් වශයෙන් ඉඩම් බෙදා හැරිය යුතුය කියා තීන්දුවකට බැසීමෙන් සිත සාදා ගන්නට බැහැ. ඒ අනුව කල්පනා කරන විට, ඉඩම් කැබැල්ල ඇත්ත වශයෙන්ම සාර්ථක ලෙස කෘෂිකර්මය සඳහා ප්‍රමාණවත් වේන වාද කියන ප්‍රශ්නය නොවෙයි වැදගත් වෙන්නෙ. බෙදන්නට තිබෙන ඉඩම් පික පුළුවන් තරම් වැඩි දෙනාට බෙදුවාම "නුඹටත් ඉඩම් අගලක් දුන්නා" ය කියා සැම දෙනාටම කියන්නට පුළුවනි. රක්ෂා නැති මිනිසුන්ට රක්ෂා දුන්නාය කියා ආණ්ඩුවටත් සෑහීමකට පත්වෙන්නට පුළුවනි. අගලවත්ත ප්‍රදේශයේත් ජනතාව අතර අක්කර කාලෙ, භාගෙ ඉඩම් කැබලි බෙදා හැර තිබෙනවා. සාර්ථක ලෙස කෘෂිකර්මයෙහි යෙදීම ගැන කල්පනා කර නවා නම් අක්කර කාලකින් භාගයකින් කුමක් කරන්නටද ? ඒ ඉඩම් කැබලි වල හරියාකාරව බතල සිටුවන්නටත් පුළුවන්ද ? අනික් වැඩ පිළිවෙළ රටේ වුවමනාව අනුව කෘෂිකර්මය දියුණු කිරීමේ අරමුණ මුල් කරගෙන ඒ ඒ ප්‍රමාණයට ඉඩම් බෙදා දීමයි. දැන් මේ දෙකම එකවර ක්‍රියාත්මක කිරීමෙන් මගේ විශ්වාසයේ හැටියට ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය කඩා කප්පල් වෙනවා. මේ තත්ත්වය පිළිබඳව ගරු අගමැතිතුමා නැත්නම් මේ ආණ්ඩුව දැන් ටිකක් සිත හදා ගෙන තිබෙන බව මට පෙනෙනවා. ඉඩම් බෙදන්නේ කෘෂිකර්මය සඳහා නම් කෘෂිකාර්මික වුවමනාවන් අනුව, ඒ ප්‍රතිපත්තියට හුරු වෙන්නට ඉඩම් ප්‍රතිපත්තිය සකස් කළ යුතුයි. ඒ ආකාරයට ඒ ගැන කල්පනා කිරීම මගේ විශ්වාසයේ හැටියට වැදගත් දියුණුවක් ; ඉදිරියට පියවරක් ගැනීමක්. ඒ ගෙන තිබෙන ප්‍රතිපත්තිය හා තීරණ හරි වුණත් වැරදි වුණත් ඒ ගැන මේ අවස්ථාවේදී කථා කරන්නට මට අයිතිවාසිකමක් නැහැ. ඒ වාගේම, මේ සමුපකාර ව්‍යාපාරය ගැනත් යම් මූලික තීරණවලට එළඹිය යුතු තත්ත්වයක් තිබෙනවා. මේ ආණ්ඩුවෙන් හෝ වේවා අපේ ආණ්ඩුවකින් හෝ වේවා මේ රටේ ඉදිරියේදී ඇති වන කුමන ආණ්ඩුවකින් හෝ වේවා එසේ මූලික තීරණවලට එළඹිය යුතුව තිබෙනවා. එසේ ඒ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වී තිබෙනවා. එසේ තීරණ නොගත්තොත් ජනතා ව්‍යාපාරයක් වශයෙන්, ජනතාවගේ සේවය සඳහා ගෙන යනවාය කියන මේ ව්‍යාපාරය විශාල වසංගතයක් වෙනවා.

විශේෂයෙන්ම මේ ආණ්ඩුව යටතේ දැන් අළුත් ධනපති කොටස් කීපයක් ඇතිවී තිබෙනවා. එයින් එක කොටසක්, නවීන ධනපති කොටසක්, තමයි මේ සමුපකාර සමිති සංගම්වල පාලකයින් වශයෙන් පත්වී හෝ ඒවාට පැන ඇතුළු වී සිටින්නාවූ හෝ කොටස. අද ඕනෑම ගමකට ගිහින් බැලුවොත්, රටේ ඕනෑම ප්‍රදේශයකට ගිහින් බැලුවොත්, අපට මේ අළුත් ධනපති කොටස, අළුත් සල්ලිකාරයින් පිරිස දකින්නට ලැබෙනවා. මේ කොටස දෙස ටිකක් විමසිල්ලෙන් බැලුවොත් ඔවුන් සමුපකාරය කාපු මිනිසුන් බව පෙනෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
සම්පූර්ණයෙන්ම ඇත්ත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

රාජ්‍ය ඇමතිතුමාගේ ඒ වචනයට මම බොහොම සන්තෝෂ වෙනවා. මම ප්‍රකාශ කළේ අප දෙපැත්තටම එකතුව පිළිගන්න පුළුවන් වචනයක්. ඒ සමගම අප අමතක කරන්ට නරකයි, සමූපකාර සමිතිවලින් හොරකම් කර, වංචා කර, අළුතෙන් ධනවතුන් බවට පත් වුණු මේ පිරිස දේශපාලනය අතින් ගම්වල දැන් බොහොම බලවතුන්ව සිටින බව. ඔවුන් ඡන්ද ගැරීමට අළුත් ගණන්කාරයින් වෙලා සිටිනවා.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

ඒ ගොල්ලන්ට ඡන්ද ගරන්ට බැහැ.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

බැරි විය යුතුයි, අගමැතිතුමනි. එහෙත් මම තව ටිකකින් ඔප්පු කරන්නම්. මම තමුන්නාන්සේලා එක් කෙනෙකු ගැන වත් පෞද්ගලිකව කථා කරන්ට කැමති නැහැ. සමූපකාර සමිතිවල කටයුතු කරන එක් එක්කෙනා ගැන මේ ස්ථානයේදී ඇනුම්පද කියන්නට මා කැමති නැහැ. එහෙත් මා දන්න දේවල් විස්තර කර මේ කරුණු ඔප්පු කරන්ට යාමේදී නමක් දෙකක් ගැවෙන විධියට කථා කරන්ට සිද්ධ වෙනවා.

සමූපකාර දෙපාර්තමේන්තුව මගින් අද මේ ව්‍යාපාරය පාලනය කරගෙන යන්නේ, අගලවත්තේ එය මෙතෙක් පාලනය කර ගෙන ඇවිත් තිබෙන්නේ, ඒ මගින් ඡන්ද වාසියක් ලබා ගැනීමේ අදහසින් බව මම පෙන්වා දෙන්නම්. මම එක්තරා පෞද්ගලික අවස්ථාවකදී අපේ කෘෂිකර්ම ඇමතිතුමාට කිව්ව, "එක්තරා කාරණයක් ගැන මට තමුන්නාන්සේ හමු වෙන්න ඕනෑ කර තිබෙනවා" කියා. එහෙත් ඊම එතුමා හමු වුණේ නැහැ. හේතුව මම තව ටිකකින් කියන්නම්. එහෙත් මට දෙවනුව නැවතත් ඇමතිතුමා හමු වෙන්න සිදු වෙයි. රටේ ඇමති ධුරයක් දරන කෙනෙකුට යම්කිසි කරුණක් සම්බන්ධයෙන් සාධාරණ ලෙස කරුණු ඉදිරිපත් කළාම ඒ ගැන ඔහු ක්‍රියා කරනවා ඇත කියා විශ්වාසය තබාගන්න මා කැමතියි. මා ඇමතිතුමා හමු වන්නට බලාපොරොත්තු වුණේ ඒ නිසයි. මම මේ පළල් ලෙස කියන කාරණය ඉවර වුණාට පසුව මම ඒ කාරණය මොකක්දැයි කියන්නම්. ඔවුන්ට ඡන්ද ගරන්ට පුළුවන්ද බැරිද කියන ප්‍රශ්නය ගැන අගමැතිතුමා සමග වාද කරන්ට මා කැමති නැහැ. මෙවැනි හොරුන්ට එවැනි දේ කරන්ට බැරි වෙයි කියා විශ්වාස කරන්ට මම කැමතියි. එහෙත් කළුකඩ ක්‍රමය අපේ රටේ පැතිරී ගොස් තිබෙන ආකාරය අනුව එයට ගැවුණු, ඇදුණු, ගැට ගැහුණු පිරිස විශාල නිසා අද රටේ දේශපාලනය අතින් ඉතා මත්ම බලසම්පන්න කොටසක්ව සිටින්නේ මේ අළුත ධනපතීන් බවට පත් වුණු කළුකඩ ක්‍රමය සකස් කළ උදවියම හෙයින්, මේ සමූපකාර හොරුන්ගේ දේශපාලන බලයත් ඒ කළුකඩකාරයින්ගේ දේශපාලන බලයට හුරු දෝ කියන සැකයක් මා තුළ තිබෙනවා. මම වැරදි නම් වැරදි වේවා. ඡන්දය කෙසේ වෙතත් ව්‍යාපාරය පාලනය කරන දෙපාර්තමේන්තුවල නම් ඔවුන්ට පුදුම බලයක් තිබෙන බව මට දැන් ඔප්පු කරන්ට ශක්තියක් තිබෙනවා. මෙයින් එක කෑල්ලක් ඔප්පු කිරීමට සඳහායි ඇමතිතුමා හමු වන්නට මා බලාපොරොත්තු වුණේ. ඒකෙ සාරාංශය විතරක් මම කියන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අගලවත්ත ඡන්ද කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මම පත් වී, කාලය සම්පූර්ණ වුණාට, දැන් අවුරුදු $1\frac{1}{2}$ ක් ළඟා වීගෙන එනවා. ඒ කාලය තුළ මට ඒ පළාතේ නොයෙක් ප්‍රශ්න ගැන එක්තරා දැනීමක් ලබා ගැනීමට අවකාශ ලැබී තිබෙනවා. මට පෙර සිටිපු මන්ත්‍රීතුමාට වගේ ඒ පළාත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන විස්තර සහිත දැනීමක් මට තවම තිබෙනවා යයි කියන්ට බැහැ. එහෙත් ප්‍රමාණවත් දේවල් මා දැනගෙන තිබෙනවා. මෙයින් මට දැනනොගෙන සිටින්නට බැරි වූ පැත්තක් තමයි මේ සමුපකාරයට සම්බන්ධ පැත්ත. මෙහි සිටි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා මේ අවස්ථාවේ මෙතනින් ඉවත්ව ගොස් සිටීම ගැන මට කණගාටුයි. මා එසේ කීවේ එතුමාගේත් මේ ප්‍රශ්නයට ගැටීමක් තිබුණු බව මතක් කරන්නට තිබෙන නිසයි. [බාධාකිරීමක්] අපේ මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කියනවා අනික් වාරයේ එතුමා අගලවත්තට ඉදිරිපත් වෙනවාය කියා. ඒ කියන්නේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා අනික් වර අගලවත්තට ඉදිරිපත් වෙනවාය කියන එකයි. ඒ ගැන නම් මා දන්නේ නැහැ. එහෙත් සතිපතා අගලවත්තට යන එක නම් ඇත්තයි. ඒ ගැන මගේ කණගාටුව, එයින් නරකක් සිදුවන එක ගැනයි. ඇමතිතුමෙක් අගලවත්තට නිතර යනවා නම් මා වැනි සාමාන්‍ය මන්ත්‍රීවරයකුගෙන් නොකෙරුණු වැඩ ඒ ඇමතිවරයාගෙන්වත් කෙරෙන්නට ඕනෑ නේද? නොකෙරෙන වැඩ නම් කෙරෙනවා; නමුත් ඒවා කළ යුතු වැඩද කියා නම් මා දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෑතකදී සිදු වූ සිද්ධියක් මම කියන්නම්. බැරිම තැන සාමාන්‍යයෙන් කෙරෙනවාට මා අකමැති පියවරක් ගන්නය කියා මා දෙපාර්තමේන්තුවට ලියමනක් යැව්වා. පැලවත්තේ වැදගත් සමුපකාර සමිතියක් තිබෙනවා. පැලවත්ත කියන්නේ බෙන්තර-ඇල්පිටිය පැත්තට යාවන අගලවත්තේම කොටසක්. එම පැලවත්ත සමුපකාර සමිතියේ ගණන් පරීක්ෂාවක් අවුරුදු 4 කින් කෙරී නැහැ. වෙනත් විධියකටත් කියන්නම්. ගණන් පරීක්ෂක නිලධාරීන් පැමිණීමේ නියමයක් ඇති වුණේ අවුරුදු 4 කට පසුවයි. පුදුමය නම් ඒ අවස්ථාවේ රටපුරාම පුරුදු සිදුවීමකුත් එතන ඇතිවීමයි. ගණන් පරීක්ෂකතුමා සමිතියේ පොත්පත් අත්පත්කොට ගන්නට ප්‍රථම එක දවසක රාත්‍රියේ ගෙවල් බිඳුමක් ඇති වුණා. නොයෙක් විට ගෙවල් බිඳීම් ඇති වෙනවා. ගෙවල් බිඳුම් ඇති වූ විට රෙදි පිළි ආදී දේවල් හොරකම් කරගෙන යනවා. එහෙත් එවැනි දේවල් මේ ස්ථානයේත් තිබුණු නමුත් ඒ ගෙය විශේෂ හොරු පිරිසක් බිඳ තිබුණු නිසා ගෙනගොස් තිබුණේ සියලුම ගණන් පොත් සහ ගොවීන්ට ණය දුන් ඔප්පුත් පමණයි. ඒ සියල්ලක්ම ගෙනගොස් තිබුණා. ඒවා අතුරුදහන් වෙලා. සොයාගන්නට බැහැ. මේවා නැතිවීමෙන් වාසිය ඇති වන්නේ කාටද කියා තේරුම් ගන්නට අමුතු ඥානයක් ඕනෑ නැහැ. අපි සාමාන්‍යයෙන් උසාවිවලදී ජූරි සභාවලට කියන දෙයක් නම් කෙරුවේ කවුද නැත්නම් කෙරෙව්වේ කවුද නැත්නම් කවුරු වෙනුවෙන් කෙරෙව්වාද කියා දැනගන්නට නම් මෙයින් ඇති වන්නේ කාගේ වාසියද කියා බලන්නය කියන එක. මේකට ලැටින් භාෂාවෙන් කියනවා *cui bono?* කියා. කාගේ වාසියටද කාගේ හොඳටද කියන එකයි. මෙතැන එය තේරන්නට දෙයක් නැහැනේ? පරීක්ෂකයින් ගණන් පරීක්ෂාවට එන්නට හදන අවස්ථාවේදීම ගණන් පොත් ටිකත් ණය ඔප්පු ටිකත් අතුරුදහන් වෙනවා නම් වෙන තැනක නම් ඒවායේ ආරක්ෂකයා වශයෙන් සිටි පාලකයා නවත් මිනිත්තුවක්වත් එහි තබා ගන්නේ නැහැ. අඩු වශයෙන් වැඩ තහනම් කර ඒ ගැන සොයන තුරු එහි කටයුතු සම්බන්ධයෙන් වෙනයම් ක්‍රමයක් ඇති කරනවා. එහෙත් මේ ස්ථානයේ තවමත් පාලකයා වශයෙන් සිටින්නේ අර පොත් නැතිවීමේ වාසිය ලැබූ තැනැත්තාමයි.

මේ ණය ඔප්පු ප්‍රශ්නය ගැන මට කලින් ආරංචි ලැබී තිබුණා. මට අහම්බෙන් ලැබෙන ආරංචියක් අනුව මම කවදාවත් දෙපාර්තමේන්තුවකටවත්, එය භාර ගරු ඇමතිවරයකුටවත් පැමිණිලි ඉදිරිපත් කරන්නේ නැහැ. ඒක සමහර විට මගේ ටිකක් වැරදි, නරක ගතියක් වෙන්නට ඕනෑ. කවුරු හරි වගකීමක් ඇතිව ලියවිල්ලකින් මට ඉදිරිපත් කරන චෝදනාවක් නම් පමණයි, නිසි තැන සොයා එය යවන්නේ. එවැනි චෝදනාවක් වුවත් මගේ චෝදනාවක් හැටියට යවන පුරුද්දක් මට නැහැ. ලැබුණු දෙය පරීක්ෂණයට නිසි තැනට යවන පුරුද්දයි මට තිබෙන්නේ.

මට ලැබුණේ පුදුම ආරංචියක්. ණය ඉල්ලුම් කළ අයට ණය මුදල් දුන් බව පොත්වල සඳහන් කර තිබියදී ඒ අයට දිය යුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ණය මුදලින් වැදගත් කොටසක් නොදී එය පාලකයා විසින් අත්පත් කරගෙන තිබීම ගැන පෙත්සම් යැවීම නිසා අහු වන්නට යන විට ණය ඔප්පු පෙන්වන්නට සිදුවන තැනට කටයුතු සැලසී තිබුණු බව පළමුවෙන්ම මතක් කරන්නට කැමතියි. එවැනි වෙලාවක මොකක්ද වුණේ? ණය ඔප්පු නැහැ. කමක් නැහැ. බැරිම තැන මම දෙපාර්තමේන්තුවට කියා සිටියේ මෙපමණයි. මම දෙපාර්තමේන්තුවට එය ලියවිල්ලකින් දන්වා යැව්වා. මෙවැනි සිද්ධියක් වෙලා තිබෙනවාය, මේ ගැන පරීක්ෂා කිරීම පොලීසියට අයිති දෙයක් වන්නටත් පුළුවනි, එහෙම නැත්නම් සමුපකාර දෙපාර්තමේන්තුවට අයිති දෙයක් වන්නටත් පුළුවනි. එය වෙනම ප්‍රශ්නයක්. ඒ සම්බන්ධයෙන් මගේ කිසිම ඇඟිලි ගැසීමක් නැහැ. ඒ විධියට සඳහන් කරමින් එක් ඉල්ලීමක් කළා. කරුණාකර ඒ ඉල්ලීම ඉටු කර දෙන්නැයි කිව්වා. අගලවත්තේ සමුපකාර සමිති සංගමය තෝරා පත් කරගෙන සිටි පාලක මණ්ඩලයට හෙවත් කොමිටියට නියෝගයක් නිකුත් කරමින් දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද පාලක පිරිසකට එහි කටයුතු භාර දුන්නාක් මෙන්, කරුණා කර මේ ප්‍රශ්නය විසඳා සුද්ද බුද්ද කර අවසන් වන තුරු මෙහි පාලනය ඒ විධියට දෙපාර්තමේන්තුවෙන් විශේෂයෙන් පත් කරනු ලබන අයට භාර දෙන්නැයි කියා සිටියා.

මේ ගැන කල්පනා කර බලන්න. මගේ ඉල්ලීම වූයේ කුමක්ද? ඡන්දයෙන් තේරෙන සමුපකාර සමිතිවල අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට වැඩ කරන ලෙසයි මා ඉල්ලා සිටියේ. එහෙත් මා දන්න හැටියට සිදු වී තිබෙන්නේ මොකක්ද? බෙහෙත් දිය යුත්තේ ලෙඩේට හරි යන විධියටයි. ඒ විධියට වැඩ කරන ලෙසයි මා ඉල්ලා යැව්වේ. මට දැනගන්නට ලැබී තිබෙන හැටියට නම්, අද දක්වාම එහි පාලනය කරගෙන යන්නේ එම පාලකයාමයි. මොනවා පාලනය කරනවාද, කොතැනින් පාලනය කරනවා දැයි මම දන්නේ නැහැ. මම කියන්නේ මෙපමණයි. මම මෙතනදී මහජනයා වෙනුවෙන් අවශ්‍ය නම් ගරු ඇමතිතුමාට වැදලා වුනත් මේ ගැන කියන්නට ඕනෑ. මෙවැනි දේවල් සමුපකාරයේ යෙදී සිටින්නන්ගේ ඇස් ඉදිරිපිටම කෙරෙන විට, ගරු ඇමතිතුමා කෙරෙහි මෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව කෙරෙහිත් මහජනයා තුළ තිබිය යුතු විශ්වාසය නැති වී යනවා නොවෙයිද? ඒ බව ගරු ඇමතිතුමාට වුණත් පෙනී යනවා නොවෙයි ද? මුළු පළාතම මනින්නේ මෙවැනි වැඩවලින් නොවෙයිද? මුළු සේවයම මනින්නේ මෙවැනි වැඩවලින් නොවෙයිද? කොච්චර හිත හොඳ වුනත් මදි නේද? මේවා සුද්ද කරන්නට පියවරක් ගන්නට ඕනෑ.

මම එක් කාරණයක් ඉදිරිපත් කරන්නට කැමතියි. මේ ගැන මතක් කරන්නටයි ආවේ. ගරු මන්ත්‍රීවරයෙක් සමුපකාරය සුද්ද බුද්ද කිරීම සඳහා ගරු ඇමතිතුමාට ආධාරයට ඉදිරිපත් වුණාම ඒ මන්ත්‍රීවරයාටත් යම්කිසි හානියක් සිද්ද වීමට ඉඩ තිබෙනවා. මේවා සුද්ද බුද්ද කිරීමට යම් ඇමතිවරයෙක් ඉදිරිපත් වෙනවා නම් ඒ සඳහා දිය හැකි සම්පූර්ණ ආධාරයම දෙන්නට මම ලෑස්තියි. මට මොන ජරමරයක් වුනත් කමක් නැහැ. එහෙම නැතිව මේවා කරන්නට බැහැ.

අගලවත්තේ සමුපකාර සමිති සංගමයක් තිබෙනවා. ඊට කියන්නේ පස්දුන් කෝරළයේ සමුපකාර සමිති සංගමය කියායි. එහි ඉතිහාසය ගැන කියන්නට යනවා නොවෙයි මම. වුවමනා නම් ඒ ගැන නොයෙක් දේවල් කියන්නට පුළුවනි. මේ සමුපකාර සමිති සංගමයට විශාල වශයෙන් ලාභයක් ලැබුණු එක්තරා කාලයක් තිබුණා. අවුරුද්දකට ලක්ෂයකටත් වැඩියෙන් ලාභ ලැබුණු කාලවල් තිබුණා. රු. 87,000 ලැබුණු වර්ෂ මෙන්ම රු. 1,20,000ක් ලැබුණු වර්ෂත් තිබුණා වෙන්නට ඇති. හරියටම නියම ගණන් ඉදිරිපත් කරන්නට මට මේ අවස්ථාවේ පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම මේ නියම ලාභ ගණන් කියනවා නොවෙයි. විශාල වශයෙන් ලාභ ලැබුණු කාලවල් තිබුණු බවයි මට කියන්නට වුවමනා කරන්නේ. මෙය ඇත්තෙන්ම විශාල වශයෙන් ලාභ ලැබිය යුතු සමිති සංගමයක්. අගලවත්ත විශාල ප්‍රදේශයක්. පස්දුන් කෝරළය ඊටත් වඩා විශාල ප්‍රදේශයක් මොන කාරණයක් නිසා හෝ ඒ ගැන විවාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට මම දැන් කැමති නැහැ. දැන් එතැන තිබෙන තත්ත්වය කුමක්ද? එතන තිබුණු, සමූපකාර සමිතිවලින් පත් කරන ලද පාලක කොමිටිය අස් කර, දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද පාලක කොමිටියක් නැත්නම් පාලක මණ්ඩලයක් ඒ වෙනුවට පත් කළා.

මා අගලවත්තට පත්වුණායින් පසුව මේ අවුරුද්දේ මුල් කාලයේදී මෙහි සභාපති වශයෙන් පළාතේ ඩී. ආර්. ඕ. හෙවත් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැන පත්වුනි. ඔහුගේ නම මෙහි කීම සුදුසු නැති නිසා මා එය කියන්නේ නැහැ. මා එහි ගිය කාලයේදී මට දැනගන්නට ලැබුණු දේ නිසා මගේ හිත ටිකක් හෙල්ලුණු බව නම් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. ඒ දේවල් මොනවාදැයි එකින් එක මෙහිදී මා කියන්න යන්නේ නෑ. ඒවා ඔප්පු කිරීම නිසි තැන්වලින් සිදු විය යුතුයි. මේ ස්ථානයේදී අරයාගේ මෙයාගේ වැරදි කීම සුදුසු නැහැ. මෙකී ඩී. ආර්. ඕ. තුමා අගලවත්තට පත් කරනු ලැබ සිටියේ ඩී. ආර්. ඕ. කෙනෙකුට අයිති වැඩ කරන්නට නොව එක්සත් ජාතික පක්ෂයේත් විශේෂයෙන් මා සමග තරග කළ ඩේවිඩ් අප්පුහාමි මහතාගේත් ඡන්ද වැඩ කිරීමට බව නම් මට පැහැදිලි ලෙසම ඔප්පු වුණා. ඒ ගැනත් මගේ රණ්ඩුවක් නැහැ. එක්තරා අතලොස්සකට හැර අනෙක් සියලුම ආණ්ඩුවේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දිය යුතු බව මා පිළිගන්නවා. එසේ පිළිගන්නාවූ මා, තමාට ඒ බලය ලැබෙන්නට පෙර ඕනෑම නිළධාරියකු දේශපාලන වැඩ කළාට මා කවදාවත් කිසිම ආණ්ඩුවකට ඔහුට විරුද්ධව වාර්තාවක් යවන්නේ නැහැ. යවලාත් නැහැ. එවැනි අවස්ථාවලදී අප ඊට නිසි විධියට මුහුණ දී සටන් කළ යුතුයි. එහෙත් මෙවැනි තත්ත්වයක් දරන කෙනෙකු ඔහුට බාර වී තිබෙන කටයුතු වැරදි ක්‍රමයකට කරන ගතියක් හා පුරුද්දක් ඇති බව පෙනෙනොත් මහජන මන්ත්‍රීවරයකු වශයෙන් මට ඒ ගැන රණ්ඩු නොකර සිටින්නට බැහැ. සාමාන්‍ය පුරවැසියකුට වුවත් එවැනි දෙයක් ගැන රණ්ඩු නොකර සිටින්නට බැහැ. ක්‍රමාණුකූලව විශාල වශයෙන් ලාභ ලබමින් තිබුණු මේ සමූපකාර සමිතිය, දෙපාර්තමේන්තුව විසින් බාර කරන ලද පාලක මණ්ඩලය යටතේ, ඒ ලාභ වෙනුවට විශාල වශයෙන් පාඩු විඳින්නට පටන් ගත් බවත් අවුරුද්දෙන් අවුරුද්දට එම පාඩු වැඩි වන්නට පටන් ගත් බවත් ගරු ඇමතිතුමා ඕනෑම වේලාවක වාර්තාවක් ලබාගෙන පරීක්ෂා කළොත් පෙනී යනවා ඇති. අසූ දාහ, ලක්ෂය ආදී වශයෙන් ලාභ ලැබූ තැනින් ඒ තරමටම පාඩු වන්නට පටන් ගත්තා. මේ ස්ථානයට පත් කරනු ලැබ සිටි ගබඩා භාරකරුගේ පෞද්ගලික ආදායම හා දේපොල පිළිබඳ ව ආණ්ඩුව විසින් රහස් පරීක්ෂණයක් පැවැත්වුවහොත් මෑත අවුරුදු කීපය ඇතුළතදී ඔහුගේ ඉඩම් ප්‍රමාණය කොපමණ විශාල වී තිබෙනවාද යනාදී පුදුම දේවල් ඔප්පු වෙනවා ඇති.

මේ ගබඩා භාරකරුගේ එක්තරා වංචනික ක්‍රියාවන්—පොඩි ගණනක නොව විශාල ගණනක වංචනික ක්‍රියාවක්—1967 අසු වී උදේ ඔහුගේ වැඩ නතර කරනු ලැබුවා. එහෙත් හැන්දෑවේ ඔහු නැවතත් පත්වුණා. මෙය දැන් නඩුවකට ගැවුණු දෙයක් නිසා මා මේ වචන වැරදි විධියට නොකිව යුතුයි. පැලවත්තේ සිදු වුණු දේට හුරු දෙයක් මෙහිත් සිදු වුණේ. හිඟයක් ඇති වුණා. රෑක හදිසියේම ගෙවල් බිඳුමක් සිදු වුණා. රුපියල් 13,000 ක් හොරුන් ගත් බවට ප්‍රශ්නයකුත් මතු වුණා. පොලීසියෙන් ඇවිත් ඇල්ලුවා. ඇල්ලුවේ උදේ. හැන්දෑව වන විට මුදලෙන් කොටසක් සමිතියට ගෙවූ නිසා සැකකරුවා ගෙදර යැව්වා. මේ කරුණ ගැන දෙපාර්තමේන්තුවට ගිය වෙනත් විස්තර හේතුකොට ගෙන දැන් මෙය උසාවියට ගොස් තිබෙන නිසා මෙහි විස්තර කිරීම වැරදියි. සභාපතිතුමා මට ඊට ඉඩක් දෙනවායයි මා හිතන්නේ නැහැ. සභා රීති අනුව මා එවැනි ඉඩක් ලබා ගැනීමට උත්සාහ කරන්නේත් නැහැ. මා කියන්නෙ මේකයි.මා අවුරුද්දක් ඉවසා බැරි තැන අන්තිමේදී මොකක්ද වුණේ? මගේ ගතියක් නැහැ, පුරුද්දක් නැහැ, සභාපතිතුමනි—මේක කිව්වාට මට වරදක් කියන්න එපා—කිසිම නිලධාරියකුට ප්‍රසිද්ධියේ පහර ගහන්න. මා වැල්ලවත්ත-ගල්කිස්ස ආසනය වෙනුවෙන් පෙනී සිටි කාලෙවත් මා කවදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

වත් නිලධාරියෙකුට ප්‍රසිද්ධියේ පහර ගැසීමේ යෙදුනේ නැහැ. මා සැම තිස්සේ ම උත්සාහ ගත්තේ එයින් වළකින්නයි. මිනිස්සු හඳුන්න මා වෙනත් විධි සොයනවා. මා මිනී මරන්න කැමති නැහැ. ඔව්, අද නඩුවකට අසු වී සිටින ඉන්ස්පෙක්ටර් අමරසේකරගේ නොයෙක් ඒවාත් මගේ අතේ තිබියදී මා නැහැ ඒ මිනිහා මරන්න ඉදිරිපත් වුණේ. මා පිට රට ලෙඩින් පසු වන විට වූ දෙයක් ගැන දැන් මිනී මැරෙන තත්ත්වයකට පැමිණී තිබෙනවා නම් ඊට වගකිය යුත්තේ තමන්ම මිසක් මා නො වෙයි. ඒ ගැන මා වැරදි කාරයෙක්දෝ කියාත් මගේ සැකයක් තිබෙනවා ඒක නොකර හිටියට.

මා කලින් සඳහන් කළ පරිදි, සභාපතිතුමනි, අවුරුද්දක් ඉවසා සිට බැරි තැන මා අගලවත්තට දැනගන්න ඉඩ දුන්නා අය වැය ලේඛන සාකච්ඡාවේදී—විශේෂයෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය ඉදිරිපත් වන අවස්ථාවේදී—අගලවත්තේ සමිති ප්‍රශ්නය මුල සිට අග දක්වා විස්තර කරනවාය, වෙනත් විධියක් නැත මේක හඳන්න කියා. එහෙත් පුදුම දෙයක් සිද්ධ වුණා. මට ඉන් පසුව ආරංචි ලැබෙන්න පටන්ගත්තා, සභාපතිතුමා, ඩී. ආර්. ඕ. මහතා, ඉල්ලා අස්වෙන්න යනවාය කියා. මා හිතට ගත්තා එසේ ඉල්ලා අස්වීමෙන් ප්‍රශ්නය ටිකක් විසඳා ගැනී මට අලුත් පාරක් පෑදේය කියා. ඇත්තට ඒ විධියට වුණොත් හොඳය කියා සිටින විට දෙපාර්තමේන්තුවෙන් පුදුම දෙයක් සිද්ධ වුණා. අන්න ඒකයි මට තවමත් නොතේරෙන්නෙ. හෙට උදේටයි ඔය ප්‍රශ්නය ගැන මගේ කරුණු ඉදිරිපත් කිරීම තිබුණේ. අද රෑ මා ගෙදර සිටින විට මට දෙපාර්තමේන්තුවෙන් සීඝ්‍රගාමී ලියමනක් එනවා. මොකක්ද දන්නෙ නැහැ, දෙපාර්තමේන්තුවට තිබුණ හදිස්සිය. ඒ ලියමනෙන් මට දන්වා තිබුණේ ඩී. ආර්. ඕ. මහතා ඉල්ලා අස්වීමේ ලියුමක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බවයි. හපොයි, අම්මේ මට තවම තේරෙන්නෙ නැහැ, සීඝ්‍රගාමී ලියමනකින් මට ඒ බව දැනුම් දෙන්නට දෙපාර්තමේන්තුවට තිබුණ වුවමනාව මොකක්ද කියා. උන්නැහේට ඉල්ලා අස්වෙන්නය කියා දෙපාර්තමේන්තුවෙන් උන්නැහේගෙන්වත් මා ඉල්ලීමක් කර තිබුණේ නැහැ. එහෙත් ලියමනක් ආවා. මා ඔය ගැන මොකුත් නොදැන සිටි, ඊයෙ පෙරේදා ඉපිදුණ කිරි බොන දරුවෙක් නොවෙයි. මා උසාවිවල වැඩ කරමින් සිටින, ලෝකයේ ඇති නොයෙකුත් ගැට මොනවාද කියා දන්න, ඒ ගැට ලිහන කෙනෙක් නිසා මට යමක් තේරෙනවා. ඒ නිසා මට තේරුණා, මෙයාගේ තිබුණ බල තල මගින් දෙපාර්තමේන්තුවට කියා "උඹ මේ ගැන හෙට කථා කරන්න වුවමනාවක් නැහැ" යන අදහස දැම්නු දීමට තමයි කෙසේ හෝ ඒ රාත්‍රියේම ලියමන යවා ගන්න කටයුතු කෙළේ කියා. ඇත්තටම ඒ බලාපොරොත්තුව අනුවම මා පසුවදා ඒ ගැන කථා කෙළේ නැහැ. මිනිහා යනවා නම් දැන් ඉතින් මිනිහාගේ වැරදි මොනවට සොයනවාද? සමුපකාරය පිළිබඳ සාකච්ඡාව අවසන් වුණා. ඇමතිතුමනි, මේ කථාව මෙහෙම කිව්වට සමාවන්න. මාසයක් ගත වුණා. මේ අවස්ථාව වන විට සමුපකාර ප්‍රශ්නය ගැන මට කථා කිරීමට යම් අවස්ථාවක් තිබුණා නම් ඒ අවස්ථාව පැමිණ එය පසු වී ගිහිල්ලත් ඉවරයි. මාසෙ අන්තිමේදී මොකක්ද වෙන්නෙ? සීඝ්‍රගාමී ලියුමෙන් දැනුම් දුන් ඒ ඉල්ලා අස්වීමේ ලිපියත් ඉල්ලා අස් කර ගත්තාලු. එයා ආයෙත් වැඩ. මා කල්පනා කළා, දැන් ඉතින් මා මොකක්ද කරන්නෙ කියා. මා තව එක වචනයක් කිව්වාට පසුව ඇමතිතුමා සමග මේ ගැන කළ කථාවක් කියන් නම්.

ඊ ළඟට අගලවත්තේ වාසනාවට වාගේ—මගේ වාසනාවට නොවෙයි, මට මේකට කිසි ආශාවක් නැහැ—සමුපකාර ප්‍රශ්නයට අදාළ වූ හදිසි බලතල ඉවත් කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන බව මට ආරංචි වුණා. මට නැවත අවස්ථාවක් ලැබෙන්න යන බවක් පෙනුණා. ඒ අවස්ථාව ලැබෙන්න කලින් මා ගරු ඇමතිතුමා එක්තරා අවස්ථාවකදී—එක්තරා තැනකදී—මට හමුවුණ විට කිව්වා, එක්තරා කාරණයක් ගැන කියන්න මට තමුන්නාන්සේ හමු වෙන්න ඕනෑය කියා. මා මේ ගැන කියන්න අදහස් කළේ ඒ මිනිහාට පහර ගැසීමේ අදහසින් නොවෙයි. මෙවැනි දෙයක් දෙපාර්තමේන්තුවකින් සිදුවෙනවා නම් මේ පැත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක් නොවෙ, අර පැත්ත ගැනත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවීම සඳහායි. කොහොම හරි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔහු සථිර වශයෙන් අසු වී වෙනත් කෙනෙකුට ඒ වැඩ භාර දී තිබෙනවා. ඒ ගැන මගේ සතුට මේ අවස්ථා වේදී ප්‍රකාශ කරනවා. අපට වුවමනා කරන්නෙ මේ කටයුත්ත කොයි විධියට හෝ කෙරෙන්නයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිනීතිඥයෙක් වශයෙන් මා උසාවියේදී කරන වැඩවලින් දැන ගත් දේවල් සම්බන්ධයෙනුත් මා යමක් කියන්න කැමතියි. ගරු ඇමතිතුමාට මා කියන්න කැමතියි, ඉතාමත් පුදුම දේවල් සිදුවන බව. දැන් තවත් පුරුද්දක් ඇති වී තිබෙනවා. එනම් ගෙවල් බින්දවීමයි. ගෙවල් බිඳින්නේ නැහැ ; බිඳපු බවට ලකුණු ඇති කරනවා. බිඳින්නෙත් ඇතුළෙන්මයි. ඒ විධියේ එක් අවස්ථාවක් මට පෙන්වා දෙන්න පුළුවනි. වහලේ උළු කැට වගයක් එහා මෙහා කර තිබුණා. ඒ එහා මෙහා කර තිබුණ උළු කැට අතරින් බළල් පැටවෙකුටවත් රිංගන්න බැහැ. නමුත් පොලිසිය පිළිගත්තා ඒ සිදුරු අතරින් හොරු රිංගුවාය කියා. ඔන්න ඔය විධියයි තත්ත්වය. මුළු රටේම, අපේ සමාජයේ අපේ මේ ප්‍රසිද්ධ සේවාවන් තුළ, විශාල දූෂණයන් රිංගා ගෙන පැතිරී ගෙන ගොස් තිබෙනවා. මේවායින් පොලිසියත් යට කරනවා ; නිලධාරීනුත් යට කරනවා. සවදේශ කටයුතු භාර ඇමතිතුමාත් මේවාට ගැටෙන බවක් මා කිව්වේ ඇයි ? අර ඩී. ආර්. ඕ. මහතා ඒ ස්ථානයට යවා තිබෙනවා. ඔහු ඒ ස්ථානයට යැව් වේ කව්ද ? ඇමතිතුමා විසිනුයි. ඒ ඩී. ආර්. ඕ. මහතා එම සමුපකාර වැඩ කටයුතු කිරීමට පත් කළේ මොන සුදුසුකමක් උඩද කියා මා අසන්න කැමතියි. සමුපකාර ව්‍යාපාරය තුළ ඒ මහතා කර තිබෙන දේවල් ගැන—ඔහුගේ ඉතිහාසය ගැන—දෙපාර්තමේන්තුවෙන්ම සොයා ගන්න පුළුවනි. ඔහු මොන තත්ත්වයේ සිට පැමිණි කෙනෙක්ද කියා ඒ ඇමති අංශයෙන්ම දැන ගන්න පුළුවනි. ආණ්ඩුවක් මගින් නැත්නම් ඇමති අංශයක් මගින් මෙවැනි දේවල් මෙවැනි පත්වීම් කළ විට කවුරුත් පිළිගන්නේ මුළු ආණ්ඩුවම එවැනි දේවල් පිටුපසින් සිටිනවාය කියායි. මුළු ආණ්ඩුවම එයට ආධාර දෙනවාය කියායි කවුරුත් සිතන්නෙ. එයින් සිදු වන්නේ මුළු ආණ්ඩුවම අපකීර්තියට පත්වීමයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි කටයුතු සම්බන්ධයෙන් අපි යම්කිසි තීන්දුවක් ගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව අද ඉවර වෙන්න පුළුවනි. තව අවුරුද්දකින් ඉවර වෙන්නත් පුළුවනි. කවදාවත් ඉවර නොවෙන්නත් පුළුවනි. එය වෙනම ප්‍රශ්නයක්. නමුත් අප කා කෙරෙහිත් මේ රට සම්බන්ධයෙන් යම්කිසි ආලයක්, ආදරයක් තිබෙනවා. ජාත්‍යාලය ගැන අපි හැමෝම දොඩවනවා. සමුපකාර ව්‍යාපාරය වැනි ජනතා ව්‍යාපාරයකින් අපට සෙතක් වන විධියට වැඩ ගැනීමට පුළුවන් බවත් අප දන්නවා. අන්න ඒ වැඩ ටික කර ගැනීමට අප කවුරුත් එකතු වෙන්න ඕනෑ. ඒ නිසා මේ ව්‍යාපාරය පිරිසිදු කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා තවත් වචනයක් කියන්නම්. කවුරුවත් පුදුමයට පත් වෙන්න එපා. මගේ පුද්ගලික මතයක් වශයෙනුයි මා එය කියන්නෙ. මේ රටේ මුළු සමුපකාර ව්‍යාපාරයම එකම සමුපකාර ව්‍යාපාරයක් වශයෙන් එකම කේන්ද්‍රස්ථානයකින් එකම දෙපාර්තමේන්තුවකින් පාලනය කිරීමට යාම අඥාන වැඩක්. හැම පළාතකම හැම අංශයකම තිබෙන සමුපකාර කටයුතු එකම ස්ථානයකින් පාලනය කිරීම අඥාන දෙයක්. මේ ව්‍යාපාරය දැන් බොහොම විශාල වැඩියි. මෙය දැන් එක් දෙපාර්තමේන්තුවක් මගින් කර ගෙන යන වෙළඳ ව්‍යාපාරයක් බවට පත්ව තිබෙනවා. ඇත්ත වශයෙන්ම මහජනයා විසින් සකස් කර ගන්නා ලද සමුපකාර ව්‍යාපාරයක් නැති වෙන තත්ත්වයක් ඇති වී තිබෙනවා. මෙහිදී තවත් දෙයක් සිදු වෙනවා. දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂකවරුන්, ඉන්ස්පෙක්ටර්වරුන් ආදී නිලධාරීන් පත් කරනවා. අන්තිමේදී සිදු වන්නේ ඒ අයත් නරක මිනිසුන් වීමයි. මා මීට අවුරුදු ගණනකට ඉහතදී සමුපකාර නිලධාරි මහත්වරුන් විසින් කරනලද ආරාධනයක් උඩ සමුපකාර සමිති සංගමයක සංවත්සරික උත්සවයකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]
ගියා. ඒ ගිය අවස්ථාවේදී මට කරන්නට සිදු වූ කථාවේදී මා කී වචනයක් මෙම ගරු සභාවේදීත් කියන්නට මා ඇමතියි. එදා කථා කළ හැම නිලධාරියාම ප්‍රකාශ කෙළේ සමුපකාර සමිති ක්‍රමය දියුණු කිරීමට තමන්ට ලොකු ආශාවක් තිබෙන බවයි. "මෙතරම් ආශාවකින් සිටින තමුන්නාන්සේලාගෙන් එක් කෙනකු හෝ කවදාවත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ දරන නිලය අතහැර දමා සමුපකාර සමිතියක නිලයක් ලබා ගැනීමට ඉදිරිපත් වුණාද?" යනුවෙන් මා නැගූ ප්‍රශ්නයට "නැත" යන පිළිතුර ලැබුණු බව මගේ විශ්වාසය යයි. දෙපාතර්මේන්තුවේ සිටින නිලධාරීන් දැන් තැන්පත් වූ අයිතිවාසිකම් ඇති පිරිසක් වී සිටිනවා. ඉංග්‍රීසියෙන් කියනවා නම්, මේ දෙපාර්තමේන්තුවත් "වෙස්ටඩ් ඉන්ටරස්ට්" එකක් වෙලා. මේකෙන් ගැළවෙන්නට නම් අපේ ඒ ඒ ආර්ථික අංශ දියුණු වන ආකාරයට හා ඒවාට හුරු වන විධියට සමුපකාර ක්‍රමය ඒ ඒ අංශ මඟින් දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සිදු වන බව මගේ විශ්වාසයයි. කර්මාන්ත අංශයට වුවමනා කරන සමුපකාර ක්‍රමයක් තිබෙනවා නම් එය වෙළෙඳ ක්‍රමයට වුවමනා කරන සමුපකාර ක්‍රමයක් වන්නේ නැහැ. ඒ නිසා කර්මාන්ත පැත්තෙන් වුවමනා කරන සමුපකාර ක්‍රමය එයට හුරු වන ආකාරයට දියුණු කිරීම සඳහා එය කර්මාන්ත ඇමති අංශයට භාර දිය යුතුයි. ඒ වාගේම වෙළෙඳ අංශයට හුරු වන ආකාරයේ සමුපකාර සමිති දියුණු කිරීම ඒ ඇමති අංශයට භාර දිය යුතුයි. කෘෂිකර්මයට හුරු වන ආකාරයේ සමුපකාර සමිති දියුණු කිරීම ඒ ඇමති අංශයට භාර දිය යුතුයි. එක මහා දෙපාර්තමේන්තුවකින් සෑම පැත්තම පාලනය කිරීමට උත්සාහ නොකර ඔය විධියට මේවා කඩා බෙදා ඒ ඒ අංශවලට භාර දුන්නොත් විතරයි, ඒවා දියුණු කරන්නට පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට සමාවන්න. මා මේ තරම් දීර්ඝ කථාවක් කිරීමට බලාපොරොත්තු වුණේ නැහැ. දීර්ඝ කථාවක් කිරීමට සිදු වෙතැයි කල්පනා කෙළේත් නැහැ. කෙසේ වුණත් මා මේ ඉදිරිපත් කෙළේ මා විසින් කල්පනාවට ගන්නා ලද වැදගත් යැයි සිතන කරුණු වගයක්. මේ අවස්ථාවේදී ආණ්ඩුවට පහර ගසන්නට මා උත්සාහ කෙළේ නැහැ. නිසි තැන්වලදී එවැනි පහර ගැසීම් කරන්නට පුළුවනි. එහෙත් මේ සමුපකාර ප්‍රශ්නය මෙතැන මතු වී තිබෙන ආකාරය අනුව මට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට වුවමනා කරන්නේ මේකයි: මේ නීතිවලින් හෝ මොන නීතිවලින් හෝ බලතල පවරාගෙන ඒ බලතල පාවිච්චි කර මේ සමුපකාර ව්‍යාපාරය ශුද්ධ කරන්න. අවශ්‍ය වී තිබෙන්නේ ඒකමයි. මා නීතිය ගැනම කථා නොකළ බව තමුන්නාන්සේට පෙනෙන්නට ඇති. එහෙත් එයින් මතු වන දෙයින් සමුපකාර ක්‍රමය අලුත් වැඩියා කිරීමේත් අලුත් ප්‍රතිපත්ති උඩ එය සකස් කිරීමේත් අවශ්‍යතාව මතක් කරමින් මා ඒ ගැන මගේ මතය ප්‍රකාශ කළා. ඒ ගැන කල්පනා කරන ලෙස ඉල්ලමින් මගේ කථාව කරනවා.

අ. භා. 6.40

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම සංශෝධන පනත ගැන විරුද්ධ පාර්ශ්වයේ සිටින අප සම්පූර්ණයෙන්ම විරුද්ධ බව ප්‍රකාශ කරමින් සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නටයි, මා අදහස් කරන්නේ. මේ ඇමතිතුමා බලයක් පවරා ගන්නට අදහස් කරන්නේ——

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

හදිසි නීති යටතේ ක්‍රියා කර තිබෙන සමිති සම්බන්ධයෙන් පමණයි, මේක බලපවත්වන්නේ. යොදා ඇති ක්‍රියා මාර්ග එක පාරටම කඩා බිඳ දාන්න බෑ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මා දන්නවා. එහෙත් ඒ ගැන ක්‍රියා කරන්නට සමුපකාර කොමසාරිස්තුමාට සම්පූර්ණ බලතල තිබෙනවා. ඇමතිතුමා ඒ බලතල පවරා ගැනීමයි, මේ පනතෙන් අදහස් කරන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගරු සභාපතිතුමනි, කොමසාරිස්වරයාට තිබුණු බලතලත් හදිසි නීතිය යටතේ ඇමතිවරයා පවරා ගත්තා. එසේ පවරා ගත් බලතල පාවිච්චි කරමින් යම්කිසි වැඩ කොටසක් කළා. දැන් හදිසි නීතිය නැති කරන්න යන විට කොමසාරිස්වරයාට ඒ වගකීම භාර දෙන්න පුළුවන්කමක් නැහැ. හදිසි නීතිය ඉවත් කරන විටම ඒ සියල්ල අහෝසි වී යන නිසා බිඳ වැටෙනවා. මණ්ඩලය පත් කළ දා සිට අවුරුදු හතරක් තමයි වැඩිම කාල සීමාව. ඊට පෙර සාමාන්‍ය පාලනයට භාර දෙන්න ඇමතිවරයා කල්පනා කරනවානම් එය කරන්න පුළුවනි. එම නිසා හදිසි නීති යටතේ ඇමතිවරයාට පැවරුණු බලතල අනුව යම් ක්‍රියාවක් කළා නම් එය ආරක්ෂා කිරීමේ අදහසිනුයි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ. එක්තරා කාල සීමාවකදී එය අහෝසි වෙනවා; ඉන් එහාට ගෙන යාමක් මෙහි ඇත්තේ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගරු සභාපතිතුමනි, සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් කථා කරන විට ලෝකයේ සෑම රටකම පාහේ මෙමව්‍යාපාරය ඉතා මත්ම දියුණු තත්ත්වයකට පත් ව තිබෙන බව කියන්න කැමතියි. මගේ මතකයේ හැටියට 1912 දී පටන් ගත් මෙම ව්‍යාපාරය ක්‍රමානුකූලව දියුණු වේ ගෙන ආවා. එසේ දියුණු වේගෙන ඇවිත් 1942 දී තමයි, විශේෂයෙන්ම අපේ රටට ජපනුන් බෝම්බ දැමූ කාලයේදී තමයි, සමුපකාර කඩ සමිති මේ රටේ පටන් ගත්තේ. මුලින්ම මේ රටේ ඇති වුණු සමුපකාර සමිතිවලින් කරන ලැබුවේ මහජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමයි. ඒ අවදියේ සිටි නිලධාරීන් සංඛ්‍යාව වැඩි වුණේ නැහැ. මේ අන්දමට කටයුතු කර ගෙන ඇවිත් 1948 වන විට සෑහෙන දියුණුවක් ලබා තිබුණා. කෙසේ වුණත් 1956 පසුව—වර්තමාන ගරු කර්මාන්ත ඇමතිතුමා ආහාර ඇමතිවරයා වශයෙන් පත්ව සිටි කාලයේ—තමයි විවිධ සේවා සමුපකාර සමිති සංගම් ක්‍රමය පිහිටුවනු ලැබුවේ. ඒ අන්දමට සමුපකාර ව්‍යාපාරය පුළුල් කිරීමෙන් නියම සමුපකාර ප්‍රතිපත්ති උඩ සමුපකාර කඩ සමිතිත් ක්‍රියා කරන්න පටන් ගත්තා. මේ අන්දමට දියුණුවේ ගෙන ආ සමුපකාර ව්‍යාපාරයට, මට පෙනී යන අන්දමට 1965 මාර්තු 24 වන දාට පසුව නරක දසාවක් ලබා ඇති බව මතක් කරන්න සිදු වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම පනතින් අදහස් කළ දේ ගරු ඇමතිතුමා තෝරා දුන්නා. ඇමතිතුමාගේ බලතල පාවිච්චි කරමින් යම්කිසි සමුපකාර සමිති සංගමයක් අහෝසි කළා නම් හදිසි නීතිය ඉවත් කළාට පසුව ආපසු කලින් තිබුණු තත්ත්වයට පත් වේද කියා——

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඒක නිකම්ම බිඳ වැටෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කෙසේ හෝ වේවා, මේ විධියේ නොයෙකුත් පනත් සම්මත කර ගැනීමෙන්, ඇමතිතුමා නොයෙකුත් බලතල ලබා ගැනීමෙන් සමුපකාර ව්‍යාපාරය කවදාවත් දියුණු කරන්න පුළුවන් වේයයි අපට කල්පනා කරන්න බැහැ. ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරයෙන් මේ රටට ඉතා විශාල සේවයක් සිදු වුණු බව, සිදු කරන්න පුළුවන් බව අප කව්රුත් පිළිගන්නවා. නමුත් දේශපාලන බලපෑම් නිසා බලාපොරොත්තු වුණු සේවය එමගින් ඉටු වෙන්නේ නැහැ, ඉටු කරන්න අවකාශයක් සැලසෙන්නෙත් නැහැ. මෙබඳු පනත්වලින් මා කලින් කී අන්දමට සමුපකාර ව්‍යාපාරයට විශාල ලෙස පහර වදින බව රහසක් නොවෙයි. එම නිසා, මෙම පනතට අප තරයේම විරුද්ධ බව ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා මට පසුව කථා කරන්න බලාපොරොත්තු වෙන් සිටින නිසා මගේ කථාව මෙයට වඩා දීර්ඝ කරන්න අදහස් කරන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.45

**ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)**
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புல்ல)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු සභාපතිතුමනි, පසුගිය දවසේ රැස් වූ අවස්ථාවේදී සමූපකාර කටයුතු පිළිබඳව පළමුවෙන්ම කථා කරන්න අපේ සංවිධායකතුමා මට අවස්ථාව දෙන බව සඳහන් කළා. එහෙත් මාතර ගරු මන්ත්‍රීතුමාත් (තුඩාවේ මයා.) තවත් මන්ත්‍රීවරුනුත් කථා කළ අතර, මා තව තවත් පස්සට තල්ලු වුණා. [බාධාකිරීම්] අද කලින්ම මට කථා කරන්නට ලැබේ යයි සිතූ නමුත් අවස්ථාවක් ලැබුණේ නැහැ. එම නිසා කථා නොකර ඉන්නට අදහස් කොට, සංවිධායකතුමා සමග තරහ වී සිටින විට තමයි, මටත් කථා කරන්නට පුළුවන් බව සංවිධායකතුමා කීවේ.

දැන් කරගෙන යන්නේ නියම විධියේ සමූපකාර ව්‍යාපාරයක් නොවෙයි. අද එය කෙරෙන්නේ, නියම සමූපකාරයට වෙනස් අන්දමකටයි. එය ඇමතිතුමාගේවත්, වෙන කාගේවත් වරදක් නිසා වුණු දෙයක් නොවෙයි. අප හැඩගැසී තිබෙන්නේ ඒ විධියටයි. සමූපකාරය නම් තමන් විසින්ම තමන්ගේ වුවමනාවන් සහයෝගයෙන් ඉටු කර ගැනීමේ, තමන්ම තමන්ගේ කටයුතු පාලනය කර ගැනීමේ ක්‍රමයක්. මෙසේ නීති පනවමින්, පනත් සම්මත කරමින් කරගෙන යන ව්‍යාපාරය, නියම සමූපකාර ව්‍යාපාරයක් නොවෙයි. අපේ මුතුන්මිත්තන් අන්‍යෝන්‍ය සහයෝගයෙන්, අන්‍යෝන්‍ය සම්බන්ධතාවකින් යුතුව වැඩ කටයුතු කරගත් ආකාරයට කටයුතු කර ගැනීම පමණයි, නියම සමූපකාරය හැටියට සලකන්නට පුළුවන්. යම් යම් නිලධාරීන්ට ඇමතිතුමා විසින් බලතල පවරා කටයුතු කරගෙන යා යුත්තේ, සමූපකාර ක්‍රමයට පුහුණු වන තුරු පමණයි.

කුඩා කාලයේ සිටම මා සමූපකාරය ගැන බොහොම උනන්දුවෙන් වැඩ කළා. 1941 ට කලින් විවිධ සේවා සමූපකාර ව්‍යාපාර ලංකාවේ තිබුණේ නැහැ. කලින්ම පටන් ගත්තේ සමූපකාර ණය දෙන සමිතියි. රුපියල් 25, 30, 50, 60, 100 වශයෙනුයි, ඒ කාලයේ ඒ සමූපකාර ණය දෙන සමිතිවලින් ණය දුන්නෙ. ඒ කාලයේ හැම ප්‍රදේශයකම වාගේ ඒ සමූපකාර ණය දෙන සමිති තිබුණා. එසේම ඒ සමූපකාර ණය දෙන සමිතිවල වැඩ කටයුතු හරියාකාරව කෙරුණා. කොටින් කියනවා නම්, ඒ සමිතිවල වැඩ කටයුතු අවංක විධියට සිදු වුණා. ඒ කාලයේ ඒ සමිතිවල වැඩ කළේ එවැනි අවංක පිරිසක්.

1941 යුද්ධ කාලයේදී, හාල් සේරුව බැගින් දිය යුතුව තිබියදී මහනුවර එක්තරා වෙළඳ සමාගමක් හාල් දුන්නේ සේරු 1/2 බැගිනුයි. ඒ කාලයේ අප එකතු වී සාමාජික මුදල් වශයෙන් රුපියල බැගින් ගෙවා, සමූපකාර සමිතියක් ඇති කොට හාල් සේරුව බැගින් දුන්නා. ඒ කාලයේම හාල් පොත් ක්‍රමය ඇති වීමත්, සමූපකාර සමිති මගින් හාල් බෙදා හැරීම නිසාත්, සමූපකාර ව්‍යාපාරය පවත්වාගෙන යාමට හොඳ පසුබිමක් ඇති වුණා.

එහෙත් දැන් හාල් නොමිලයේ දෙන නිසා සමූපකාර ව්‍යාපාරයට පහරක් වැදී තිබෙනවා. හාල් මුදලට විකුණන දවස්වල, හාල් ගෙන යෑමේ කුලිය වශයෙන් සමූපකාර සමිතිවලට මුදලක් ලැබුණු අතර, ඉතුරු වන වැඩිපුර හාල් නිසාත් ලාභයක් ලැබුණා. ඒ හේතුවෙන් සමූපකාර සමිති පවත්වාගෙන යෑමට රුකුලක් ලැබුණා.

අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කී පරිදි, දැන් සමූපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නැති වන තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ මන්දයත්, පාරිභෝගිකයන්ගෙන් සමන්විත වුණු මණ්ඩල මගින් නොවෙයි දැන් සමූපකාර සමිති පාලනය වන්නේ. දැන් සමූපකාරය තිබෙන්නේ නිලධාරි බලය උඩයි. සමාජවාදී ආණ්ඩුවක් බලාපොරොත්තු වන විට ඒ සමාජවාදයේ නාමයෙන් නිලධාරි ආණ්ඩුවක් ඇති වෙනවා වාගේ, නැතහොත් ඒකාධිපති ආණ්ඩුවක් ඇති වෙනවා වාගේ ක්‍රමයට තමයි අද සමූපකාරය ඇති වී තිබෙන්නේ. ඒ බව ඉතා පැහැදිලි අන්දමින් පෙනී යනවා. එය ගරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. නීති රීති වැඩි කිරීමෙන් සමූපකාරය දියුණු වන බවක් හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර ව්‍යාපාරයේ අදහස ඉටු වන බවක් හෝ අපට පිළිගන්නට බැහැ. සමුපකාරය පිළිබඳව නීති රීති, නිලධාරීන් සහ දෙපාර්තමේන්තුවක් නැති වෙනවා නම් තමයි අපට හරියාකාර සමුපකාර සමිති බිහි වන බව පිළිගත හැකි වන්නේ. ගරු කර්මාන්ත ඇමති තුමා ආහාර ඇමතිවරයා වශයෙන් හිටි කාලයේදී සමුපකාර ව්‍යාපාරය මගින් රටට විශාල සේවයක් කිරීම පිණිස හොඳ කල්පනාවක් හා තේරුමක් ඇතුව වැඩ කළ කාලයේදි එහි යම්කිසි දියුණුවක් ඇති වන්නට මෙන් ආවා. එහෙත් ඒ බර කුමන අන්දමකින් හෝ දරා ගන්නට ඒ සමිතිවලට පුළුවන්කමක් නොතිබුණු බව අප පිළිගන්නට ඕනෑ. මෙම අවස්ථාවේදී විශෙෂයෙන්ම ගරු ඇමතිතුමාට මතක් කළයුතු කාරණයක් තිබෙනවා. සමුපකාර ප්‍රතිපත්ති දියුණු කිරීම සඳහා දෙපාර්ත මේන්තුවක් තිබියදීත් ඒ සඳහා වෙන් වුණු නිලධාරීන් සිටියදීත් ඒවා විනාශ වන්නේ නම් ඊට හේතු මොනවාදැයි මීට වඩා හොඳින් විමසා බැලිය යුතුයි.

එක සංගමයක් තිබෙන විට ඒ සංගමයේ කටයුතු සොයා බැලීමට පරීක්ෂකවරුන් දෙදෙනෙක් වාඩි කරවනවා. එහෙත් අවුරුද්දක් පමණ යන විට ගණන් ලැයිස්තු අනුව බැලුවාම රුපියල් ලක්ෂ ගණනක් පාඩු බව පෙනෙනවා. තමුන්නාන්සේ සමුපකාර පරීක්ෂකවරුන් තිදෙනකු ලවා එක කඩේක ගණන් හදවා බැලුවහොත් ඒ තිදෙනා තුන් ආකාරයකට ගණන් ඉදිරිපත් කරන බව පෙනී යාවි. අපි හයයි හතරයි එකතු කළාම උත්තරය දහයයි. අටයි පහයි එකතු කළාම උත්තරය දහ තුනයි. එහෙත් සමුපකාර පරීක්ෂකවරුන් තිදෙනකු ලවා එක සංගමයක හෝ එක කඩයක හෝ පොඩි ගණනක්වත් එකතු කර බැලුවොත් ඒ තිදෙනා තුන් ආකාර යකට වාර්තා ඉදිරිපත් කරනවා ඇති. එක් කෙනෙක් 7,000 යි කියන තැනට තව කෙනෙක් 11,000 යි කියාවි; තව කෙනෙක් 18,000 යි කියාවි. එසේ හෙයින් සම දැනුමක් හෝ සම ගණන් ක්‍රමයක් හෝ ඒ උදවියට නොමැති බව මෙහිලා සඳහන් කළ යුතුයි. සමුපකාර දෙපාර්ත මේන්තුවේ දක්ෂතාවය හොඳටම මදි බව මෙයින් පෙනී යනවා. කැල්වට්. කැම්බෙල් වැනි උදවිය සිටි යුගය අපට මතකයි.

සමුපකාර ව්‍යාපාරය "අ" යනු "ආ" යනු කියන අවධියේදීයි ඒ උදවිය වැඩ කර ගෙන ආවේ. දැන් සමුපකාරයෙන් ආණ්ඩු වක් වුවත් කරන්නට පුළුවන්ය කියන හැඟීම සහ ප්‍රකාශය අපේ රටේ පවතිනවා. එසේ වුවාට මොකද ක්‍රියාවෙන් නම් කිසි වක් නැහැ. අප පහළ යනවා මිස ඉහළ යන පිළිවෙළක් ඇත්තේ නැහැ. සමුප කාරය අල්ලා ගන්නා උදවිය නිතරම පාගේ නිලතල ලබා ගැනීමේදී එහෙම කල්පනා කරන්නේ එමගින් තමන්ට කුමන අන්දමේ ප්‍රයෝජනයක් සැළසේවි ද කියන එකයි. සමුපකාරය වැනි ශ්‍රේෂ්ඨ දෙයක් එවැනි උදවිය අතට පත් කිරීම ඉතාම වැරදි සහගත බව ඉතා ආදරයෙන් මතක් කරන්නට කැමතියි. මෙම ශ්‍රේෂ්ඨ ව්‍යාපාරය හරියාකාර දියුණු කරන්නට නම් ඒ සඳහා ආදරයක් දක්වන පිරිසක් අතට එම කටයුතු පත් කරන්නට ඕනෑ.

අපේ සමුපකාර සංගම් ගැන කල්පනා කර බලන විට කිවයුතු කාරණයක් තිබෙ නවා. අපි බොහොම මහන්සියෙන් ඇති කළ මහනුවර සමුපකාර සමිතියක් පිළි බඳ ව මෙම අවස්ථාවේදී සිහිපත් වෙනවා. බොහොම මහන්සියෙන් අපි එහි වැඩ කට යුතු කර ගෙන ගියා. ඉතා දිළිඳු උදවිය පවා ඊට රුපියල බැගින් ගෙව්වා. එදා රුපියල් බැගින් ගෙවා අවුරුදු 25 ක් තිස්සේ ඒ ව්‍යාපාරය ගෙන ගිය උදවිය දැන් සම්පූර්ණ යෙන් අයින් වී තිබෙනවා. තුන් හතර දෙනෙකුට තමයි, දැන් එහි බලය ලැබී තිබෙන්නේ. වේයන් හදන හුඹස්වලට නයින් රිංගනවා වගේ වැඩක් අද සමුප කාර ව්‍යාපාරයටත් වෙලා තියෙන්නේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මට මිනිත්තු 2 ක් දුන්නොත් අද මේක ඉවර කරන්නට පුළුවන්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මට හුඟක් කරුණු ඉදිරිපත් කරන්නට තියෙනවා. එහෙත් ගරු ඇමතිතුමාගේ ඉල්ලීම අනුව ඒ කරුණු ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. හොර මැරවලට ඉඩ නොදී නියම සමුපකාර ප්‍රති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර සමිති (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත —දෙවන වර කියවීම

[ජී. බී. තෙන්නකෝන් මයා.]

පත්ති අනුව ලංකාවේ සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යනවා නම් එයට සම්පූර්ණ සහයෝගය දීමට අප සූදානම් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.55

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාද යේදී සමුපකාර ප්‍රතිපත්ති සම්බන්දවත්, නීතිය සම්බන්ධවත් ගරු මන්ත්‍රීවරුන් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. හදිසි නීති යට තේ ඇමතිවරයා විසින් පවරා ගන්නා ලද බලතල මොන මොන හේතු නිසා පවරා ගන්නට සිදු වුණාද යන්න මේ කෙටුම්පත් පනත ඉදිරිපත් කරන අවස්ථාවේදී මා ප්‍රකාශ කළා. හදිසි තත්ත්වය අවසාන කරන්නට අගමැතිතුමාත්, රජයත් කල්පනා කර සිටින නිසා එසේ කරන්නට පෙර හදිසි නීති යටතේ කළ ක්‍රියාවන් සම්බන්ධව යම් යම් පියවරවල් ගත යුතුව තිබෙනවා. හදිසි නීතිය යටතේ යම් යම් සමුපකාර සමිති සම්බන්ධයෙන් අප ක්‍රියා කර තිබෙනවා. මේ නීතියෙන් අප බලාපොරොත්තු වන් නේ ඒ සමිතිවල පාලනය ගෙන යාමට කටයුතු කිරීම පමණයි. හදිසි නීති නැති වුණාම සාමාන්‍ය සමුපකාර නීති යටතට මෙය එනවා. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද අන්දමේ කරුණු සියල් ලක්ම පරීක්ෂා කර බැලීමට 5 දෙනකු ගෙන් යුත් කොමිෂන් සභාවක් පත් කිරී මට තීරණය කර අවසානයි. ඒ කොමිෂන් සභාවේ සේවය කරන අය පවා නම් කර අවසානයි. දින කීපයකින් එය ප්‍රසිද්ධියට පත් වෙනවා ඇති. දැනට අනුගමනය කරන ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සඳහා වුණත් ඒ කොමිෂන් සභාවට සාක්ෂි ඉදිරිපත් කිරීමට පුළුවන්.

**ප්‍රශ්නය විමසන ලදී.**

**කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

*வினா விடுக்கப்பெற்றது.*

*குரல்களின்படி "ஆம்" என்றவர்க்கு வெற்றி யென குழு உப அக்கிராசனர் அவர்களால் பிரகடனப் படுத்தப்பட்டது.*

*Question put.*

MR. DEPUTY CHAIRMAN OF COMMITTEES, *having collected the Voices, declared that the "*AYES*" had it.*

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa—Colombo South)

Divide!

**මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 22; විරුද්ධව 3; යනුවෙන්— බෙදුණේ ය.**

*சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது சார்பாக 22 ; எதிராக 3.*

*The House divided (under Standing Order No. 48) ; Ayes 22 ; Noes 3.*

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කිය වන ලදී.**

*அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப் பிடப்பெற்றது.*

*Bill accordingly read a Second time.*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය:**

**"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු එම්. ඩී. බණ්ඩා]**

*பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது;*

*" மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக " [கௌரவ எம். டீ. பண்டா]*

*Resolved ;*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. M. D. Banda.*]

**පනත් කෙටුම්පත, අංක 57 දරන ස්ථාවර නියෝගය යටතේ, 1968 ඔක්තෝබර් 25 වන සිකුරාදා පවත්වන පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පවරන ලදී.**

*மசோதா, நிலையற்கட்டளை இல. 57 இன் கீழ் 1968 ஒக்ரோபர் 25, வெள்ளிக்கிழமை முழுச் சபைக் குழு வுக்குச் சாட்டப்பட்டது.*

*Bill committed to a Committee of the Whole House under Standing Order No. 57 for Friday, 25th October 1968.*

## කල් තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

**"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]**

*" சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக " [கௌரவ டீ. பீ. ஆர். குணவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.*

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. D. P. R. Gunawardena.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ප්‍රශ්න දෙකක් ගැන අධ්‍යාපන ඇමතිතුමාට කල් දී තිබෙනවා. පළමුවන ප්‍රශ්නය මේකයි: පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට දෙන ආහාර ක්‍රම ක්‍රමයෙන් නරක අතට හැරීගෙන යන බව අපට පෙනෙනවා. මේ ප්‍රශ්නය කෙරෙහි වග කිව යුත්තන්ගේ සිත් යොමු කිරීම පිණිස ළඟදී ශිෂ්‍යයන් ඇවැන්ත පෙළපාළියක් පැවැත්වූ බව අප කවුරුත් දන්නා කාරණයක්. මේ ආහාර ප්‍රශ්නය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවරක් ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාත් මේ ආණ්ඩුවත් මේ රටේ ශිෂ්‍යයින් ආහාර සුලභ කිරීමේ ව්‍යාපාර වලට සම්බන්ධ කරගෙන යන බව අපට පෙනෙනවා. එසේ නම් පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ගේ ආහාර ප්‍රශ්නය හරියාකාරව විසඳීම විශේෂ යුතුකමක්. ඒ අඩුපාඩුකම් ගැන පියවරක් ගන්නා මෙන් මා නැවතත් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අනිත් ප්‍රශ්නය මේකයි: පසුගිය සැප්තැම්බර් 6 වැනිදා අධ්‍යාපන ඇමතිතුමා ගම්පහ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂ ශාඛාවේ සාකච්ඡාවක් පවත්වා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධානයක් ගැනයි ඒ සාකච්ඡාව පවත්වා තිබෙන්නෙ. ඒ සාකච්ඡාවට පසුව අධ්‍යාපන ඇමතිතුමා සමග ඒ ප්‍රදේශවාසීන් හත් දෙනෙකු දහවල් කෑමට ගම්පහ තානායමට ගිහින් තිබෙනවා. දහවල් කෑමට තානායමට ගියාම ඒ හත් දෙනා අට දෙනා වී තිබෙනවා. පසුව හත් දෙනා අට දෙනා වූයේ කෙසේද කියා බැලුවාම ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකයකු හැටියට සිටින ආණ්ඩුවේ පාඨශාලාවක ගුරුවරයකුත් පැමිණ සිටි බව පෙනුනා. ඒ ගුරුවරයා ගැන අධ්‍යාපන ඇමතිතුමා කුමන පියවරක් ගන්නවාද? මා විශේෂයෙන්ම ඒ ප්‍රශ්නය අසන්නේ මේ නිසයි. ඒ ප්‍රදේශයේ ගුරුවරුන් රාශියක්—වාමාංශික අදහස් දරනවාය කියා ගුරුවරුන් රාශියක්—සේවයෙන් ඉවත් කර තිබෙනවා. වීරසිංහ, ගනේපොල, ජයරත්න, වික්‍රමාරච්චි, වැලැන්ෂියස් පෙරේරා, කරුණානායක ආදී ගුරු මහත්වරුන් ඒ ආකාරයට වාමාංශික අදහස් දරනවාය කියා සේවයෙන් ඉවත් කර තිබෙනවා. එම නිසා, විශේෂයෙන් අප දැනගන්නට සතුටුයි, ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කුමන ප්‍රතිපත්තියක් අනුගමනය කරනවාද කියා. විශේෂයෙන්ම මා දැන් ඉදිරිපත් කළ ප්‍රශ්නය පිළිබඳව ගරු ඇමතිතුමා කුමන ක්‍රියා මාර්ගයක් ගන්නවාද යන්න මා දැනගන්නට සතුටුයි.

අ. භා. 7.05

**වී. නවරත්නම් මයා.** (කයිට්ස්)
*(திரு. வீ. நவரத்னம்—ஊர்காவற்றுறை)*
(Mr. V. Navaratnam—Kayts)

I wish to raise a matter of some importance and urgency pertaining to the Ministry of Education and Cultural Affairs. I believe the Hon. Minister is aware of the problem of certain new students who have already been admitted to universities and who have now been asked to go away on the ground that one of the subjects that they had offered at the G. C. E. (Advanced Level) Examination was either Hinduism or Islam. I am sure the Hon. Minister would treat this as a human problem because somewhere some blunder has taken place. There is no doubt about that.

Immediately on the publication of the results of the G. C. E. (Advanced Level) Examination held in April last, the Central Agency for University Admissions, which is an arm of the National Council of Higher Education, had informed various students, individually I believe, that they were eligible for admission to a university and therefore they may make their applications. In pursuance of such notification from the National Council of Higher Education these students made their applications. These applications were accepted and they were admitted to universities. But on second thoughts, probably on some scrutiny, some of them have been told that because one of the four subjects that they have passed at Advanced Level happened to be Hinduism or Islam they cannot enter the universities.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. නවරත්නම් මයා.]

I hope the Hon. Minister will give thought to the aspect that I propose to place before him, namely, that this is an action which is really illegal. The National Council of Higher Education is now trying to take cover behind a rule that the former University of Ceylon had probably laid down. The University of Ceylon might have had a rule that Hinduism or Islam was not a subject that could be recognized for admission purposes to the universities.

But the University of Ceylon is now defunct. Today we have the University of Ceylon, Colombo, and the University of Ceylon, Peradeniya. Whatever may be the position taken up by the University of Ceylon, Peradeniya—I am not fully aware of the position taken up by them—as far as the University of Ceylon, Colombo, is concerned, certainly they have not laid down that Hinduism or Islam would not be recognized for admission purposes.

In fact I have information that the instructions sent out to the various heads of schools by the Central Agency for University Admissions have not excluded Hinduism or Islam from the list of subjects candidates could qualify in for admission to the universities. It may be a blunder. It may be a mistake. But now that the students have been selected and admitted into the university, and have in fact put in a few lectures, to turn them away at this late stage would be a very, very unfortunate position.

I hope the Hon. Minister will take into consideration the hardships, the disappointment and the sense of frustration that would creep into these students. They entered the university with high hope. They had been qualified in every way as far as they were concerned. To turn them away now is a very very painful step that the university is taking. It may be a blunder somewhere, but I submit the Hon. Minister should not penalize the students. In fact I shall not be surprised if some students themselves take this matter to court in the form of some writ procedure and ask for a ruling from court that it is unlawful for the National Council of Higher Education to turn them away at that stage. I shall not be surprised if some students even take the short cut to eternity with a dose of follidol. That is the feeling that is prevailing among these students.

අ. භා. 7.11

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாச்சார விவகார அமைச்சர்)
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

You are giving them ideas.

වි. නවරත්නම් මයා.
(திரு. வீ. நவரத்னம்)
(Mr. V. Navaratnam)

It is not so. I have heard many people say that.

Day in and day out we read in the press of cases of suicide as a result of this type of disappointment.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

For other reasons also.

වි. නවරත්නම් මයා.
(திரு. வீ. நவரத்னம்)
(Mr. V. Navaratnam)

That may be so. But my sincere request to the Hon. Minister is that he must view this as a human problem and do something for these students now that they have been admitted to the university, and he can impose these qualifications hereafter.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

So far I have not received any report regarding the matter referred to just now by the hon. Member for Kayts (Mr. V. Navaratnam). I shall go into it and ascertain the true facts.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I do not know whether, by the admission of ineligible students, they have shut out eligible students. They will have to answer for it if they have done so. I shall inquire into the matter.

ගම්පහ මන්ත්‍රීතුමාගේ (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ප්‍රශ්නය සම්බන්ධයෙන් කියන්නට තිබෙන්නේ මෙපමණයි. එක්සත් ජාතික පක්ෂය සංවිධානය කිරීමේ සාකච්ඡාවක් පැවැත්වීමෙන් පසුව තානායමට දවල් කෑම ගන්ට ගිය වෙලාවේ කීප දෙනකු හිටියා. "මේ කවුද ; මේ කවුද ?" කියා මා විමසුවේ නැහැ. වාමාංශික වැඩ කරන ගුරුවරුන් කීප දෙනකුගේ නම් එතුමා කිව්වා. මම ඒවා හිතට ගත්තා. මම ඒගොල්ලන්ගෙන් අහල බලනවා ඒගොල්ල වාමාංශික වැඩ කරනවාද කියා. එහෙම කරනවා නම් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නවා.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranaike)
ඒගොල්ල අස් කරල.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එහෙනම් ඉතින් ප්‍රශ්නයක් නැහැ. කෑමට කවුරු හිටියද කියා මා විමසුවේ නැහැ. මොකද, කෑම කන වෙලාවේ එහෙම අහන එක අපේ සංස්කෘතියේ හැටියට ශිලාචාර දෙයක් නොවෙයි. මම ගෙව්වෙත් නැහැ ; කවුරු ගෙව්වද දන්නෙත් නැහැ. කවුරුවත් කාටවත් කෑම දුන්නට මට ඔක අහන්ට විධියකුත් නැහැ. තත්ත්වය ඒකයි.

විශ්ව විද්‍යාලයේ කෑමවල අඩුපාඩු ගැන මට තවම කවුරුවත් කිව්වේ නැහැ. කිව්වොත් මම ඒ ගැන සොයා බලනවා. ඒ අඩුපාඩු මොනවාදැයි මන්ත්‍රීතුමා මට ලියා දුන්නොත් මම ඒවා ගැන විභාග කර බලනවා. පුවෘත්ති පත්‍රවල තිබෙන වාර්තාවලින් මට මේවා විභාග කර බලන්න බැහැනෙ. මන්ත්‍රීතුමා කිව්වොත් "මෙන්න මේ විධියේ අඩුපාඩු කෑමවල තිබෙනවා. ඒ ඒ අය හැසුරුණේ මෙන්න මේ විධියටයි" කියා, මම සොයා බලන්නම්.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.15 ට 1968 ඔක්තෝබර් 25 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி சபை, பி. ப. 7.15 க்கு, 1968 ஒக்ரோபர் 25, வெள்ளிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்தி வைக்கப்பெற்றது.*

***Adjourned accordingly at 7.15 P.M. until 10 A.M. on Friday, 25th October 1968.***

6——එච 18096 (68/10)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පරිශිෂ්ටය
## அநுபந்தம்
## APPENDIX

අද දින අංක 1 දරණ ප්‍රශ්නයට පිළිතුරත් සමග සභාගත කරන ලද ප්‍රකාශන
வினா இல. 1 க்கான விடையுடன் சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கைகள்
*Statements tabled with Answer to Question No. 1*

### 1957 සිට නොයෙකුත් රටවලින් ගෙන්වන ලද සහල් ප්‍රමාණයද එහි මිළ හා වාහන ගාස්තු ඇතුළු වටිනාකම දක්වෙන ප්‍රකාශනය

### සහල්

| | ගෙන්වන ලද ප්‍රමාණය ටොන් | වැයවූ මුළු මුදල රුපියල් |
|---|---|---|
| **1957** | | |
| චීන-ලංකා ගිවිසුම යටතේ ගත් ප්‍රමාණය ... ... ... | 3,11,664 | |
| බුරුමයෙන් ගෙන්වන ලද ප්‍රමාණය හැර චීන-ලංකා ගිවිසුම යටතේ වියට්නාමයෙන් ගෙන්වන ප්‍රමාණය ඇතුළුව ... ... ... | 2,00,896 | |
| තායිලන්තය ... ... ... ... | 43,772 | |
| එකතුව ... | 5,56,332 | ... 25,53,90,561 |
| **1958** | | |
| බුරුමය ... ... ... ... ... | 1,86,612 | |
| චීන ... ... ... ... ... | 2,86,490 | |
| වියට්නාම් ... ... ... ... ... | 13,813 | |
| ඊජිප්තුව ... ... ... ... ... | 28,428 | |
| නාභා ... ... ... ... ... | 9,756 | |
| ස්පාඤ්ඤ ... ... ... ... | 10,093 | |
| අමෙරිකා එක්සත් ජනපදය ... ... ... | 37,398 | |
| එකතුව ... | 5,72,590 | ... 23,78,37,144 |
| **1959** | | |
| බුරුමය ... ... ... .. ... | 2,17,288 | |
| චීන ... ... ... ... ... | 2,16,698 | |
| සයිගොන් ... ... ... ... | 17,279 | |
| වියට්නාම් උතුර ... ... ... ... | 960 | |
| අමෙරිකාව ... ... ... ... | 56,324 | |
| කරච්චි ... ... ... ... ... | 9,981 | |
| එකතුව ... | 5,18,530 | ... 28,29,65,964 |
| **1960** | | |
| බුරුමය ... ... ... ... ... | 2,26,044 | |
| චීන ... ... ... ... ... | 2,46,387 | |
| වියට්නාම් ... ... ... ... | 41,729 | |
| අමෙරිකාව ... ... ... ... | 9,767 | |
| තායිලන්තය ... ... ... ... | 8,246 | |
| එකතුව ... | 5,32,173 | .. 24,22,95,160 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිශිෂ්ටය

පරිශිෂ්ටය

| | ගෙන්වන ලද ප්‍රමාණය ටොන් | වැයවූ මුළු මුදල රුපියල් |
|---|---|---|
| **1961** | | |
| *බුරුමය ... ... ... ... ... | 4,10,331 | |
| වියට්නාමය ... ... ... ... | 16,054 | |
| තායිලන්තය ... ... ... ... | 61,319 | |
| චීන ... ... ... ... ... | 8,856 | |
| එකතුව ... | 4,96,560 | ... 21,73,27,358 |
| **1962** | | |
| චීන ... ... ... ... ... | 89,750 | |
| චීන ගිවිසුම යටතේ බුරුමයෙන් ගෙන්වාගත් ප්‍රමාණය ඇතුළුව ... | 3,46,350 | |
| ඊජිප්තුව ... ... ... ... ... | 3,586 | |
| පකිස්තාන් ... ... ... ... | 19,994 | |
| තායිලන්තය ... ... ... ... | 45,366 | |
| සයිගොන් ... ... ... ... | 9,929 | |
| එකතුව ... | 5,14,975 | ... 24,82,390,61 |
| **1963** | | |
| චීන ගිවිසුම යටතේ බුරුමයෙන් ගෙන්වන ලද ප්‍රමාණය ඇතුළුව ... | 2,87,361 | |
| චීන ... ... ... ... ... | 1,89,047 | |
| තායිලන්තය ... ... ... ... | 36,134 | |
| සයිගොන් ... ... ... ... | 20,502 | |
| ඊජිප්තුව ... ... ... ... ... | 17,658 | |
| එකතුව ... | 5,50,702 | ... 24,41,43,690 |
| **1964** | | |
| චීන ගිවිසුම යටතේ බුරුමයෙන් ගෙන්වන ලද ප්‍රමාණය ඇතුළුව ... | 2,76,335 | |
| චීන ... ... ... ... ... | 2,25,468 | |
| තායිලන්තය ... ... ... ... | 38,605 | |
| සයිගොන් ... ... ... ... | 6,397 | |
| එකතුව ... | 5,46,805 | ... 28,26,25,304 |
| **1965** | | |
| චීන ... ... ... ... ... | 1,67,756 | |
| බුරුමය ... ... ... ... ... | 2,43,239 | |
| වියට්නාම් ... ... ... ... | 7,390 | |
| තායිලන්තය ... ... ... ... | 1,67,196 | |
| මලයාව ... ... ... ... | 9,852 | |
| පකිස්තාන් ... ... ... ... | 36,510 | |
| කාම්බෝජය ... ... ... ... | 9,744 | |
| එකතුව ... | 6,41,687 | ... 34,17,86,360 |
| **1966** | | |
| බුරුමය ... ... ... ... ... | 1,88,160 | |
| චීන ... ... ... ... ... | 1,85,652 | |
| තායිලන්තය ... ... ... ... | 1,01,556 | |
| කාම්බෝජය ... ... ... ... | 9,208 | |
| එකතුව ... | 4,84,576 | ... 26,12,61,588 |

* චීන ගිවිසුම යටතේ බුරුමයෙන් ගෙන්වන ලද ප්‍රමාණය ඇතුළුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිශිෂ්ටය

පරිශිෂ්ටය

| 1967 | ගෙන්වන ලද ප්‍රමාණය ටොන් | වැයවූ මුළු මුදල රුපියල් |
|---|---|---|
| බුරුමය ... ... ... ... ... | 63,133 | |
| චීන ... ... ... ... ... | 2,12,203 | |
| තායිලන්තය ... ... ... ... | 99,410 | |
| එකතුව ... | 3,74,746 | 23,99,39,439 |

| 1968 (1968.6.30 දක්වා) | | |
|---|---|---|
| බුරුමය ... ... ... ... ... | 36,481 | |
| චීන ... ... ... ... ... | 1,07,159 | |
| තායිලන්තය ... ... ... ... | 64,386 | |
| කාම්බෝජය ... ... ... ... | 12,620 | |
| එකතුව ... | 2,20,646 | ... 22,33,74,688 |

1957 ஆம் ஆண்டு தொடக்கம் பல நாடுகளிலிருந்தும் இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவும், விலையும் கப்பற் கேள்வும் உட்பட்ட பெறுமதியையும் காட்டும் கூற்று

| 1957 | தொகை தொன் களில் | பெறுமதி விலை யும், கப்பற் கேள்வும் உட்பட ரூபா |
|---|---|---|
| பர்மா—சீன இலங்கை ஒப்பந்தத்தின் பேரில் கப்பலேற்றப்பட்ட தொகையும் உள்ளடங்கும் .. .. .. | 311,664 | |
| சீனு—சீன இலங்கை ஒப்பந்தத்தின் பேரில் பர்மாவிலிருந்து கப்பலேற்றப் பட்ட தொகை நீங்கலாகவும், சீன ஒப்பந்தத்தின் பேரில் வியட்நாமிலிருந்து கப்பலேற்றப்பட்ட தொகையை உள்ளடக்கியதும் .. .. | 200,896 | |
| தாய்லாந்து .. .. .. .. | 43,772 | |
| மொத்தம் .. | 556,332 | 2,55,390,561 |
| **1958** | | |
| பர்மா .. .. .. .. | 186,612 | |
| சீனு .. .. .. .. | 286,490 | |
| வியட்நாம் .. .. .. .. | 13,813 | |
| எகிப்து .. .. .. .. | 28,428 | |
| நாஹா .. .. .. .. | 9,756 | |
| ஸ்பெயின் .. .. .. .. | 10,093 | |
| ஐக்கிய அமெரிக்க இராச்சியங்கள் .. .. .. | 37,398 | |
| | 572,590 | 2,37,837,144 |
| **1959** | | |
| பர்மா .. .. .. .. | 217,288 | |
| சீனு .. .. .. .. | 216,698 | |
| அமெரிக்கா .. .. .. .. | 56,324 | |
| சைகோன் .. .. .. .. | 17,279 | |
| வட வியட்னும் .. .. .. .. | 960 | |
| கராச்சி .. .. .. .. | 9,981 | |
| | 518,530 | 2,82,965,964 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | தொகை தொன்களில் | பெறுமதி விலையும், கப்பற் கேள்வும் உட்பட ரூபா |
|---|---|---|
| **1960** | | |
| பர்மா | 226,044 | |
| சீனு | 246,387 | |
| வியட்நாம் | 41,729 | |
| அமெரிக்க | 9,767 | |
| தாய்லாந்து | 8,246 | |
| | 532,173 | 2,42,295,160 |
| **1961** | | |
| *பர்மா | 410,331 | |
| வியட்நாம் | 16,054 | |
| தாய்லாந்து | 61,319 | |
| சீனு | 8,856 | |
| | 496,560 | 2,17,327,358 |

*சீன ஒப்பந்தத்தின் கீழ் பர்மாவிலிருந்து கப்பலேற்றப்பட்ட தொகையையும் உள்ளடக்கும்

| | | |
|---|---|---|
| **1962** | | |
| சீனு | 89,750 | |
| பர்மா—சீன ஒப்பந்தத்தின் கீழ் கப்பலேற்றப்பட்ட தொகையையும் உள்ளடக்கும் | 346,350 | |
| எகிப்து | 3,586 | |
| பாகிஸ்தான் | 19,994 | |
| தாய்லாந்து | 45,366 | |
| சைகோன் | 9,929 | |
| | 514,975 | 2,48,239,016 |
| **1963** | | |
| பர்மா—சீன ஒப்பந்தத்தின் கீழ் கப்பலேற்றப்பட்ட தொகையும் உள்ளடக்கும் | 287,361 | |
| சீனு | 189,047 | |
| தாய்லந்து | 36,134 | |
| சைகோன் | 20,502 | |
| எகிப்து | 17,658 | |
| | 550,702 | 2,44,143,690 |
| **1964** | | |
| பர்மா—சீன ஒப்பந்தத்தின் கீழ் கப்பலேற்றப்பட்ட தொகையையும் உள்ளடக்கும் | 276,335 | |
| சீனு | 225,468 | |
| தாய்லந்து | 38,605 | |
| சைகோன் | 6,397 | |
| | 546,805 | 2,82,625,304 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිශිෂ්ටය

පරිශිෂ්ටය

| | தொகை தொன்களில் | பெறுமதி விலையும், கப்பற் கேள்வும் உட்பட ரூபா |
|---|---|---|
| **1965** | | |
| சீனு .. .. .. .. | 167,756 | |
| பர்மா .. .. .. .. | 243,239 | |
| வியட்நாம் .. .. .. .. | 7,390 | |
| தாய்லாந்து .. .. .. .. | 167,196 | |
| மலாயா .. .. .. .. | 9,852 | |
| பாகிஸ்தான் .. .. .. .. | 36,510 | |
| கம்போடியா .. .. .. .. | 9,744 | |
| | 641,687 | 3,41,786,360 |
| **1966** | | |
| பர்மா .. .. .. .. | 188,160 | |
| சீனு .. .. .. .. | 185,652 | |
| தாய்லந்து .. .. .. .. | 101,556 | |
| கம்போடியா .. .. .. .. | 9,208 | |
| | 484,576 | 26,12,61,588 |
| **1967** | | |
| பர்மா .. .. .. .. | 63,133 | |
| சீனு .. .. .. .. | 212,203 | |
| தாய்லந்து .. .. .. .. | 99,410 | |
| | 374,746 | 2,39,939,439 |
| **1968 (30.6.68 வரைக்கும்)** | | |
| பர்மா .. .. .. .. | 36,481 | |
| சீனு .. .. .. .. | 107,159 | |
| தாய்லந்து .. .. .. .. | 64,386 | |
| கம்போடியா .. .. .. .. | 12,620 | |
| | 220,646 | 2,23,374,688 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

STATEMENT INDICATING THE QUANTITY AND THE COST OF RICE IMPORTED FROM EACH COUNTRY IN RESPECT OF EACH OF THE YEARS FROM 1957 TO DATE

*RICE*

| | Quantity long tons | Value C. & F. Rs. |
|---|---|---|
| *1957* | | |
| Burma (including quantity shipped against China/Ceylon contracts) | 311,664 | |
| China (excluding quantity shipped from Burma under China/Ceylon contract and including quantity shipped from Vietnam against China contract) | 200,896 | |
| Thailand | 43,772 | |
| Total | 556,332 | 255,390,561 |
| *1958* | | |
| Burma | 186,612 | |
| China | 286,490 | |
| Vietnam | 13,813 | |
| Egypt | 28,428 | |
| Naha | 9,756 | |
| Spain | 10,093 | |
| U. S. A. | 37,398 | |
| | 572,590 | 237,837,144 |
| *1959* | | |
| Burma | 217,288 | |
| China | 216,698 | |
| America | 56,324 | |
| Saigon | 17,279 | |
| Vietnam, North | 960 | |
| Karachi | 9,981 | |
| | 518,530 | 282,965,964 |
| *1960* | | |
| Burma | 226,044 | |
| China | 246,387 | |
| Vietnam | 41,729 | |
| America | 9,767 | |
| Thailand | 8,246 | |
| | 532,173 | 242,295,160 |
| *1961* | | |
| * Burma | 410,331 | |
| Vietnam | 16,054 | |
| Thailand | 61,319 | |
| China | 8,856 | |
| | 496,560 | 217,327,358 |

* Including quantity shipped from Burma under China contract.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*RICE*

| | Quantity long tons | Value C. & F. Rs. |
|---|---|---|
| *1962* | | |
| China | 89,750 | |
| Burma (including shipments under China contract) | 346,350 | |
| Egypt | 3,586 | |
| Pakistan | 19,994 | |
| Thailand | 45,366 | |
| Saigon | 9,929 | |
| | 514,975 | 248,239,016 |
| *1963* | | |
| Burma (including shipments under China contract) | 287,361 | |
| China | 189,047 | |
| Thailand | 36,134 | |
| Saigon | 20,502 | |
| Egypt | 17,658 | |
| | 550,702 | 244,143,690 |
| *1964* | | |
| Burma (including shipments under China contract) | 276,335 | |
| China | 225,468 | |
| Thailand | 38,605 | |
| Saigon | 6,397 | |
| | 546,805 | 262,625,304 |
| *1965* | | |
| China | 167,756 | |
| Burma | 243,239 | |
| Vietnam | 7,390 | |
| Thailand | 167,196 | |
| Malaya | 9,852 | |
| Pakistan | 36,510 | |
| Cambodia | 9,744 | |
| | 641,687 | 341,786,360 |
| *1966* | | |
| Burma | 188,160 | |
| China | 185,652 | |
| Thailand | 101,556 | |
| Cambodia | 9,208 | |
| | 484,576 | 261,261,588 |
| *1967* | | |
| Burma | 63,133 | |
| China | 212,203 | |
| Thailand | 99,410 | |
| | 374,746 | 239,939,439 |
| *1968 (up to 30.6.68)* | | |
| Burma | 36,481 | |
| China | 107,159 | |
| Thailand | 64,386 | |
| Cambodia | 12,620 | |
| | 220,646 | 223,374,688 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 1964 වර්ෂය

එක් එක් රටින් ගෙන්වන ලද පොහොර ප්‍රමාණය හා වියදම දක්වෙන ප්‍රකාශය

| | ඇමෝනියම් සල්ෆේට් ප්‍රමාණය දි/ටො. (දිගු ටොන් රා. 2240) | ඇමෝනියම් සල්ෆේට් රු. ශ. | රොක්ෆොස්ෆේට් ප්‍රමාණය දි/ටො. | රොක්ෆොස්ෆේට් රු. ශ. | පොටෑෂ් මියුරියේට් ප්‍රමාණය දි/ටො. | පොටෑෂ් මියුරියේට් රු. ශ. | යූරියා ප්‍රමාණය දි/ටො. | යූරියා රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය ... | 8,250 ... | 24,83,309 94 ... | — ... | — ... | — ... | — ... | — ... | — |
| නැගෙනහිර ජර්මනිය ... | 15,000 ... | 39,94,486 88 ... | — ... | — ... | 13,500 ... | 28,13,566 05 ... | — ... | — |
| බටහිර ජර්මනිය ... | 3,000 ... | 8,43,655 85 ... | — ... | — ... | — ... | — ... | — ... | — |
| ඉතාලිය ... | 6,600 ... | 24,33,619 73 ... | — ... | — ... | — ... | — ... | — ... | — |
| ජපානය ... | 5,000 ... | 16,31,503 50 ... | — ... | — ... | — ... | — ... | — ... | — |
| එක්සත් අරාබි ජනරජය ... | — ... | — ... | 9,700 ... | 11,58,698 65 ... | — ... | — ... | — ... | — |
| ජෝර්දනය ... | — ... | — ... | 5,213 ... | 5,71,683 95 ... | — ... | — ... | — ... | — |
| ඊශ්‍රායලය ... | — ... | — ... | — ... | — ... | 1,000 ... | 2,73,040 88 ... | — ... | — |
| ඕලන්දය ... | 5,250 ... | 15,60,367 69 ... | — ... | — ... | — ... | — ... | 350 ... | 1,53,846 74 |
| එකතුව ... | 43,100 | 1,29,46,943 59 | 14,913 | 17,30,382 60 | 14,500 | 30,86,606 93 | 350 | 1,53,846 74 |

| | ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් ප්‍රමාණය දි/ටො. | ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් රු. ශ. | ඇන්.පි.කේ. කොම්පවුන්ඩ් ප්‍රමාණය දි/ටො. | ඇන්.පි.කේ. කොම්පවුන්ඩ් රු. ශ. | විවිධ වර්ග ප්‍රමාණය දි/ටො. | විවිධ වර්ග රු. ශ. | එකතුව ප්‍රමාණය දි/ටො. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 8,250 ... | 24,83,309 94 |
| නැගෙනහිර ජර්මනිය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 28,500 ... | 68,08,052 93 |
| බටහිර ජර්මනිය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 3,000 ... | 8,43,655 85 |
| ඉතාලිය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 6,600 ... | 24,33,619 73 |
| ජපානය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 5,000 ... | 16,31,503 50 |
| එක්සත් අරාබි ජනරජය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 9,700 ... | 11,58,698 65 |
| ජෝර්දනය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 5,213 ... | 5,71,683 95 |
| ඊශ්‍රායලය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 1,000 ... | 2,73,040 88 |
| ඕලන්දය ... | — ... | — ... | — ... | — ... | — ... | — ... | 5,600 ... | 17,14,214 43 |
| එකතුව ... | | — | — | — | — | — | 72,863 | 1,79,17,779 86 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 1965 වර්ෂය

### එක් එක් රටින් ගෙන්වන ලද පොහොර ප්‍රමාණය හා වියදම දක්වෙන ප්‍රකාශය

| | ඇමෝනියම් සල්ෆේට් | | රොක්ෆොස්ෆේට් | | පොටෑෂ් මියුරියේට් | | යූරියා | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය දි/ටො. | රු. ශ. | ප්‍රමාණය දි/ටො. | රු. ශ. | ප්‍රමාණය දි/ටො. | රු. ශ. | ප්‍රමාණය දි/ටො. | රු. ශ. |
| එක්සත් රාජධානිය | 16,750 | 50,26,915 19 | — | — | 14,150 | 37,07,828 45 | — | — |
| නැගෙනහිර ජර්මනිය | — | — | — | — | 4,500 | 12,04,081 73 | — | — |
| බටහිර ජර්මනිය | 50 | 20,051 99 | — | — | — | — | — | — |
| ඉතාලිය | 2,000 | 5,77,863 11 | — | — | — | — | 1,250 | 6,72,480 41 |
